torate painted? (*d*) Is he aware that these direction-indicator boards appear to have been painted by a person who did not know any one of the languages and that they are therefore not at all clear? (*e*) Who was the departmental official who passed these boards as being satisfactory? (*f*) Will he send a responsible official from Colombo to photograph these boards, and will he examine the photographs so that he may realize fully what they look like? (*g*) Will he thereafter have these boards re-painted and recover the expenses from those persons responsible for painting and passing them?

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

(*a*) The Public Works Department. (*b*) The work is done departmentally. (*c*) By the Executive Engineer, Kandy, employing direct labour, (*d*) No. The lettering done in all three languages had been disfigured by mischief-makers. (*e*) The officer-in-charge, Direct Labour Unit and the Executive Engineer, Kandy. (*f*) Does not arise as the Superintending Engineer, Kandy, has inspected these direction boards and is satisfied that the lettering has been redone satisfactorily. (*g*) The boards have already been repainted and as the disfiguring had been done by mischief makers no officer could be held responsible.

විසර්ජන පනත් කෙටුම්පත, 1969-70

ஒதுக்கீட்டு மசோதா, 1969-70

APPROPRIATION BILL, 1969-70

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.

[කථානායකතුමා මූලාසනාරූඪ විය.]

முழுச் சபைக் குழுவில் ஆராயப் பெற்றது.

[சபாநாயகர் அவர்கள் தலைமை தாங்கினார்கள்]

Considered in Committee.

[MR. SPEAKER *in the Chair.*]

1 වන වගන්තිය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1 ஆம் வாசகம் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

Clause 1 ordered to stand part of the Bill.

2 වන වගන්තියේ සිට 7 වන වගන්තිය තෙක් උපලේඛන සලකා බැලීමෙන් පසු ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

அட்டவணை பரிசீலனை செய்யப்பட்டு முடியும் வரை 2-7 வரையுள்ள வாசகங்கள் ஒத்திவைக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 2 to 7 ordered to be postponed until after consideration of the Schedules.

පළමුවන උපලේඛනය

පොදු සේවා සඳහා ගෙවිය හැකි මුදල්

முதல் அட்டவணை

பொதுச் சேவைகளுக்குக் கொடுக்க வேண்டியதொகை

FIRST SCHEDULE

SUMS PAYABLE FOR GENERAL SERVICES

1 වන ශීර්ෂය.—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ

1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 2,89,434

1 ஆம் தலைப்பு.—மேன்மை தங்கிய மகா தேசாதிபதி

வாக்குப்பணம் இல. 1—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூபா 2,89,434

HEAD 1.— HIS EXCELLENCY THE GOVERNOR-GENERAL

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 289,434

පූ. භා. 10.15

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ගරු සභාපතිතුමනි, මෙම ශීර්ෂය යටතේ අප ඉදිරිපත් කර ඇති සංශෝධනය මෙසේයි:

"That the Vote be reduced by Rs. 10."

එම සංශෝධනය ලැබී තිබෙන්නේ ඉංග්‍රීසියෙන් පමණක් නිසයි, මා එය ඉංග්‍රීසියෙන්ම කියෙවිවේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Do you want a Sinhala copy ?

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

සිංහලෙන් ලබා ගන්නට තිබෙනවා නම් මා සංතෝෂ වෙනවා. මා සිතන්නේ නැහැ, සිංහලෙන් මුද්‍රණය කර තිබෙනවාය කියා.

අප හැමදෙනා එකතු වී අවුරුදු පතා කරන එක්තරා දේශපාලන කර්මයක් ඉටු කිරීම සඳහායි මා නැගී සිටියේ. පසුගිය අවුරුදු හතරක කාල සීමාව ඇතුළතදීත් ඒ වාගේම 1947 පටන් මේ දක්වා අවුරුදු 21 ක කාලසීමාවක් ඇතුළතදීත් මෙවැනි සංශෝධන ඉදිරිපත් කරමින් ඒ ඒ වැය ශීර්ෂ යටතේ අප මෙවැනි විවාදවලට සහභාගි වී තිබෙනවා. එහෙත් ගරු සභාපතිතුමනි, මෙවැනි වාද විවාද පැවැත්වීමෙන් ඇති වී තිබෙන යහපත කුමක්දැයි මා තමුන්නාන්සේගෙන් ප්‍රශ්න කරන්නට කැමතියි. අග්‍රාණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂය යටතේ වෙන් කර තිබෙන මුදල් රුපියල් 10 කින් අඩු කළ යුතුය කියායි අපි මේ යෝජනා කර තිබෙන්නෙ. අපි මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කර තිබෙන්නේ ඒ අග්‍රාණ්ඩුකාර පදවිය පිළිබඳව—සම්පූර්ණ විෂයය පිළිබඳව—යම්කිසි විවේචනාත්මක විවාදයකට සහභාගි වීමට අවසථාවක් සලසා ගැනීමට අවශ්‍ය නිසයි. මෙය පළමුවැනි වරට කරන ලද දෙයක් නොවෙයි. මේ අග්‍රාණ්ඩුකාර ධුරය ඇති කළාට පසුව, නැත්නම් 1947 ට පසුව, පළමුවැනි වරට කරන ලද දෙයක් නොවෙයි, මේ. පසුගිය අවුරුදු 21 නිස්සේ 21 වරක්ම මේ විධියේ රුපියල් 10 ක් අඩු කිරීමේ අතුරු යෝජනාවක් ඉදිරිපත් කර මේ විධියේම විවාද පැවැත්වුණා. නමුත් එක් වරක්වත් එම යෝජනාව සම්මත වුණේ නැහැ. හැම ආණ්ඩුවක් විසින්ම මේ අතුරු යෝජනාව ප්‍රතික්ෂේප කර වැය ශීර්ෂය සම්මත කර ගන්නවා. පසුගිය අවුරුදු 21 දී සිදු වුණා වාගේම මේ වර්ෂයේදීත් මේ රුපියල් 10 අඩු කිරීමේ සංශෝධන යෝජනාව පරාජයට පත් වී වැය ශීර්ෂය සම්මත වෙනවා ඇති.

ගරු සභාපතිතුමනි, මේ අවසථාවේදී මා අසන ප්‍රශ්නය මෙයයි. හැමදාම එකම තැනක කරකැවෙන සෙක්කුවක් වගේ මේ පාර්ලිමේන්තු විවාදවලින් ඇත්ත වශයෙන් මේ දේශපාලන වශයෙන් යම්කිසි යහපතක් සිදු වී තිබෙනවාද ? මේ පාර්ලිමේන්තු ක්‍රමය යටතේ මහජන මුදල් වියදම් කිරීම සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගන්නට වුවමනා නිසා, මහජන මුදල් වැය කිරීම පිළිබඳ සම්පූර්ණ පාලනය මහජන මන්ත්‍රී මණ්ඩලයට පැවරී තිබෙන නිසා, මේ වගේ විවාද පැවැත්වෙනවා. එය පාර්ලිමේන්තු සම්ප්‍රදායයි. මේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව ඒ ඒ දෙපාර්තමේන්තුවල, ඒ ඒ කායර්‍යාංශවල, ඒ ඒ ආයතනවල, ඒ ඒ සංස්ථාවල සිදු වෙන අඩු ලුහුඬුකම් පෙන්වා දීමට මේ අවස්ථාව උපයෝගි කර ගත්තත් එයින් යම්කිසි යහපතක් සිදු වී තිබෙනවාද යන්න ගැන සිතා බලන්න ඕනෑ. මේ විධියට අවුරුදු 21 ක් තිස්සේම සිදු වුණා. මේ ගරු මන්ත්‍රීවරුන් වාඩි වී සිටින පැත්තෙනස් වී තිබෙන බව ඇත්තයි. මේ පැත්තේ අද සිටින මන්ත්‍රීවරුන් ලබන අවුරුද්දේදී අනික් පැත්තට යනවා. අද ආණ්ඩු පක්ෂයේ වාඩි වී සිටින මැති ඇමතිවරුන් ලබන අවුරුද්දේදී මේ පැත්තට එනවා. ඔය විධියට පැත්ත මාරු වෙමින් මේ විධියට විවාද පැවැත්වූවා. නමුත් මේ ආයතනවල මේ සංස්ථාවල පොල් කෙන්දක් තරමින් වත් යම්කිසි වෙනසක් සිදු වී තිබෙනවාද ? අග්‍රාණ්ඩුකාර ධුරය එදා තිබුණා වගේමයි අදත් තිබෙන්නෙ. ඒ ආයතනය ඇතුළේ මොනවා වෙන වාද යන්න මෙන්න මේ වගේ ඉඳ හිට පැවැත්වෙන විවාදයකදී හෙළිදරව් වෙනවා. මේ ධුරයට පළමුවෙන්ම පත් වූයේ මේ ආණ්ඩුක්‍රමය අපට භාර දී ගිය එංගලන්ත ආණ්ඩුව විසින් මේ රටට ගොඩබස්වන ලද සෝල්බරි සාම් උන්නැහේයි. මේ අග්‍රාණ්ඩුකාර පදවිය ඇති කිරීමත් සෝල්බරි සාමිට යම්කිසි පදවියක් හදා ගැනීම වැනි දෙයකුයි. මේ ධුරය ඇති කිරීමෙන් බලා පොරොත්තු වූයේ එයයි. මේ විධියට සිදු වුණ තවත් බොහෝ දේවල් තිබෙනවා. යම් යම් අංශවලට විශේෂඥයින් එනවා. ඊළඟට කොමිෂන් සභාවක් පත් කරනවා. ඒ කොමිෂන් සභාවට සභාපතිවරයෙක් පත් කරනවා. ඊළඟට ඒ කොමිෂන් සභාව තැන් තැන් වලට ගොස් සාක්ෂි විභාග කර වාර්තාවක් නිකුත් කරනවා. ඒ නිකුත් කරන වාර්තාවෙන් නිර්දේශ කරන්නේ කොමිෂමේ සභාපතිවරයාට මේ රටේ ඉන්න යම්කිසි පදවියක් සකස් කිරීමයි. ඒ නිසා මෙය සෝල්බරි සාමිට පමණක් සීමා වුණ දෙයක් නොවෙයි. ඔය වගේ මේ රටේ මහ බැංකුවක් පිහිටුවන්නය කියා, මට මතක හැටියට, එංගලන්තයේ හෝ අමෙරිකාවේ එක්ස්ටර් නමැති පුද්ගලයෙක් මේ රටට ඇවිත් යෝජනාවක් ඉදිරිපත් කළා. අන්තිමට එහි ප්‍රධානියා වූයේ ඒ කොමිෂමේ සභාපතිවරයා වූ ඔහුයි.

ගරු සභාපතිතුමනි, ඔය විධියටම අපේ රටේ ඒ කාලයේ තිබුණ ආණ්ඩු ක්‍රම පනත සංශෝධනය කරන්න ඕනෑය, මේ රටට නිදහස දෙන්න ඕනෑය කියා යෝජනාවක්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ඉදිරිපත් කර ඒ සඳහා කොමිෂන් එකක් පත් කළා. ඒ කොමිෂන් සභාව තැන් තැන් වල ඇවිද සාක්ෂි විභාග කර වාර්තාවක් සකස් කළා. මේ රටට නිදහස දුන්නා. නමුත් එදා තිබුණ ආණ්ඩුක්‍රම පනත යටතේ සිටි ආණ්ඩුකාරයා වෙනුවට අග්‍රාණ්ඩුකාරවරයෙක් කියා කෙනෙක් පත් කළා. කවුද අග්‍රාණ්ඩුකාරතුමා වුණේ? අර කොමිසමේ තැනින් තැන ගොස් සාක්ෂි විභාග කළ සෝල්බරි සාමිවරයායි. ඒ අනුව බලන විට එය සෝල්බරි සාමිවරයාට අග්‍රාණ්ඩුකාරකමක් දීම සඳහා පත් කරන ලද කොමිසමක්; එසේ නැතුව එය මේ ලංකාවට නිදහස දෙන්නට පත් කළ කොමිසමක් නොවෙයි.

මේ රටේ ඒ දවස්වල සිටි නායකයනුත් එකතු වී සෝල්බරි සාමිවරයාට අලුත් පදවියක් දීමට උපකාර වී තිබෙනවා. සමහර විට ඒ සෝලබරි සාමිවරයාට—ඒ මහළු මනුෂ්‍යයාට—තමන්ගේ ජීවිත කාලයේ අවසාන පරිච්ඡේදයේදී හොඳ කාලගුණයක් තිබෙන ප්‍රදේශයක, හොඳ පඩියක් ලබමින් විනෝද සහගත ජීවිතයක් ගත කිරීම පිණිස රක්ෂාවක් ලබා දීමෙන් එවකට මේ රටේ සිටි දේශපාලන නායකයන් එතුමාට කළ ඒ උදව්වට කෘතෝපකාර සැලකීමක් වශයෙන්, කළ ගුණ සැලකීමක් වශයෙන්, උන්නැහේ ඒ තනතුරෙන් ඉවත්ව යන්නට කලින් ඒ නායකයන්ගේ දරුවන්ට කළගුණ සලකා ගිය බව ඔබතුමා දන්නවා ඇති. පළමුවෙනි අග්‍රාණ්ඩුකාරතුමා යටතේ මේ රටේ සිටි පළමුවෙනි අග්‍ර ඇමතිවරයා තමන්ගෙන් පසු අගමැති පදවිය පවරා ගිය හැටි කොහොමද?

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
මොනවා?

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ගරු අගමැතීතුමා ටිකක් කලබල වුණා වාගෙයි. හිටපු පළමුවෙනි අග්‍රාණ්ඩුකාරතුමා—සෝල්බරි සාමිවරයා—මේ රටේ පළමුවෙනි අග්‍රාණ්ඩුකාරකම තමන්ට පැවරීම ගැන කළගුණ සැලකීමක් හැටියට ඒ කාලයේ සිටි පළමුවෙනි අගමැතිතුමාටත් කළගුණ සලකලයි උන්නැහේ පදවියෙන් බැහැරව ගියේ. ඒ කාලයේ සිටි ගරු අගමැතිතුමා අග්‍රාණ්ඩුකාරතුමාට ලංකාවේ රක්ෂාවක් සොයා දුන්නා. අග්‍රාණ්ඩුකාරතුමත් ඒකට කළගුණ සැලකීමක් වශයෙන් ඒ අගමැතිතුමාගෙන් පස්සෙ අග්‍රාමාත්‍යකම——

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

What is the relevancy of all these remarks? The hon. Member is starting by being irrelevant. He starts with the history of the Governor-General's post instead of discussing the "cut" he is moving. The "cut" is with regard to the present Governor-General.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්වරයාගේ වැය ශීර්ෂය ගැනයි මා කථා කරන්නෙ. ඒ ගැන කථා කරන විට අග්‍රාණ්ඩුකාර පදවියේ ඉතිහාසය ගැන කථා කිරීම ප්‍රශ්නයට අදාළ නොවෙයි කියා තමුන්නාන්සේ හිතනවා නම් මට ඒ අදහසට එකඟ වෙන්න අමාරුයි. අග්‍රාණ්ඩුකාර පදවියේ ලේකම්වරයාගේ වැය ශීර්ෂය ගැන කථා කරන විට අග්‍රාණ්ඩුකාර පදවිය ගැන කථා කිරීම අදාළ නොවන්නේ කොහොමද කියන එක මට නම් තේරුම් ගන්න අමාරුයි.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

I have stated the position. I do not want to give a Ruling. I would like the hon. Member to co-operate with me because there is a time fixed for the consideration of these Votes, and I shall insist on the hon. Member not going beyond that time. If he speaks on irrelevant matters he will merely be wasting time and he will not have enough time to speak on important matters.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

කාලය පිළිබඳ ප්‍රශ්නය දැන්මම මතු වෙන්න වුවමනාවක් නැහැ. කාලය නියම කරන්නට අනවශ්‍ය නිසා තමයි ඔබතුමා ගේත් සහයෝගය ඇතුව මෙම වාරයේදී අය වැය විවාදය සඳහා කාලය ඩිංගක් වැඩි පුර ලබාගත්තෙ. අග්‍රාණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂය යටතේ පළමුවෙනි අතුරු සංශෝධනය ගැන සඳහන් කරන අවස්ථා වේදී අග්‍රාණ්ඩුකාර පදවියේ ඉතිහාසය ගැන කීම වටින්නේ නැතැයි ඔබතුමා හිතනවා නම්—එම ඉතිහාසය ගැන මතක් කිරීමේදී අපේ වර්තමාන දේශපාලන නායකයන්ට රිදෙනවාය කියා ඔබතුමා ටත් පෙනී යනවා නම්——

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

That is rather unfair by the Speaker. I am not influenced by individuals. I am concerned with a principle. I say that the hon. Member is irrelevant and I would ask him to co-operate with me. The "cut" proposed by the hon. Member is with regard to the Secretary's salary, and I expect him to speak on that giving the reason why he is moving that "cut". I think Lord Soulbury left us many years ago.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

හරි සභාපතිතුමනි, ඒ පැරණි උදවියගේ හොල්මන් අදත් ඒ විධියටම පවතින බව කියන්නයි අතීතය ගැන සඳහන් කෙළේ.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

There is too much time spent on "holman".

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

මොනව කරන්නද සභාපතිතුමනි, මේ රටෙන් ඒ හොල්මන් එළවා දැමීම සඳහා පාර්ලිමේන්තුවට අවුරුද්දකට වරක් ලැබෙන මේ අවස්ථාවෙන් ප්‍රයෝජනයක් ගන්නේ නැත්නම් ඒ ආයතනයෙන් ඇති වැඩේ මොකක්ද? අතීතය ගැන සඳහන් කළ යුතුය කියන එකයි මගේ අදහස.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

What is the point in moving an amendment? The hon. Member must speak on the amendment. He is not speaking on the amendment but in general with regard to the history of the Governor-General's post.—[*Interruption.*] The hon. Member being a lawyer knows the difference between relevancy and irrelevancy.

පූ. භා. 10.30

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ගරු සභාපතිතුමනි, අග්‍රාණ්ඩුකාර පදවිය ගැන කථා කරන්නට පුළුවන් මේ වැය ශීර්ෂය යටතේ හැර වෙන කුමන වැය ශීර්ෂයක් යටතේ ද කියා කරුණා කර කියන්න.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ඒ සඳහා විශේෂ යෝජනාවක් ගෙනෙන්න.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

විශේෂ යෝජනාවක් අවශ්‍ය නැහැ. අග්‍රාණ්ඩුකාර පදවිය සම්බන්ධව මුදල් වෙන් කරන්නේ මේ වැය ශීර්ෂය යටතේ නිසා මේ වැය ශීර්ෂය යටතේ කථා කරන විට ඒ ගැන කියන්න පුළුවන්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු. ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ස්ථාවර නියෝග අනුව බැහැ.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
The hon. Member has spoken enough on that subject. Will he go on to the amendment he is moving?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
He is not even moving an amendment.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
මෙහි මගේ නම සඳහන් වී නැති බව ඇත්ත.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
There are a number of names given, and the name of the hon. Member for Habaraduwa is among them. We however only put down a few names for the sake of economy. I am allowing him to move the amendment but I would ask him to be relevant. I am not using my right although I have the right. When I point out to the hon. Member the irrelevancy of his remarks, he must accept it.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
ගරු සභාපතිතුමනි, ඔබතුමාට එවැනි අයිතියක් තිබෙන බව මා පිළිගන්නවා. එමෙන්ම මේ මන්ත්‍රී මණ්ඩලයේදී ප්‍රශ්නයකට අදාළව කථා කරන්න මන්ත්‍රීවරුන් හැටියට අපටත් අයිතියක් තිබෙනවා. මේ සංශෝධනය ඉදිරිපත් කිරීමේදී මගේ නම එයට ඇතුළත් වී නැති නිසා ඒ සම්බන්ධව කථා කරන්නට මට අයිතියක් නැතෙයි කියා ගරු රාජ්‍ය ඇමතිතුමා විරුද්ධත්වයක් දක්වනවා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
I did not say that.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
මේ විධියේ වැදගැම්මකට නැති තර්ක ඉදිරිපත් කර මන්ත්‍රීවරුන්ගේ කථාවලට හරස්කපා කථා සීමා කරන්නටයි හදන්නේ. මෙවැනි පැරණි නායකයින් මන්ත්‍රීවරුන් නිහඬ කිරීමට උත්සාහ කිරීම කණගාටුවට කරුණක්. මෙවැනි වැදගැම්මකට නැති විරුද්ධකම් නිසා අපේ කථා සීමා කරන්නට පුළුවන්ය කියා හිතන්න එපා, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

ගරු සභාපතිතුමනි, මේ වැය ශීර්ෂය හඳුන්වන නම පවා වැරදි අන්දමකිනුයි සටහන් වී තිබෙන්නේ. අග්‍රාණ්ඩුකාර පදවියේ ලේකම් වරයා කියලයි තිබෙන්නේ. තනි ආණ්ඩුවක් තිබෙන—ප්‍රදේශ ආණ්ඩු කිසිවක් නැති—ලංකාවේ අග්‍රාණ්ඩුකාරවරයෙක් ඉන්නේ කොහොමද? බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය යටතේ යම් යම් රටවල පවත්නා එක්තරා පදවියක නම අපිත් ඒ විධියටම ලංකාවට ගෙනැවිත් තිබෙනවා. අපිත් ඒ විධියටම පාවිච්චි කරනවා. මේ පදවියේ නමවත් මේ රටට ගැලපෙනවාද කියා කල්පනා කර බලන්න.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
That is another matter. That should have been raised at the Second Reading Debate. Now at the Committee stage you have got to talk on amendments. Your amendment is with regard to the salary of the Secretary. You need not go into the whole history of it. Now, if you are moving a "cut" in the salary of the Secretary, you must give your reasons as to why you are moving that.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

නැහැ සභාපතිතුමනි, මේ ලේකම් පදවිය කියන්නේ කාගේ ලේකම් පදවියක්ද? අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම් පදවියයි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

නැහැ.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

එහෙනම් කාගේද?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ගරු රාජ්‍ය ඇමතිතුමා හරියටම හරි. මා කථා කරන්නේත් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේගේ ලේකම් පදවිය ගැනයි. කවුද මේ අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ කියා අහන්නට අයිතියක් තිබෙනවා නේද?

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

What is the use of your wasting time by exchanging words? I have told you to speak with regard to the Secretary's salary, but not with regard to the Governor-General. You can write a book on history. I have no objection. But now you have to speak on the Secretary's salary.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ගරු සභාපතිතුමනි, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේගේ ලේකම් උතුමාණන් වහන්සේගේ පඩිය අඩු කරන්නැයි ඉල්ලන විට ඒ උතුමාණන් වහන්සේ ගැනත් සඳහන් කරන්නට සිදු වෙනවා. ගෝලයා ගැන සඳහන් කරන විට හාම්පුතා ගැනත් සඳහන් කරන්නට සිදු වෙනවා.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Well, I am ruling that you cannot. So, will you please accept that Ruling?

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

හොඳයි. ලේකම් උතුමාණන් වහන්සේගේ කටයුතු පාලනය කෙරෙන්නේ අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසිනුයි. මේ පදවි දෙකම නැති කර දැමිය යුතුයි. වෙන අහන්නට කෙනකු නැති නිසා මා ගරු අගමැතිතුමාගෙන් අසන්නේ මේ පදවි දෙක නැති කර දමන්නේ කවදාද කියායි. මේ අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේගේ පදවියත් ලේකම් උතුමාණන් වහන්සේගේ පදවියත් මේ රටේ තිබුණු කල් හොඳටම ඇති. මේ මා සඳහන් කරන්නේ දැනට මෙම පදවි දරන පුද්ගලයන් ගැන නොවෙයි. මේ පදවි ඇති කරන්නට පුළුවන් වී තිබෙන්නේ අද පවත්නා ආණ්ඩු ක්‍රමය යටතේයි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ඒ පදවි නැති කර නිකම් ඉන්නවාද?

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ජනාධිපති කෙනකු පත් කර ගන්නට පුළුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ඒකට තමුන්නාන්සේලාගේ උදව් ලැබෙන්නට එපායැ? තුනෙන් දෙකක ඡන්දය ඕනෑ.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ඒකට මේ පැත්තේ උදව් ඕනෑ නැහැ. තුනෙන් දෙකක ඡන්දයෙන් ඒ කටයුත්ත කරන්නට බැරි බව මේ ගරු සභාවේ පැවති විවාදවලින් පෙනී තිබෙනවා. ආණ්ඩු ක්‍රම පනතට අදාළව, ඊට අනුකූලව තුනෙන් දෙකක ඡන්දයෙන්වත් ඒ වැඩේ කරන්නට බැහැ. මේ ගරු සභාවේ අවස්ථා හතරක් පහකදීම ඒ සම්බන්ධයෙන් විවාද ඇති වුණා. ඒක මහජනයා අතින් කෙළින්ම සිදු විය යුතු දෙයක්. රාජ්‍ය ඇමතිතුමා හැම වේලාවේම තුනෙන් දෙකක් ගැන සඳහන් කරනවා. තුනෙන් දෙකක් තබා තුනම එකතු වුණත් මෙම ගරු සභාවට ඒ වැඩේ කරන්නට බැහැ. වෙනත් රටවල් මෙවැනි ප්‍රශ්නවලට මුහුණ දුන් විට හිතුවක්කාර ලෙස නැත්නම් තනි කැමැත්තෙන්—unilateral—ඒ වැඩේ කරනවා. ඒක මහජනයා අත තිබෙන හිතුවක්කාර බලයක්. තමන් කැමති ආණ්ඩු ක්‍රමයක් සකස් කර ගැනීමට මහජනයාට බලයක් තිබෙනවා.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake))

රොඩේෂියාවේ වාගේද?

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

රොඩේෂියාවත් එවැනි වැඩක් කර තිබෙන බව ඇත්තයි. හැබැයි, හේතුව නම් වෙනස්. [බාධා කිරීමක්] මා රොඩේෂියාව ගැන සඳහන් කෙළේ අගමැතිතුමා ඒ ගැන මතක් කළ නිසයි. මම වහාම ලංකාවට එන්නම්. ලංකාවත් ඒ ක්‍රමය අනුගමනය කර ඔය පදවි දෙක නැති කර දමන ලෙසටයි, මා කියන්නේ. මේ පදවි නැති කිරීමට පාර්ලිමේන්තුවට බලයක් නැහැ. ඒක මහජනයාට තිබෙන අයිතියක්. මහජනයා විසින් තමන්ගේ බසින් සකස් කර ගනු ලබන ආණ්ඩු ක්‍රම පනතක් මගින් මේ අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේගේ පදවියත්, ලේකම් උතුමාණන් වහන්සේගේ පදවියත් අහෝසි කර දමන්නට ඕනෑ. සෙක්කුවට නැගී එක නැනම කෑකෙන්නා සේ අප අවුරුදු පහා මේ විධියට මේ කරන විවාදවලින් ප්‍රයෝජනයක් ඇති වන්නට නම් අඩු ගාණේ මහජනයාට මේ තත්ත්වය අවබෝධ කර දෙන්නට ඕනෑ. 1 සිට 12 දක්වා වැය ශීර්ෂයන් අද සාකච්ඡා කිරීමට නියමිතව තිබෙනවා. 6 වන ශීර්ෂය යටතේ එන නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ගැන—මේ පාර්ලිමේන්තු ක්‍රමයේ අවැඩදායකත්වය ගැන—විස්තර සහිතව කතා කරන්නට මා බලාපොරොත්තු වන නිසා එය මා මේ අවස්ථාවේදී සඳහන් කරන්නේ නැහැ. මා නඟන එකම ප්‍රශ්නය නම්, මේ පදවියත් මේ පදවියෙන් ඉඩකඩ සැලසී තිබෙන අනෙකුත් පදවිත් නැති කරන්නේ කවදාද යන්නයි.

"1 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 2,89,434 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභාසම්මත විය.

1 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"1 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் ரூபா 2,89,434 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

1 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப்பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 289,434 for Head 1, Vote No. 1 be inserted in the Schedule", put and agreed to.

Head 1, Vote 1, ordered to stand part of the Schedule.

2 වන සම්මතය—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 2,02,600

வாக்குப்பணம் இல. 2—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு, ரூபா 2,02,600

Vote No. 2.—Administration charges—Recurrent Expenditure, Rs. 202,600

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"1 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 2,02,600 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සහ සම්මත විය.

1 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"1 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 2,02,600 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

1 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 202,600 for Head 1, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.

Head 1, Vote 2, ordered to stand part of the Schedule.

3 වන සම්මතය—පාලන ගාස්තු—මූලධන වියදම, රු. 12,000

வாக்குப்பணம் இல. 3,—பரிபாலனச் செலவுகள்—ஆக்கப்பொருட் செலவு, ரூபா 12,000

Vote No. 3.—Administration Charges—Capital Expenditure, Rs. 12,000

"1 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය සඳහා රු. 12,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සහ සම්මත විය.

1 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"1 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் ரூபா 12,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

1 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 12,000 for Head 1, Vote No. 3, be inserted in the Schedule", put, and agreed to.

Head 1, Vote 3 ordered to stand part of the Schedule.

2 වන ශීර්ෂය :—අග්‍රාමාත්‍ය

1 වන සම්මතය :—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 2,86,231

2 ஆம் தலைப்பு—பிரதம அமைச்சர்

வாக்குப்பணம் இல. 1—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூபா 2,86,231

HEAD 2.—PRIME MINISTER

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 286,231

ආචාර්ය එන්. එම්. පෙරේරා (යටියන්තොට)

(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)

(Dr. N. M. Perera—Yatiyantota)

I move,

"That the Vote be reduced by Rs. 10."

I have just two matters to raise. The first, is a matter on which the Prime Minister owes a statement to this House. I refer to the Ceylon-China Maritime Pact. The Hon. Prime Minister will recall that earlier the Opposition drew attention to a reference made by him during the previous election campaign to a so-called maritime pact we are supposed to have had with China. That pact is supposed to be derogatory of the independence of this country, infringing the sovereignty of this country—A very serious situation, if it is true.

Later in this House the attention of the Prime Minister was drawn to that. The Hon. Prime Minister said that he is studying the question. He was also asked whether he would abrogate that pact immediately. He said, "No." In fairness to China, he said, he would like to study the question, and he would inform this House within six months of the decision—whether to abrogate it or not.

Six months have now become four and a half years and today we do not know what the position of the so-called maritime pact is. Has he abrogated the pact? Is the pact still in force? Is it in existence? Is it in abeyance? What is happenning? I think the Hon. Prime Minister should tell this House what the position is. In point of fact, I just sent for the HANSARD to draw the pointed attention of the Prime Minister, where the Hon. Prime Minister, in reply to a question raised by the hon. Member for Dompe, promised that within six months he would inform this House. I do think that when the Hon. Prime Minister makes a promise like that in this House, he must honour the promise. The Hon. Prime Minister cannot lightly make statements in this House on an important matter like that.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)
(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

Take it up on the External Affairs Vote.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

It is not a question of the rightness or wrongness. I am raising the question of the Prime Minister's duty to inform this House.

If the Prime Minister says that I should raise it on the External Affairs Vote, I have no objection. I will raise it then.

The next matter is a matter on which the Prime Minister owes an obligation not only to us but to all the females of this country. The Hon. Prime Minister made a serious charge about our women-undergraduates. We refused to believe that on that occasion. You remember the incident. I do not want to repeat it. Subsequently a commission or committee that sat exonerated the women-undergraduates. I do think in the light of that—the Hon. Prime Minister has been misinformed—in fairness to those women-undergraduates the Hon. Prime Minister must say that he was wrongly informed. I think that is a duty the Hon. Prime Minister owes both to this House and the country outside. A categorical statement was made by him referring to the conduct of the women undergraduates. We were all shocked by his statement. I myself refused to believe it although the Hon. Prime Minister said he was making that statement on authoritative information provided to him. I thought he was misled by wrong information provided to him. Now that the correct position is known, I do think the Hon. Prime Minister should inform this House about his position in the matter.

පූ. භා. 10.45

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ගරුසභාපතිතුමනි, ගරු කම්කරු ඇමති තුමාට විරුද්ධ විශ්වාස භංග යෝජනාවේදී මතු කරන ලද ප්‍රශ්නයක් ගැන මේ අවස්ථාවේදී ගරු අගමැතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. ඇමති මණ්ඩලයේ ඇමති කෙනකු හා ඇමති බිරිඳ පිළිබඳවත් රාජාධිකරණය පිළිබඳවත් සේරසිංහ නමැති කම්කරු නිළධාරියා විසින් ඉදිරිපත් කරන ලද බිය උපදවන චෝදනාවක් සහිත ලිපියක් මේ සභා ගර්භයේදී මා කියෙව්වා. එය සේරසිංහ මහත්මයා ගරු අගමැතිතුමාට යැවූ ලිපියක්. ඒ සම්බන්ධයෙන් ගන්නා ලද පියවර කුමක් දැයි ගරු අගමැතිතුමාගෙන් අසා යවන්නට මට සිදු වුණා. අගමැතිතුමා මට උත්තරයක් දුන්නා. කොළොන්නාවේ ඡන්ද පෙත්සම අවසාන වුණායින් පසු තමන් ඒ සම්බන්ධව ප්‍රකාශයක් කරන බව පොලීසිය විසින් ප්‍රශ්න කරනු ලැබූ අවස්ථාවේදී සේරසිංහ මහතා කියා ඇති බවත් දැන් නැවත ඒ සම්බන්ධ විභාගය මතු කරගෙන යන බවත් ගරු අගමැතිතුමා කියා තිබෙනවා. මෙය පොලීසියෙන් පමණක් කළ යුත්තක් නොවන බව ගරු අගමැතිතුමාට මතක් කරන්නට කැමැතියි.

මේ චෝදනා නිසා පැන නඟින ප්‍රශ්න කිපයක් තිබෙනවා. ඉන් එකක් නම්, අධිකරණය ලවා හරියාකාරව යුක්තිය ඉෂ්ට කර නොගැනීමට තුඩු දෙන විධියේ ක්‍රියා කලාපයක් කැබිණට් මණ්ඩලයේ ඇමති කෙනකු අනුගමනය කර තිබෙනවාය යන්නයි. එක් අතකින් එය කැබිණට් මණ්ඩලයේ ඇමතිවරයකුට කරන ලද චෝදනාවක්. නොයෙකුත් ආර්ථික පොරොන්දු දී, එතුමාගේ පෙළඹවීම උඩ ශ්‍රේෂ්ඨාධිකරණයට බොරු සාක්ෂියක් කියෙව්වාය යන්නයි එම චෝදනාව. අනෙක් කරුණ, අධිකරණයට බොරු සාක්ෂියක් ඉදිරිපත් කළායයි ප්‍රකාශ කිරීමයි. මෙවැනි තත්ත්වයක් තිබෙන නිසා, අධිකරණය සම්බන්ධ විභාගවලදී රජයේ මැති ඇමැතිවරුන් නිසි ආධාර උපකාර නොකිරීම ගැන කලකිරීමක් රටේ ඇති වන්නට පුළුවනි. ඒ වගේම, ඇමති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

කෙනකු මේ විධියේ මැතිවරණ පෙත්සම් පිළිබඳව උනන්දුවක් දක්වා තම බලතල පාවිච්චි කොට රජයේ නිළධාරියකු ලවා බොරු සාක්ෂි කියවීම බරපතල චෝදනාවක්. එක් අතකින් එය අල්ලස් චෝදනාවක් හැටියටත් ගණන් ගන්නට පුළුවනි; ඇමති කෙනකුගේ බලතල අයුතු විධියෙන් ප්‍රයෝජනයට ගැනීමක්යයි කියන්නටත් පුළුවනි. අනෙක් අතින්, අධිකරණය නොමඟ යැවීම පිළිබඳ චෝදනාවක් ඉදිරිපත් වීමටත් ඉඩ තිබෙනවා. එම නිසා මේ කරුණ පොලීසියට පමණක් හෝ නීති ධාරීන්ට පමණක් හෝ බාර දී නිශ්ශබ්ද වීමට ඉඩක් නැහැ. කුමන විධියේ ක්‍රියා පටිපාටියක් අනුගමනය කළ යුතුද යන්න ගැන අගමැතිතුමාට උපදෙස් දීමේ සමර්ථකමක් මට නැහැ. කෙසේ වෙතත් අධිකරණයත්, ගරු අගමැතිතුමාත්, කථානායක වශයෙන් ඔබතුමාත් මෑදහත් වී, මේ පිළිබඳව යම්කිසි ක්‍රියාමාර්ගයක් ගත යුතු බව අපට පෙනෙනවා. එම නිසා ඒ සම්බන්ධයෙන් කුමන පියවරක් ගැනීමට තමා යෝජනා කරන්නේද යන්න පිළිබඳව ගරු අගමැතිතුමාගෙන් ප්‍රකාශයක් අපි බලාපොරොත්තු වෙනවා.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ගරු සභාපතිතුමනි, පසුගිය වාරයේ අපි හදිසි නීතිය ගැන කථා කළේ ගරු අගමැතිතුමාගේ වැය ශීර්ෂයටතේ කියායි, මගේ මතකය. හදිසි නීතිය පැණවීමට හේතු වූ ජනවාරි 8 වැනිදා සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ කමිටුවකුත්, කොමිෂන් සභාවකුත් වාර්තා ඉදිරිපත් කර තිබෙන බව මා පත්‍ර මාර්ගයෙන් දැන ගත්තා. ගරු අගමැතිතුමා විසින් දෙන ලද උපදෙස් අනුව අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පත් කරන ලද ඒ කොමිෂන් සභාවේ වාර්තාව මේ දක්වා නිකුත් කර නැහැ. මට දැන ගන්නට ලැබුණු අන්දමට ඒ කොමිෂන් සභාව පත් කළේ එල්. ඩබ්ලිව්. ද සිල්වා මහත්මයාගේ නායකත්වයෙනුයි. ජනවාරි 8 වැනිදා සිද්ධිය පිළිබඳව, දඹරාවේ රත්නසාර හාමුදුරුවන් අම අමුවේ මරා දැමීම පිළිබඳව, පළමු වෙන් කාරක සභාවක් වාර්තාවක් නිකුත් කළා. ඒ කමිටු වාර්තාවෙන් සෑහීමකට පත් නොවුණු නිසාදෝ ඒ ඓතිහාසික මිනී මැරුම පිළිබඳවත් ඒ සංඝ ඝාතනයට හේතුවූ අනිකුත් කරුණු පිළිබඳවත් සොයා බලන්නට ඕනෑ කියා තවත් කොමිසමක් පත් කළ බව පුවත් පත් මගින් පමණයි, අපට දැන ගන්නට ලැබුණේ. ඒ කොමිෂන් සභාවේ වාර්තාව සමහර පත්‍රවල විටින් විට කඩින් කඩ පළ වුණා. එහෙත් ඒ වාර්තාව මේ දක්වා සභාගත කර නැහැ. ඒ වාර්තාවේ නිර්දේශ කර තිබෙන්නේ මොනවා ද කියා අපි දැන ගන්නට කැමතියි. ඒ වාර්තාවේ දොස් කියා තිබෙන්නේ කාටද කියාත් අපි දැන ගන්නට කැමතියි. ඒ වාර්තාවේ යම් යම් නිර්දේශයන් මත සමහර පොලීස් නිලධාරීන් සර්ව නිර්දෝෂී නිලධාරීන් බවට නිගමනය කර තිබුණු නිසා එතෙක් ඔවුන්ට නැඟී තිබුණු චෝදනාවලින් ඔවුන් නිදහස් කර යළිත් ඔවුන්ට රක්ෂාව දුන් බවත් පත්‍ර මාර්ගයෙන් අපට පසුගිය දා දැන ගන්නට ලැබුණා.

ඒ එක්කම දඹරාවේ රත්නසාර හාමුදුරුවන්ට වෙඩි තබා මැරීමේ සිද්ධිය පිළිබඳව, එදා යොදා තිබුණු පොලිස් පාලන කටයුතු ගැන වගකීම් පැහැර හැරියාය යන චෝදනාව පිට සමහර පොලීස් සුපිරින්ටැන්ඩන්ට්වරුන්ට දොස් පවරා තිබුණත් ඒ වාර්තාව නිකුත් කළායින් පසු ඔවුන් නිර්දෝෂී බවට පත් කර ඔවුන්ට යළිත් රක්ෂාව දීමේ යෝජනාවක් තිබුණු බව පමණයි, අපට පුවත් පත් මගින් දැන ගන්නට ලැබුණේ. ඒ පත්‍ර වාර්තාවල ඇත්ත, නැත්ත, සත්‍යාසත්‍යතාවය අපි දන්නෙ නැහැ. අපට ඒ තත්ත්වය දැන ගන්නට පුළුවන් එකම නීත්‍යානුකූල මාර්ගය ඒ කොමිෂන් සභා වාර්තාවයි. එහෙත් ඒ වාර්තාව අද වන තෙක් මහජනතාව අතරට පත් වුණේ නැහැ. මේ මන්ත්‍රී මණ්ඩලය හමුවට ඉදිරිපත් වුණේ නැහැ. ජනවාරි 8 වනදා වුණු ඒ කනගාටුදායක සිද්ධිය නිසා එදින සැන්දෑවේ ප්‍රකාශයට පත් කළ හදිසි නීතිය දවස් දාහක පමණ කාලයක් තිස්සේ ලංකාවේ බලපැවැත්වුණා. මෙතරම් දීර්ඝ කාලයක් තිස්සේ, ඒ කියන්නේ අවුරුදු තුනකටත් වැඩි කාලයක් තිස්සේ මේ රටේ හදිසි නීතිය බලපැවැත්වීමට තුඩු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දුන් ඒ සිද්ධිය පිළිබඳව අපක්ෂපාත පරීක්ෂණයක් පවත්වා කිසියම් නිගමනයකට බැස තිබෙනවා නම් ඒ පිළිබඳව දැන ගැනීමට මහජනතාවට අයිතියක් තිබෙනවා. මගේ මතකයේ හැටියට, දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) ඒ පිළිබඳව ප්‍රශ්න කළ අවස්ථාවේදී එය ගරු සභාවට ඉදිරිපත් කරන බවටත්, ඒ පිළිබඳව විවාදයක් කිරීමට අවස්ථාව සලසා දෙන බවටත් ගරු අගමැතිතුමා පොරොන්දුවක් දුන්නා. නමුත් අද වනතුරු විවාදයකට අවස්ථාවක් සලසා දී නැහැ. මේ කාරණය ගැන මා විශේෂයෙන්ම සඳහන් කරන්නේ 1966 ජනවාරි 8 වනදා සිද්ධිය මේ රටේ දේශපාලන හා ජාතික ඉතිහාසයේ ලෙහෙසියෙන් අමතක කර දමන්නට පුළුවන් සිද්ධියක් නොවන නිසයි.

ගරු සභාපතිතුමනි, ගිය සතිය අගදී, ලංකා විශ්ව විද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ මහාචාර්යතුමෙකු ලිපියක් ලියා තිබුණා, මෙයට අවුරුදු එකසිය විසි පහකට පමණ පෙර එවකට ලංකාවේ පාලනය ගෙන ගිය වගකිව යුතු ආණ්ඩුවක් මගින් කුඩාපොල හාමුදුරුවන් නමින් ප්‍රසිද්ධ එක්තරා බෞද්ධ භික්ෂූන්වහන්සේ නමක් වෙඩි තබා මැරීම ගැන. මෙයට අවුරුදු එකසිය විසි පහකට පමණ පෙර, අධිරාජ්‍යවාදී යුගයේදී, සිවුරු දරූ එකම හාමුදුරු නමකටයි වෙඩි තබා මරා දමා තිබෙන්නෙ. මෙයට අවුරුදු විසි එකකට පමණ පෙර ලංකාව ස්වාධීන රාජ්‍යයක් බවට පත් වුණා. අපට අද තිබෙන්නෙ, මහජනතාව විසින්ම පත් කර ගන්නා ලද ආණ්ඩුවක්. නමුත් ඒ කාලයේ, කුඩාපොල හාමුදුරුවන් මරා දැමූ යුගයේදී—එක්දහස් අටසිය හතලිස් ගණන්වල—තිබුණේ, මහජනතාව විසින් පත් කර ගන්නා ලද ආණ්ඩුවක් නොවෙයි; එංගලන්තයේ අධිරාජ්‍යවාදී පාලනය යටතේ—ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ කෙනෙකු විසින් පාලනය කරනු ලැබූ—ආණ්ඩුවක්. අද තිබෙන්නේ මහජන ඡන්දයෙන්, මහජනතාව විසින්ම පත් කර ගන්නා ලද අපේම සිංහල බෞද්ධ මහෝපාසකයකු අගාමාත්‍ය ධුරයෙන් උසස් ආණ්ඩුවක්. නමුත් මේ කාරණා දෙක අතර කිසියම් වෙනසක් තිබෙනවාද කියන ප්‍රශ්නය කෙරෙහි මහජනතාවගේ අවධානය යොමු කරවන්නට මා බලාපොරොත්තු වෙනවා. එදා සිවුරු පිටින් සිටියදී කුඩාපොල හිමියන් මරා දැමීම ගැන විභාග කිරීම පිණිස කොමිෂන් සභාවක් පත් කිරීමත් සමගම එදා සිටි ආණ්ඩුකාර උතුමාණන්වහන්සේට තම පදවියෙන් හෙමිහිට අයින් වන්න සිද්ධ වුණා. නමුත් මේ රටේ අගමැති තුමාගේ පාලනය යටතේ පවත්නා පොලීසිය මගින් මහදහවල් ගාලු පාර දිගේ එළවාගෙන ගොස් දඹරාවේ රතනසාර ස්වාමීන් වහන්සේ වෙඩි තබා මරා දැමීම පිළිබඳ කණගාටුදායක සිද්ධිය ගැන අපට කවදද තීරණයක් ලැබෙන්නෙ?

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
ඇබිත්තය!

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ජනවාරි 8 වනදා සිද්ධිය ගැන සඳහන් කරන විට සමහරු මට ඇබිත්තයායයි කියනවා. එපමණක් නොවෙයි, ජනවාරි 8 වනදා සිද්ධිය ගැන සඳහන් කළ අවසථාවලදී මේ ගරු මන්ත්‍රී මණ්ඩලයේදීම මෙයට වඩා බරපතළ චෝදනාවලට ලක් වන්නට සිදු වූ බව සමහර විට තමුන්නාන්සේටත් මතක ඇති. එදා ගරුතර මහා සංඝයාවහන්සේලා ඉතාමත් සාම කාමී ලීලාවෙන් පෙරහැරින් ගොස් ගරු අගමැතිතුමා බැහැ දැක කිසියම් පෙත්සමක් ඉදිරිපත් කරන්න ගිය අවසථාවේදී, ගරු අගමැතිතුමාගේ කාර්යාලය අසලදී පොලීසිය මගින් එම සාමකාමී පෙරහැර නතර කොට, එහි ගමන් කළ සංඝයා වහන්සේලාට කඳුළු ගෑස් දමා, වෙඩි තබා එම පෙරහැර සීසීකඩ විසුරුවා හැරියා පමණක් නොවෙයි, ගාලු පාරේ තැන් තැන්වල විසිරී තිබුණු පෙරහැරේ ගමන් ගත් ස්වාමීන්වහන්සේලාගේ සිවුරු රථවාහනවලට යටවෙමින් තිබුණු බව, මිනිසුන්ට පැගෙමින් දූවිලි කමින් තිබුණු බව, ගරු අගමැතිතුමාට දැන් අමතක වී ඇති. ඒ ඓතිහාසික මොහොතේ දී එතැනට ගිය මට පොලිස් නිලධාරීන් සපත්තුවලින් පාගමින්, පයින් එහා මෙහා කරමින් ගිනි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

බත් කරන්නට සූදානම් වූ සිවුරක් අහුලා ගෙනැවිත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට සිද්ධ වුණා.

පූ. භා. 11

බුදු රජාණන් වහන්සේගේ කාෂාය වණී චීවරය අන්‍ය ලබ්ධික පොලිස් නිලධාරීන්ට පාගන්නට ඉඩ නොදී මන්ත්‍රී මණ්ඩලයට ගෙනවුත් පෙන්වූවාය කියන ඒ සිද්ධිය නිසා මේ ආණ්ඩුවේ ඇමතිවරුනුත් මන්ත්‍රීවරුනුත් මට සිවුරු හොරාය කියන්නට පටන් ගත්තා. මා එදා කළේ හොරකමක්ය කියා මා සිතන්නේ නැහැ. මා එදා කළේ අසිතිකරුවකු නැති සිවුරක්—මේ අගමැතිතුමාගේ පාලනය යටතේ පවත්නා පොලීසිය විසින් වෙඩි තබා මරන්නට උත්සාහ කරන විට පණට තිබෙන ආදරය නිසා ඒ අවස්ථාවේදී සිවුර මහ පාරේ දමා පැන ගොස් බේරුණු සඟමින් වහන්සේ නමකගේ—සිවුරක් අහුලා ගෙනවුත් පෙන්වීම පමණයි. මා එදා අදත්තා දූනයක් කළේ නැහැ. නොදුන් දෙයක් නොවෙයි මා ඉදිරිපත් කළේ. අසිතිකරුවකු නැතිව මහ පාරේ තිබුණු සිවුරක්, අන්‍ය ලබ්ධික පොලිස් නිලධාරීන්ගේ සපත්තුවලට පැගෙමින් ගිනි බත් වන්නට තිබුණු සිවුරක් අහුලා ගෙනවුත් මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කිරීම හොරකමක් හැටියට හැඳින්වීම ගැන මා කණගාටු වෙනවා. බුද්ධාගම ආරක්ෂා කරන වාය කියන ඇමතිවරුන් සහ මන්ත්‍රීවරුන් බුද්ධාගම තබා පස් පවවත් නොදැන කරන චෝදනාවක් ඒක. අදත්තා දූනය කියන්නේ ඔවැනි දෙයකට නොවෙයි. ඔවැනි දෙයක් හොරකමක් හැටියට හඳුන්වන්නට පුළුවන්කමක් නැහැ. හොරකමක්ය කියන්නේ කුමක්ද යන්න සමහර විට මේ ගරු ඇමතිවරුන් දන්නවා ඇති. පෞද්ගලික වශයෙන් මට විඳින්නට ලැබුණු, අසන්නට ලැබුණු ඒ චෝදනා ගැන මගේ සිතේ වේදනාවක් නැහැ. අනුන්ට දෙස් පැවරීමෙන් තමන් කළ ඒ බරපතල පාපය වසා ගන්නට නොහැකි බව මා මතක් කරනවා.

මීට අවුරුදු 126 කට පෙර වූ ඒ කුඩා පොල ස්වාමීන් වහන්සේගේ සිද්ධියටත් වඩා බරපතල මේ 1966 ජනවාරි 8 වනදා සිද්ධිය නිසා මේ රටේ බරපතළ සාමාජික විපර්යාසයක් ඇති වන්නට ඕනෑ. කුඩා පොල ස්වාමීන් වහන්සේගේ සිද්ධියෙන් ඉතාම සුළු වෙනස්වීමක් ඇති වුණා පමණයි. අවුරුදු 126 කට පෙර වූ ඒ සාහසික වෙඩි තැබීම ගැන වගකිව යුතු ආණ්ඩුකාරතුමා තම පදවියත් අත්හැර ලන්තෑරුම් එළියෙන් රටින් පිට වී ගියා. නමුත් ඊට අවුරුදු 124 කට පසු කොළඹ ගාලු පාරේ ඇති වූ මේ කණගාටුදායක භයානක මිනී මැරුම ගැන වගකිවයුත්තන්ට සිදුවන්නේ ලන්තෑරුම් එළියෙන් තම පදවි අත්හැර සැඟවී යන්නට නොවෙයි. ඊට වඩා බරපතල අන්දමට ඔවුන්ට මේ කළ පාපය පඬිසන් දෙන්නට ඕනෑ. එදා තිබුණු දේශපාලන වාතාවරණය අනුව කුඩාපොල ස්වාමීන් වහන්සේගේ සිද්ධිය සම්බන්ධයෙන්—ඒ සාහසික සංඝ ඝාතනය සම්බන්ධයෙන්—තනි පුද්ගලයකු වරදකරවා කර ඔහු පදවියෙන් අස් කර දැම්මා. නමුත් අද තිබෙන්නේ එවැනි තනි පාලනයක් නොවෙයි, පොදු සාමූහික පාලනයක්. ගරු අගමැතිතුමා පමණක් නොවෙයි මේ ගැන වගකියන්නට ඕනෑ. ගරු අගමැතිතුමා සමග සාමූහික වගකීමකට බැඳී සිටින කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන් සියලු දෙනාම මේ ගැන වගකියන්නට ඕනෑ. [බාධා කිරීමක්] මේ දැන් මෙතැනට ඇවිත්, මා කථා කරන්නේ කුමක් ගැනද කියා දන්නේ නැතිව සිව්රු හැර ගිය යම් කෙනකු ගැන එතුමා කථා කරනවා. ඔවට පිළිතුරු දෙන්නට ගියොත් ජනවාරි 8 වැනිදා සිද්ධිය ගැන මා කරන කථාවෙන් මා ටිකක් ඈත් වී යනවා. කුණ්ඩසාලේ ගරු මන්ත්‍රීතුමාගේ (ආර්. පී. විජේසිරි මයා.) බාධා කිරීම නිසා ඒ පැත්තට ඇදී යන්නේ නැතිව කැබිනට් මණ්ඩලයේ පොදු සාමූහික වගකීම ගැන මම සඳහන් කරන්නම්.

ජනවාරි 8 වැනිදා සිදු වූ ඒ දඹරාවේ රතන සාර ස්වාමීන් වහන්සේ මරුමුවට පත් කිරීම ගැන—ඒ සාහසික සංඝ ඝාතනය ගැන—වගකිව යුත්තේ එක පුද්ගලයකු නොවන බවයි, මා කීවේ. පෞද්ගලිකව ගරු අගමැතිතුමාගේ හිත රිදවීමට මගේ අදහසක් නැහැ. කෙනකුගේ හිත තනිවම රිදවීමෙන් මේ වගේ ප්‍රශ්නවලදී වැදගැම්මක් නැහැ. එයින් ඇති වන එකම ප්‍රතිඵලය පුද්ගලයන් දෙදෙනකු අතරේ ද්වේශයක් පැනනැගීමයි. එහෙත් මෙය පෞද්ගලික ද්වේශය ඇති කිරීම සඳහා කරන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථාවක් නොවෙයි. මෙවැනි කරුණකදී ගරු අගමැතිතුමාගේ හිත පිදවීමෙන් මට වන යහපතක් නැහැ. දඹරාවේ රතනසාර ස්වාමීන් වහන්සේටවත්, උන්වහන්සේගේ ශ්‍රුතීන්ටවත් එයින් වන යහපතක් නැහැ. මේ රටේ වෙන කිසිවකුටවත් එයින් යහපතක් වන්නේ නැහැ. එහෙත් මේ ඉද්ධියට පසුබිම් වූ යම් යම් කරුණු තියෙනවා. ඒවා ගැන වඟකීම සම්පූර්ණයෙන්ම පැවරී තිබෙන්නේ ගරු අගමැතිතුමාට සහ එතුමා සමග සාමූහික වගකීමෙන් බැඳී වැඩ කරන කැබිනට් මණ්ඩලයේ අනික් සාමාජිකයන්ටයි.

ජනවාරි 8 වැනිදා ඉද්ධියට පසුබිම් වූ හේතූන් මොනවාද යන්නයි, මා මෙතැනදී නගන ප්‍රශ්නය. ජනවාරි 8 වැනිදා ඉද්ධිය පදනම් කරගෙන ප්‍රකාශයට පත් කරන ලද ඒ හදිසි නීතිය මෙතෙක් කල් ගෙන ගියේ මොන හේතුවක් නිසාද? ඒ හදිසි නීතිය පැන වීමට මූලිකව හේතු වුණේ මොන කාරණයක් ද? ගරු අගමැතිතුමා ඒ දවස්වල කථා කෙළේ ජාතික සමගිය ඇති කිරීම ගැනයි. ජාතික සමගිය ඇති කිරීමේ ඓතිහාසික කර්තව්‍යය තමන් පිට පැවරුනා නම් ඒ කර්තව්‍යය ඉටු කිරීමට තමන් බොහොම සන්තෝශයෙන්, ආඩම්බරයෙන් ඉදිරිපත් වන බව පළමු වැනි රාජාසන කථා විවාදයේදීම ගරු අගමැතිතුමා ප්‍රකාශ කළා. එදා පැවරුණු ඒ භාර ධුර කර්තව්‍යය ඉටු කිරීමේ පළමු වැනි පියවර ගත්තේ හාමුදුරුනමක් වෙඩි තබා මරා නොවේද කියා මා ප්‍රශ්න කරන්නට සතුටුයි. ගරු අගමැතිතුමනි, නරක විධියට පටන් ගත් කිසිම වැඩක් හරියන්නෙ නැහැ. පාපකාරී ක්‍රියාවකින් පටන් ගත්, ජාතික සමගිය ඇති කිරීමේ ගරු අගමැතිතුමාගේ ව්‍යාපාරය හරි ගියාය කියා ඒ දවස්වල උදන් ඇනුවත් අද ඒ සමගිය කෝ? එදා ඉදු වුණේ ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයේ මන්ත්‍රීවරුන් කීප දෙනකු ගරු අගමැතිතුමාට ආධාර කිරීම පමණක් නොවේද? ඒ ආධාර කිරීම නිසා පමණක් ජාතික සමගිය ඇති කළාය කියා වර්ණනාත්මකව උදන් අනමින් එදා කීවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව යටතේ —සභාග ආණ්ඩුව යටතේ—ජාතික සමගිය කාබාසිනියා වී ගොස් තිබුනාය, දෙමළ සිංහල මිනිසුන් කුළල් කා ගත්තාය, ඒ නිසා මේ රටේ ජාතික සමගියක් ගොඩනංවන්නට පුළුවන්කමක් තිබුනේ නැත කියායි. ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයත් තවත් දේශපාලන පක්ෂ කීපයකුත් එකතු කරගෙන ජාතික රජයක් ගොඩනැංවීමට පුළුවන්කම තිබුනේ මට පමණය—මගේ නායකත්වය යටතේ පමණය—කියා ගරු අගමැතිතුමා එදා උදන් ඇනුවා. ඒ නිසා ජාතික සමගියේ ආදි කර්තෘවරයා වශයෙන් අගමැතිතුමා එදා රට හමුවේ පෙනී සිටියා. ජාතික රජයක් ගොඩනගනවාය කියා—මා දන්නෙ නැහැ, එය ජාතික රජයක්ද කියා—1965 දී ගරු ඩඩ්ලි සේනානායක අගමැතිතුමාගේ නායකත්වයෙන් පිහිටුවන ලද ආණ්ඩුවේ මූලික ආධාර කරුවන් හැටියට ක්‍රියා කළ ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයේ මන්ත්‍රීවරුන් අද විරුද්ධ පාර්ශ්වයේ පසුපස ආසනවල වාඩි වී සිටිනවා. ගරු අගමැතිතුමා උදන් ඇනුවෙ, ජාතික නම ගැගත්තෙ, දෙමළ රාජ්‍ය පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් 14 දෙනා එතුමාට සහයෝගය දුන්නිසයි. ගරු අගමැතිතුමා ඒ මන්ත්‍රීවරුන් 14 දෙනාගේ සහයෝගය ලබා ගත්තේ කොහොමද? ඒ කාලයේදී ගරු අගමැතිතුමාගෙන් ප්‍රශ්න කළ හැම අවස්ථාවකදීම දුන් පිළිතුර කුමක්ද? රටේ ගරු අගමැතිතුමා වශයෙන් නොව, ඩඩ්ලි ෂෙල්ටන් සේනානායක හැටියට නම් ද්‍රවිඩ රාජ්‍ය පක්ෂය සමග එකතු වූ බව සැබෑවකැයි එතුමා පිළිතුරු වශයෙන් කියා සිටියා. ඩඩ්ලි ෂෙල්ටන් සේනානායක මහත්මයා, ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයේ නායක තැන්පත් එස්. ජේ. වී. වෙල්වනායගම් මහත්මයාත් අනෙකුත් මන්ත්‍රීවරුන් සමගත් යම්කිසි රහස් ගිවිසුමකට එළඹුනා නම් ඒ ගැන තොරතුරු පාර්ලිමේන්තු මන්ත්‍රී මණ්ඩලයට කියන්නට බැඳී නැතැයි කිව්වා. එහෙත්, ඩඩ්ලි ෂෙල්ටන් සේනානායක මහත්මයා ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයේ නායකයා සමග රහස් ගිවිසුමකට එළඹීමෙන් පසු තමයි ගරු අගමැති ඩඩ්ලි ෂෙල්ටන් සේනානායක මහත්මයා වුණේ. නිකම් ඩඩ්ලි ෂෙල්ටන් සේනානායක මහත්මයා ගරු අගමැති ඩඩ්ලි ෂෙල්ටන් සේනානායක මහත්මයා වීම සඳහා එළඹුනු ඒ රහස් ගිවිසුමේ අඩංගු කරුණු මොනවාදැයි අපි බලවත් ලෙස ඉල්ලා සිටියේ අන්න ඒ නිසයි. ඒවා එළිදරව් කරන්නැයි අප නිතර නිතර ඉල්ලා සිටියේ අන්න ඒ නිසයි. එහෙත්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

අද වනතුරු ඒ ගැන කිව්වෙ නැහැ. රහස් ගිවිසුමක් තිබුණු බව නොයෙක් අවස්ථාවල පිළිගත්තා; පිළිගන්නට සිද්ධ වුණා. රහස් ගිවිසුමේ තිබුණු ඒවායින් සමහරක් ඉටු කළාය කියලත් කිව්වා.

රහස් ගිවිසුමේ තිබුණු කොන්දේසිවලින් ඉටු කරන ලද්දේ මොනවාද? ඒ කරුණු වලට ඇතුළත් කොන්දේසි මාලාවේ පළමුවැනි අංකය දරණ කොන්දේසිය ඉටු කරන්නට, ක්‍රියාත්මක කරන්නට ගිහිල්ලා තමයි ජනවාරි 8 වැනිදා දඹරාවේ රතනසාර ස්වාමීන් වහන්සේ ප්‍රමුඛ අනෙකුත් සංඝයා වහන්සේලාට වෙඩි තබන ලෙස නියම කරන්නට ගරු අගමැතිතුමාට සිද්ධ වුණේ. ජනවාරි 8 වැනිදා සිද්ධිය ගැන යම්කිසි කොමිෂන් සභා වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා නම් කරුණාකර එය එළිදරව් කරන්න. ගරු අගමැතිතුමා පසුගිය අවුරුදු හතරහමාර මුළුල්ලේ මේ ආණ්ඩුව ගෙන ගියේ මේ රහස් ගිවිසුම පදනම් කරගෙනයි. ආණ්ඩුව පටන් ගෙන මාස 8 ක් ඇතුළත රහස් ගිවිසුමේ පළමුවැනි කොන්දේසිය ක්‍රියාත්මක කරන්නට ගිහිල්ලා තමයි, අවුරුදු 126 කට පෙර අධිරාජ්‍යවාදී ආණ්ඩුකාරයෙක් හිමි නමකට වෙඩි තබන්නට නියම කළා වාගේ, නිදහස් ලංකාවේ අගමැතිවරයෙකුටත් ජනවාරි 8 වැනිදා හාමුදුරුනමකට වෙඩි තබන්නට නියම කරන්නට සිද්ධ වුණේ. සංඝඝාතනයක් කර හෝ, හාමුදුරුනමක් මරා හෝ, සිවුරු පුළුස්සා හෝ මේ ජාතික සම්පත්තිය ගෙන යන්නට ඕනෑය කියන එක නොවෙයිද එදා ගරු අගමැතිතුමාගේ යටිහිතේ අදහස හැටියට තිබුණේ? දෙමළ රාජ්‍ය පක්ෂයේ සහයෝගය ඇතිව මේ රටේ රාජ්‍ය නායකයා හැටියට පත් වූ ගරු අගමැතිතුමා එම සහයෝගය ලබා ගැනීමට ඉඩකඩ ඇති කර ගැනීම සඳහා එළඹුණු රහස් ගිවිසුමේ කොන්දේසියක් ක්‍රියාත්මක කරන්නට ගොස් ඒ සංඝඝාතනය සිදු වුණා නම් ඒ සම්බන්ධයෙන් ගරු අගමැතිතුමා මුළු ජාතිය වෙනුවෙන් වගකියන්නට ඕනෑ නොවෙයිද?

පූ. භා. 11.15

ගරු සභාපතිතුමනි, ජනවාරි 8 වැනිදා ඇති වූ සිද්ධිය ඉතිහාසගත වියයුතු සිද්ධියක් බව පිළිගත යුතුව තිබෙනවා. එය ලෙහෙසියෙන් අමතක නොකළහැකි සිද්ධියක් හැටියට පිළිගත යුතුව තිබෙනවා. ඒ ආකාරයට කියන්නේ මා මුලින් සඳහන් කළ පසුබිම නිසා බව කියන්නට ඕනෑ. තවත් මාස අටකට වැඩි කාලයක් බලයේ සිටින්නට මේ ආණ්ඩුවට නීත්‍යානුකූලව ඉඩක් නැහැ. ලබන අප්‍රේල් මාසය වන විට ජාතික සමගියේ පදනම මත ගොඩනංවන ලදැයි කියන මේ ආණ්ඩුවේ අවසාන යුගය එළඹෙනවා. එදාට මහජනයා විසින් විසඳනු ලැබියයුතු ප්‍රශ්නයක් තිබෙනවා. මේ ආණ්ඩුව බලයට පත් වී අවුරුදු පහක් රටේ පාලනය ගෙන ගියේ මොන පදනමක් උඩද යන්නයි, ඒ ප්‍රශ්නය. මෙයාගේ සහයෝගය ඇතිව පිහිටුවා ගන්නා ලද ආණ්ඩුවක්ද, කවර කොන්දේසි ඉටු කිරීමේ ප්‍රතිඥා පිට පිහිටුවා ගන්නා ලද ආණ්ඩුවක්ද, ඇති කර ගන්නා ලද ගිවිසුමේ කොන්දේසි කවර ආකාරයකින් මේ දක්වා ඉටු වී තිබෙනවාද යනා දී ප්‍රශ්න වලට පිළිතුරු වුවමනා කරනවා. ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයත්, ඩඩ්ලි ෂෙල්ටන් සේනානායක මහතාත් එළඹී ඒ රහස් ගිවිසුම් ගත වූ පස් අවුරුදු කාලය තුළදී කොයි ආකාරයකින් ක්‍රියාවට නගා තිබෙනවාද යන්නත් සලකා බැලිය යුතු වෙනවා. එකක් නම් පැහැදිලිවම අප දන්නවා. "මා දුන් පළමුවැනි කොන්දේසිය දෙමළ භාෂා පනත යටතේ රෙගුලාසි පැනවීම" යයි පසුගිය විවාදයකදී අගමැතිතුමා කීවා. ඒ කොන්දේසිය ඉටු කරන්නට ගිහින් තමයි, 1966 ජනවාරි 8 වැනි දා අර අවාසනාවන්ත, කණගාටුදායක සිද්ධිය ඇති වුණේ. ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයට දුන් එක පොරොන්දුවක් ඉටු කරන්නට ගිහින් හාමුදුරු නමක් වෙඩි තබා මරා දැමුවා.

ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයට දුන් තවත් පොරොන්දුවක් තමයි, රට සභා පනත නීතිගත කිරීම. වර්තමාන රජය ඒ පනත නීතිගත කරන්නට නොයෙක් ආකාරයෙන් උත්සාහ කළා. එසේ උත්සාහ කළේ වරක් දෙවරක් නොවෙයි. රටසභා පනත පිළිබඳව සඳහන් කළ හැම අවස්ථාවකදීම ම අගමැතිතුමාට කීවා, "අගමැතිතුමනි, ජනවාරි 8 වැනි දා වාගේ ක්‍රියා කිරීමෙන් යළිත් වරක් බේරී පැන යන්නට පුළුවන්, යයි හිතන්නට එපා; පොලීසිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හා ත්‍රිවිධ හමුදා යොදා, හාමුදුරුවන් පෙරටු කොටගත් සාමකාමී පෙරහැරක් කඩාකප්පල් කරමින් හාමුදුරු නමක් වෙඩි තබා මරා දමා ඒ උද්ඝෝෂණය නිහඬ කර දමන්නට තමුන්නාන්සේට පුළුවන්කම තිබුණත්, මුළු ජාතියම නැති කරන රටසභා පනත වැනි පනතක් නීතිගත කරන්නට තැත් කළොත් නම් එක හාමුදුරු නමක් මරා දමා නිදහස් වී පැන යන්නට තමුන්නාන්සේට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ" කියා. මේ රටේ—සමහර විට සිංහල ජාතියේ—භාග්‍යයකටදෝ, රටසභා පනත කෙරෙහි විරුද්ධ පාර්ශ්වය දැක්වූ දැඩි විරෝධයේ ප්‍රතිඵලයක් වශයෙන් අගමැතිතුමා එය නීතිගත කිරීමේ බලාපොරොත්තුව අත්හැරියා. එය, ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයට දුන් පොරොන්දුවක් ඉටු නොකිරීමක්, නැත්නම් කඩකිරීමක්. එහෙත් ඒ හේතුව මත, වර්තමාන රජයට ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයෙන් එතෙක් ලැබුණු සහයෝගය තව දුරටත් නොලැබී යන තත්ත්වයක් ඇති වුණේ නැහැ.

වර්තමාන රජය පිහිටුවන්නට ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයත්, ඩඩ්ලි ෂෙල්ටන් සේනානායක මහතාත් රහස් ගිවිසුමකට එළඹී සිටියා නම්, ඒ කොන්දේසි කොයි තරම් දුරට ක්‍රියාත්මක වී තිබෙනවාදැයි එතුමා අපට පැහැදිලි කර දෙන්න ඕනෑ. එක කොන්දේසියක් ඉටු කරන්නට ගිහින් හාමුදුරු නමක් වෙඩි තබා මරා දැමුවා. තවත් කොන්දේසියක් ඉටු කරන්නට බොහොම උත්සාහ කළත්, විරුද්ධ පාර්ශ්වයේ දැඩි විරෝධය නිසා එය ඉටු කරන්නට පුළුවන්කමක් නැති වුණා. එහෙත් ඒ හේතුකොටගෙන, පොරොන්දු කඩ කළා යයි ද්‍රවිඩ රාජ්‍ය පක්ෂය රජයෙන් ඉවත් වුණේ නැහැ. ඔව්, ජාතික රජයත් ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයත් අතර තිබුණු රහස් සබඳකම් බිඳ දැමීමට ඒ සිද්ධිය තුඩු දුන්නේ නැහැ. සමහර විට රහසිගතවම ඒ කොන්දේසිය ක්‍රියාත්මක කළා වන්නට පුළුවනි. ඉන් පසුව ඇති වුණු පොඩි අමනාපයක්, මත භේදයක් උඩයි ද්‍රවිඩ රාජ්‍ය පක්ෂය විරුද්ධ පාර්ශ්වයට ආවේ. එයත් අර හොර ගිවිසුම වාගේම හොර නැත්නම් බොරු වෙන්වීමකුයි සමහරුන් කියනවා. ඒ ගැන කියන්න මා දන්නේ නැහැ. එහි ඇත්ත නැත්ත විසඳිය යුත්තේ මහජනතාවමයි. මෙසේ හොර ගිවිසුම් මඟින් රජයක් පිහිටුවා එය ජාතික සම්මතය ගොඩ නැඟීමක් ලෙස හඳුන්වනවා නම්, එය රට මුළා කිරීමක් බවයි මගේ අදහස. ජාති නාශක, සංඝ ඝාතක, අසාධාරණ පසුබිමක් මත ගොඩ නංවන මේවැනි ඊනියා ජාතික සම්මතියකින් ඇති වැඩක් නැහැ. ජාතික සම්මතියක මුවාවෙන් හොර ගිවිසුම් මඟින් රජයක් පිහිටුවා ගන්නට පෙළඹෙන තරම් තත්ත්වයක සිටින ජනනායකයන් යළිත් වරක් බලයට පත් නොකරන්නට මහජනතාව අධිෂ්ඨාන කර ගන්නවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

ඉරත්තිනම් මයා.
(திரு. இரத்தினம்)
(Mr. Ratnam)

மாண்புமிகு அவைத் தலைவர் அவர்களே, எனக்கு முன்புபேசிய ஹபரதுவத் தொகுதிப் பாராளுமன்ற உறுப்பினர் (திரு. பிறின்ஸ் குணசேக்கர), கௌரவ டட்லி சேனநாயக்க அவர்களுக்கும் தமிழ் அரசுக் கட்சிக்கும் இடையிலுள்ள ஒப்பந்தத்தைப் பற்றியும் குறிப்பிட்டார். இப்பொழுது அவர் குறிப்பிட்ட அந்த ஒப்பந்தம் இரகசிய ஒப்பந்தமாக இல்லை. எங்களுக்கோ ஏனைய கட்சிகளுக்கு இடையிலோ எந்த விதமான இரகசிய ஒப்பந்தமும் தேவையில்லை. ஒரு ஒப்பந்தம் இரண்டு கட்சிகளுக்கு இடையில் செய்யப்பட்டால் அது நாட்டின் நலனுக்கு ஏற்றமுறையில் செயற்பட வேண்டும். அப்படி ஒப்பந்தம் செய்யும் கட்சிகள் எந்த இனத்திற்காகப் பேச உரிமைபெற்று இருக்கின்றனவோ அந்த இனத்தின் உரிமையைப் பெறுகின்ற அடிப்படையிலேதான் ஒப்பந்தங்கள் உண்டாகலாம். ஒரு கட்சியின் தலைவரும் இன்னொரு கட்சியின் தலைவரும் தங்களிடையே பேசிக் கருத்துக்களைப் பரிமாறி—

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Order, please! I cannot hear the interpretation.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉරත්නම් මයා.
(திரு. இரத்தினம்)
(Mr. Ratnam)

—சில குறைகளை நீக்குவதற்காக சில ஒழுங்குகள் செய்தார்கள் என்பது இப் பொழுது இரகசியமாக இருக்கவில்லை. இந்தச் சபையிலே தமிழ்மொழிப் பிரமாணங்களைக் கொண்டுவந்தபொழுது, "தமிழ் மொழிக்குக் கொடுக்கப்பட வேண்டிய உரிமைகளைக் கொடுப்பதற்காகத்தான் இந்தப் பிரமாணங்களைக் கொண்டு வந்திருக்கிறோம். தமிழ் அரசுக் கட்சியினர் தமிழ் இனத்தின் குறைகளைத் தீர்க்கச் சொல்லிக் கேட்டபடியால்தான் இதைச் செய்கிறோம்" என்று கௌரவ பிரதமர் அவர்கள் கூறினார்கள். கௌரவ பிரதமர் அவர்கள் அதை இரகசியமாகச் சொல்லவில்லை. நாம் செய்து கொண்ட உடன்படிக்கையில் எதுவும் இரகசியம் இல்லை. ஒரு இனத்தை விற்கவோ அல்லது ஒரு இனத்திற்கு இன்னொரு இனத்தின் உரிமைகளைப் பறித்துக் கொடுக்கவோ அந்த ஒப்பந்தம் செய்யப்பட்டதல்ல என்பதை நான் இங்கு கூறக்கடமைப்பட்டிருக்கிறேன்.

"தமிழ் அரசுக் கட்சியினர் எப்பொழுதும் அரசாங்கத்தை எதிர்த்துக் கொண்டிருக்கிறார்கள்; எந்த நல்ல காரியங்களைச் செய்தாலும் அவர்கள் மாறுபட்டுக் கொண்டிருக்கிறார்கள்" என்று இந்த நாட்டில் சிலரிடையே உள்ள தவறான கருத்தை நீக்குவதற்காகவும் இந்த நாட்டின் இன ஒற்றுமைக்காகவும், இந்த நாட்டின் அபிவிருத்திக்காகவுந்தான் நாங்கள் தேசிய அரசாங்கத்திற்கு ஆதரவு கொடுத்தோம். இந்த நாடு நன்மை பெற்றால்தான் தமிழ் இனமும் நல்லாக வாழும் என்பதற்காகவும் நாங்கள் தேசிய அரசாங்கத்திற்கு ஆதரவு கொடுத்தோம். எங்களுடைய தனிப்பட்ட நன்மையை மட்டும் கருதாமல் நாங்கள் இந்த நாட்டின் நன்மையையும் மறவாமல்தான் தேசிய அரசாங்கத்திற்கு உதவி செய்தோம். ஆனால், நாங்கள் இப்பொழுது ஏன் தேசிய அரசாங்கத்தை விட்டு வெளியேறினோம்? இந்த நாட்டிலுள்ள தமிழ் மக்களுடைய அடிப்படை உரிமைகள் இன்னும் அவர்களுக்கு முழுமையாகக் கொடுக்கப்படவில்லை. கௌரவ டட்லி சேனநாயக்க பிரதமராக வந்தபொழுது எங்கள் குறைகள் முழுவதையும் தீர்ப்பார் என்று நாங்கள் எண்ணினோம். தமிழ் மக்களுடைய பிரச்சினைகளைத் தீர்க்கக் கௌரவ பிரதமர் அவர்களுக்கு விருப்பமும் ஆவலும் இருந்தாலும் அவருக்கு அவற்றைத் தீர்க்கத் தக்க உறுதியும் பக்கபலமும் இல்லாமையால் எங்கள் உரிமைகளைப் பொறுத்த அளவில் நாங்கள் எந்த நிலைமையிலிருந்து அரசாங்கத்தோடு சேரத் தொடங்கினோமோ அன்றைய அந்த நிலைமையிலேதான் இன்றும் இருக்கிறோம் என்பதை நான் மிகவும் துக்கத்துடன் எடுத்துக் கூறவேண்டியவனாக இருக்கிறேன்.

சில சலுகைகளைத் தந்தால் அல்லது சில சபைகளில் ஓரிரு உறுப்பினர்களை நியமித்து விட்டால் மட்டும் எங்களுடைய அடிப்படை உரிமைகளை நாம் பெற்றவர்களாக மாட்டோம். ஆகவே, இந்த அடிப்படையிலேதான் நாங்கள் எங்களுடைய உரிமைகளுக்காகப் போராடுவோம். சலுகைகளுக்காக நாம் ஒரு போதும் போராடமாட்டோம். மந்திரி பதவிகளைக் கூட ஏற்க மாட்டோம் என்று கூறிய நாங்கள் பெரும்பான்மை இனத்தோடு இந்த நாட்டில் ஒத்து வாழ வேண்டும் என்பதற்காக எங்களுடைய கொள்கைகளில்கூடச் சிலவற்றைத் தளர்த்தி அரைவாசி வழிகூடச் சென்றோம். ஆனால் நாங்கள் எங்கள் கொள்கைகளை விற்று விட்டோம்; எங்கள் வாயையே மூடித்து விட்டோம் என்று எங்களோடு இருந்தவர்கள் சமீபத்திற்கூட எங்களைக் குற்றஞ்சாட்டினார்கள் என்பதை நான் இக்கௌரவ சபையிலே குறிப்பிட விரும்புகிறேன். நாங்கள் நின்ற நிலை தளர்ந்து கௌரவ டட்லி சேனநாயக்க அவர்களுக்கு அடிமைகளாகப் போய் விட்டோம் என்று பெரிய குற்றச்சாட்டொன்றை எங்கள் மீது பலர் சுமத்தினார்கள். எனவே நாங்கள் தீவிரவாதிகள், எங்களுடன் எதையும் ஒற்றுமையாக நடத்த முடியாதென்று நீங்கள் சொல்வதற்கு இன்று எந்த விதமான காரணமும் இல்லை.

தமிழ்மொழி உரிமைச் சட்டம் நிறைவேற்றப்பட்டபோது அந்தச் சட்டம் முழு உரிமையும் எங்களுக்குத் தரவில்லை என்பதைக் கௌரவ டட்லி சேனநாயக்க அவர்களே இந்தப் பாராளுமன்றத்தில் கூறி இருக்கிறார்கள். அந்தச் சந்தர்ப்பத்தில் "இன்னும் நாங்கள் கூடக்கொடுக்க வேண்டும். இப் பொழுது நாங்கள் கொடுக்கிறோம்" என்று பிரதமர் கூறி இருக்கிறார். இந்தச் சட்டம் நல்லமுறையில் நடைமுறைப்படுத்தப்பட

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

வில்லை என்பதை நான் பல முறை அவற்றுக் குப் பொறுப்பான அமைச்சர்களுக்கும் கௌரவ பிரதமர் அவர்களுக்கும் சுட்டிக் காட்டி இருக்கிறேன். ஒரு தமிழ் மகன், தமிழ் மக்களின் பிரதிநிதி என்ற முறையில் அரசி யல் வியாபாரம் செய்யும் நோக்கம் எதுவும் இல்லாதவன் என்பதை நான் இச்சபையிலே சுட்டிக் காட்டவிரும்புகிறேன். தமிழ் மக்கள் ஒவ்வொருவரும் இன்று நினைக்கிறார்கள் தமிழ்மொழிச் சட்டம் இன்று நடைமுறைப் படுத்தப்படாமல் இருப்பதால் அது ஒரு ஏமாற்று வித்தை என்று. தமிழில் எழுதினால் தமிழில் மறுமொழி கிடைப்பதில்லை. சாதா ரண விவசாயிகளுக்குக் கூட சிங்களத்தில் கடிதம் வருகின்றது. இவற்றைச் சுட்டிக் காட்டியும் கூட போதிய நடவடிக்கை எடுக் கப்படவில்லை.

எனவே, வருடக்கணக்காகத் தமிழ் மக்களை ஏமாற்ற முடியாது. எந்தச் சமுதாயமாயினும் உண்மைக்கு மாறாக நடந்து கொண்டு, ஒரு சமுதாயத்தின் அடிப்படை உரிமைகளைப் பறித்து வைத்துக் கொண்டு, 'நாங்கள் உங்கள் உரிமைகளைத் தருகிறோம்' என்று கூறினாலும் அதை மக்கள் நம்ப மாட்டார்கள். அதனால் தான் தேசிய அரசினின்று நாம் பிரியவேண்டி இருந்தது.

இந்த நாட்டிலுள்ள இரண்டு பெரிய இனங் களும் ஒத்து வாழவேண்டியது அவசியம். ஆனால், அந்த நல்ல கருத்துச் செயலளவில் பயன்படுத்தப்படவில்லை. இதற்கு உதாரண மாக இதுவரை நடந்திருக்கும் பல அலுவல் களை அடுக்கிக்கொண்டே போகலாம். பிரதமர் அவர்கள், இந்த நாட்டின் இன ஒற்றுமைக் காக, மொழி ஒற்றுமைக்காக, சமய ஒற்றுமைக் காகப் பாடுபடுகிறேன் என்று இந்தச் சபை யிலும் வெளியிலும் கூறுகின்றார். ஆனால், அண்மையில் நடந்த ஒரு செயலை நான் சுட்டிக்காட்ட வேண்டியவனாய் இருக்கின் றேன். அரசாங்கத்திலிருந்து நாம் வெளி யேறியபடியால்தான் அது நடந்தது; இல்லா விட்டால் நிகழ்ந்திருக்காது. நாம் அரசாங்கத் தில் இருக்கும் போது அது நிகழ்ந்திருந்தால் கட்டாயம் அரசாங்கத்தை விட்டு நாம் வெளி யேறியிருப்போம் என்பது பிரதமர் அவர் களுக்கும் [illegible] தெரிந் ததே.

PUBLIC LIBRARY
JAFFNA.
Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

கரவெட்டியிலும் அச்சுவேலியிலும் தாபிக் கப்பட்ட மூன்று பௌத்த பாடசாலைகளைப் பற்றித்தான் நான் குறிப்பிடுகிறேன். கல்வித் திணைக்களத்தில் உத்தியோகம் வகித்த ஒரு வன் என்ற முறையில் கல்விச் சட்டங்கள் பற்றியும் புதிய பாடசாலைகள் தொடங்குவது பற்றியும் அறிவும் அனுபவமும் எனக்குண்டு. அரசாங்கம் பாடசாலைகளைக் கையேற்றதன் பின்னர்——

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

May I interrupt the hon. Member ? The matter to which he is now referring can be taken up under the Votes of the Hon. Minister of Education. The hon. Member is speaking about the take-over of Buddhist schools in the North.

ඉරත්නනම් මයා.
(திரு. இரத்தினம்)
(Mr. Ratnam)

I am referring to it now because it affects the so-called amity among the two communities. I want to bring it to the notice of the Hon. Prime Minister because this is the Hon. Prime Minister's Government and I do not think the Hon. Minister of Education—

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake))

Every Vote in this book of Estimates pertains to the Prime Minister's Government.

ඉරත්නනම් මයා.
(திரு. இரத்தினம்)
(Mr. Ratnam)

That is true. The take-over of Buddhist schools affects the relations between the two communities. That is why I want to bring it to the notice of the Hon. Prime Minister under his Votes. If the Hon. Prime Minister says I should bring it up under the Votes of the Hon. Minister of Education I will do so, and I hope the Hon. Prime Minister will also be present at that time.

[ඉරත්තිනම් මයා.]

අඩුත්තතාක, එනක්කු මුන්නර් පේසිය කෙළරව උරුප්පිනර් මාවට්ට සපෙයෙප් පට්රික් කූරිනුර්. නාම් පිරතමරුටන් සෙය්තු කොණ්ට උටන්පටික්කෙයින්පටිතාන් ඉන්ත මාවට්ට සපෙ නිරුවුම් යෝසනෙ වන්ත තෙන්රු අවර් කූරිනුර්. ආනාල්, නාට්ටෙප් පිරික්කුම් නෝක්කත්තෝටු නාම් මාවට්ට සපෙ කළෙක් කේට්කවිල්ලෙ. නාට්ටින් අතිකාරංකළ් පරවලාක්කප්පට වේණ්ටුමෙන්ර අටිප්පටෙයිල්තාන් නාම් අතනෙක් කේට්ටෝම් එන්පතෙ නාන් අවරුක්කුච් සොල්ලිවෙක්ක විරුම්පුකිරේන්. අව්විතම් අතිකාරම් පරවලාක්කප්පට්ටිරුන්තාල් ඉන්ත නාට්ටිලේ පල තුරෙකළිලේ විරුම්පුම් මුන්නේට්රම් විරෙවාක එර්පට්ටිරුක්කුම්. ආනාල්, කූට ඉරුන්ත තීවිරවාතිකළුම් පත්තිරිකෙකළුම් සෙය්ත පිරචාරංකළින් කාරණමාක පිරතමර් අවර්කළ් අතනෙච් සෙය්ය මුටියවිල්ලෙ. අන්නත් තුර්ප්පාක්කිය නිලෙමෙ ඉන්ත නාට්ටිලේ එර්පට්ට පටියාල් පළෙය වෙළ්ළෙක්කාර ආට්සි මුරෙයේ ඉන්රුම් ඉන්ත නාට්ටිලේ ඉයංකික් කොණ්ටිරුක්කින්රතු. ආකවේ, නාට්ටින් නන්මෙයෙයික් කරුති අව්විත ඔරු යෝසනෙයෙ මරුක්කාමල් අතනෙච් සෙය්ය මුන්වර වේණ්ටුමෙන ඉරණ්ටු පක්කත්තිලුමුළ්ළ කෙළරව උරුප්පිනර්කළෙක් කේට්ටුක්කොණ්ටු එනතු උරෙයෙයෙ මුටික්කිරේන්.

පූ. භා. 11.30

පර්සි සමරවීර මයා. (වැලිමඩ)

(திரு. பேசி சமரவீர—வெலிமடை)

(Mr. Percy Samaraweera—Welimada)

ගරු සභාපතිතුමනි, ගරු අගමැතිතුමාගේ වැය ශීර්ෂය යටතේ වවන සවල්පයක් ප්‍රකාශ කිරීමට ඇත්ත වශයෙන්ම මම තීරණය කළේ, දැන් මේ ස්ථානයට පැමිණියාට පසුවයි. මා එවැනි තීරණයක් ගත්තේ මෙන්න මේ හේතුව නිසයි. හබරාදූවේ ගරු මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) විසින් දඹරාවේ රතනසාර ස්වාමීන් වහන්සේට සිදුවූ අවාසනාවන්ත සිද්ධිය ගැන දීර්ඝ විස්තරයක් ඉදිරිපත් කරන්න යෙදුනා. එම සිද්ධිය සියැසින් දුටු කෙනෙක් වන මා විසිනුත් ඒ සම්බන්ධ වවනයක් දෙකක් මේ ගරු සභාවේදී ප්‍රකාශ කිරීම කාලෝචිතයයි මා සිතනවා. එසේ නැත්නම් මේ වැය ශීර්ෂය යටතේ යමක් ප්‍රකාශ කිරීමට මට අවශ්‍යතාවක් නිබුණේ නැහැ. ගරු අගමැතිතුමාගේ කතාව කිරීමට සූදානමින් සිටියදීත් මට වවනයක් දෙකක් ප්‍රකාශ කිරීමට මේ අවස්ථාවේදී අවසර දීම ගැන මා සතුටු වෙනවා.

ඒ සිද්ධියට එන්න කලින් පොලිස් දෙපාර්තමේන්තුව සම්බන්ධව—

සභාපති

(අක්ගිරාසනාර්)

(The Chairman)

ඒ සම්බන්ධයෙන් කතා කරන්න පුළුවන් 18 වන වැය ශීර්ෂය යටතේයි.

සමරවීර මයා.

(திரு. சமரவீர)

(Mr. Samaraweera)

සමාවෙන්න. එහෙම නම් මා කියන්න බලාපොරොත්තු වුණ දෙය කියන්නම්. මේ දඹරාවේ ස්වාමීන් වහන්සේ සම්බන්ධ ඒ අවාසනාවන්ත සිද්ධිය සිදු වුණේ ජනවාරි 8 වැනිදයි. එදා ඒ අවස්ථාවේදී හබරාදූව මන්ත්‍රීතුමා පමණක් නොව, ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් හතර දෙනෙක්ද ඒ ස්ථානයේ සිටි බව මීට පෙරදීත් මේ ගරු සභාවට කීප වරක්ම මතක් කර තිබෙනවා. හබරාදූවෙ ගරු මන්ත්‍රීතුමා මේ සිද්ධිය ගැන දීර්ඝ වශයෙන් කතා කළේ සමහර විට හෙට ප්‍රවෘත්ති පත්‍රවල මේ සම්බන්ධයෙන් ලොකු අකුරින් පළ වූ විට ඒ මන්ත්‍රීතුමාට විශේෂ තැනක් ලැබේවිය යන බලාපොරොත්තුවෙන් විය හැකියි. ඇත්ත වශයෙන්ම මේ සිද්ධිය සියැසින්ම දුටු තවත් මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක්ම මේ ගරු සභාවේ සිටියදී, සත්‍යය මෙයයි කියා ප්‍රකාශ කිරීමට අපටත් අවස්ථාව තිබියදී, ඒ ගරු මන්ත්‍රීතුමා මේ තරම් දීර්ඝ වශයෙන් අසත්‍ය ප්‍රකාශයක් කිරීම සම්බන්ධයෙන් මා කණගාටු වෙනවා.

ගරු සභාපතිතුමනි, එදා හේවාහැට ගරු මන්ත්‍රීතුමාත් (එම්. ඒ. ඇනියෙල් මයා.), නාවලපිටියේ ගරු මන්ත්‍රීතුමාත් (චන්ද්‍ර කරුණාරත්න මයා.) මාවතගම ගරු මන්ත්‍රීතුමාත් (එච්. බී. ඒකනායක මයා.) මමත් හේවාහැට මන්ත්‍රීතුමාගේ කාර් එකට නැග ශ්‍රාවස්තියේ සිට මේ ගරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාවට එන්න පිටත් වුණා. ජනවාරි 8 වැනිදා දවල් කාලයේ සි අපි එන්න පිටත් වුණේ. කොල්ලුපිටිය මංසන්ධියට එන විට අපි දැක්කා විශාල පිරිසක්—බැලූ බැල්මට 6,000ක්, 7,000ක් පමණ—එහි රැස් වී සිටින බව. අපට ඒ ස්ථානයෙන් එන්නම බැරි වුණා. එදා පොලීසිය ඉදිරිපත් වී අපට රැකවරණය—ආරක්ෂාව—සැපයුවේ නැත්නම්, සමහර විට අපේ මන්ත්‍රීවරුන් තුන් හතර දෙනෙක්ම අද ජීවතුන් අතර නොසිටින්නත් ඉඩ තිබුණා. ඒ තරම් අමාරු තත්ත්වයක් ඇති වුණා. මා හිතන හැටියට 50 දෙනෙක් පමණ අපේ කාර්එක උඩට නැග්ගා. කාර් එකේ දෙර පියනක් කඩා නාවලපිටියේ ගරු මන්ත්‍රීතුමා එළියට ඇද ගන්න තැත් කළා. කාර් එක විනාශ කරන්න සූදානම් වුණා. ඔය අවස්ථාවේදී අපි බොහොම අමාරුවෙන් සෙනඟ මැදින් යමින් කොල්ලුපිටියේ පොලිස් මධ්‍යස්ථානයට පැමිණියා. අපි කොල්ලුපිටිය පොලීසියට ඇතුල් වුණාට පසුව තමයි, ඔය වෙඩි තැබීමේ සිද්ධිය ඇති වුණේ. අපට වෙඩි හඬ ඇසුනා.

ඔය සෙනඟ අතරේ හබරාදූවෙ ගරු මන්ත්‍රීතුමා පමණක් නොව, නිවිතිගල ගරු මන්ත්‍රීතුමාත් (ඩී. එෆ්. හෙට්ටිආරච්චි මයා.) සිටින බව අපි දැක්කා. මේ උදවිය මොන හේතුවක් නිසා ඔය පෙළපාලියට සහභාගි වුණාද කියා මා දන්නේ නැහැ. නමුත් ගරු සභාපතිතුමනි, සත්‍යය ප්‍රකාශ කරනවා නම්, ඔය අවාසනාවන්ත සිද්ධියට තුඩු දුන් එකම හේතුව නම් යම් යම් ගරු මන්ත්‍රීවරුන් අදූරදර්ශී ලෙස ක්‍රියා කිරීමයි. යම් යම් අය අදූරදර්ශී ලෙස ක්‍රියා කිරීම ඔය සිද්ධියට තුඩු දුන් ප්‍රධාන කරුණ බව මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරන්න කැමතියි. මා උත්සාහ කරන්නේ ගරු අගමැතිතුමා ආරක්ෂා කිරීමට හෝ, ගරු අගමැතිතුමා හරි තීරණයක් ගෙන තිබෙනවාය කියා පෙන්වා දීමට හෝ නොවෙයි. මා මෙම සිද්ධිය ඇස් දෙකින් දුටු නිසාත්, යම් කිසි ගරු මන්ත්‍රීවරයෙක් ලවා මෙම සභාවේදී මේ සිද්ධිය පිළිබඳ තත්ත්වය එළිදරව් කළ යුතු නිසාත්, මේ අන්දමට කතා කරන්නට මට සිදු වුණා. මේ අන්දමේ චෝදනා එල්ල කොට ඒ අය යම් යම් පිළිවෙළේ දේශපාලන වාසියක් අත් කර ගන්නට බලා පොරොත්තු වෙනවා නම් මා එක කාරණයක් කියන්නට කැමතියි. යම් යම් කාලවලදී ඔයිට වඩා අවාසනාවන්ත සිද්ධීන් ඇති වුණ වග අප දන්නවා. 1964 දී ඇති වුණු යම් යම් සිද්ධීන් ගැන අපට මෙම අවස්ථාවේදී මතක් වෙනවා. ඒවා ගැන කියන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. මොන තරම් දුෂ්කර අන්දමට එදා ගරුතර මහා සංඝයා වහන්සේලා තළා පෙළා දමා ක්‍රියා කළාද යන්න අපට මතක් වෙනවා; අප ඒවා දන්නවා.

ගරු සභාපතිතුමනි, මෙම සිද්ධියට අදාළ වාර්තාවක් ඉදිරිපත් නොකළ හෙයින් ඒ පිළිබඳ තත්ත්වය මහජනතාවට දැනගන්නට නොලැබුණු නිසා සමහර විට මෙම අවස්ථාවෙහිදී එම කාරණය මතක් කරන්නට සිදු වුණා විය හැකියි. එහෙත්, එම සිද්ධිය පිළිබඳව මෙවැනි ප්‍රකාශ කරමින්, ගරු අග්‍රාමාත්‍යතුමාට ඒ ගැන බරපතළ චෝදනා කරමින්, "තමුන්නාන්සේගේ ආණ්ඩුව හාමුදුරු නමකට වෙඩි තබා දැම්මා" යනුවෙන් ප්‍රකාශ කරමින් එම වරද එතුමා පිටම පටවා බේරී යාමට ඒ උදවිය තැත් කරනවා නම් ඊට තුඩු දුන් හේතු පිළිබඳව විමසා බලන්නට අපට සිදු වෙනවා. එදා එහි හාමුදුරුවරු එතරම් සිටියේ නැහැ. වැඩියෙන් සිටියේ මහජනතාවයි. එදා මහජනතාව ඒ ආකාරයට කුලප්පු කරගෙන ආවේ මෙවැනි අදූරදර්ශී මන්ත්‍රීවරුන් බව මා මේ අවස්ථාවේදී මතක් කළ යුතුයි.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An Hon. Member)
එතුමා එදා ඇද සිටියේ මොකක්ද?

සමරවීර මයා.
(திரு. சமரவீர)
(Mr. Samaraweera)
එදා එතුමා මොනාක්ද ඇඳල හිටියා. අන්‍ය ලබ්ධික පොලිස් නිලධාරීන් ලවා සිවුරු පැහෙච්චාය කියන චෝදනාව මෙම ගරු සභාව ඉදිරියෙහි ප්‍රකාශ කරනවා නම්, එවැනි ගරු මන්ත්‍රීවරයකුගෙන් මා ප්‍රශ්න හැටියට යම් කිසි පොලිස් නිලධාරියකු හැටියට යම් කිසි පොලිස් නිලධාරියකු හංවඩු ගසන්නේ එම පොලිස් නිලධාරියා හඳුනාගෙන සිටි නිසාද කියා. අන්‍ය ලබ්ධික

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සමරවීර මයා.]

යකු හැටියට යම් කෙනෙකු හඳුන්වනවා නම්, එක්කෝ ඔහු කතෝලිකයකු වන්නට පුළුවනි; නැති නම් ක්‍රිස්තියානිකාරයකු වන්නට පුළුවනි; ඒත් නැති නම් මුස්ලිම් භක්තියකු වන්නට පුළුවනි. එවැනි අන්‍ය ලබ්ධිකයකු ලවා සිවුරක් පාගවා මේ ආණ්ඩුව පොරොන්දු ඉටු කරන්නට තැත් කෙරුවාය කියන චෝදනාව එතුමා කරනවා නම් එහි තිබෙන බරපතළ කම පළමුවෙන් තේරුම් ගෙන සිටින්නට ඕනෑ. එවැනි ප්‍රකාශයන් කොට නිකම් බේරී යන්නට ඉඩ දෙන්නට අපට පුළුවන් කමක් ඇත්තේ නැහැ, ගරු මන්ත්‍රීවරුන්ට මෙම සභාව ඉදිරියෙහි කථා කරන්නට පුළුවන්කම තිබුණු පළියට. මා ඒ පිළිබඳව කියන්නේ එපමණයි.

මෙම සිද්ධිය මගේ ඇස් දෙකින් දුටු නිසායි, වඩාත්ම මේ කරුණු කියන්නට පෙළඹුණේ. ඩඩ්ලි සේනානායක ආණ්ඩුව මෙවැනි වැඩ පිළිවෙළක් ගෙන ගියා නම් 1970 වන විට අපි ඊට නියම පිළිතුරක් දෙමුය කියා සමහරවිට මහජනතාව තීරණය කරන්නද පුළුවනි. එහෙත් මෙම සභාවේ මේ විධියේ අසත්‍ය ප්‍රකාශ කිරීම ගැන මා විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. මෙවැනි අවස්ථා පිළිබඳව මීට පෙරත් මා විරුද්ධත්වය ප්‍රකාශ කර තිබෙනවා. යම් යම් නිලධාරීන්ට විරුද්ධව බොරු චෝදනා ඉදිරිපත් කරන අවස්ථා තිබෙනවා. මෙතැනට ඇවිත් ඒවාට උත්තර දෙන්නට එම නිලධාරීන්ට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. මීට පෙර එක්තරා නිලධාරියෙක් පගාවක් ගත්තායයි චෝදනාවක් එල්ල කළ අවස්ථාවෙහිදී මෙම සභාව ඉදිරියෙහි එවැනි අශික්ෂිත චෝදනා ඉදිරිපත් නොකළ යුතුයයි වලපනේ ගරු මන්ත්‍රීතුමාට (ටී. බී. එම්. හේරත් මයා.) මා කීවා.

ගරු සභාපතිතුමනි, යළොක්ත සිද්ධිය පිළිබඳ තත්ත්වයත් එයයි. සමහරවිට අගමැතිතුමා එම සිද්ධිය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නට පුළුවනි. මේකයි පොලිස් වාර්තාව කියා එතුමා සමහර විට එය හඳුන්වා දෙන්නට පුළුවනි. මා ඒ ගැන ඊට වඩා කරුණු කියන්නේ නැහැ.

හොඳයි, අපි ඊයෙ පෙරේදා ඇති වූ සිද්ධියක් පිළිබඳව කල්පනා කර බලමු. මේ රටේ ඉතා වැදගත් සඟරුවනකගේ ආදාහන උත්සවය වෙලාවේ සිදු වූයේ කුමක්ද? එහැනදී අපි බලාපොරොත්තු නොවුණු සිද්ධියක් ඇති වුණා. අගමැතිතුමා වෙනුවෙන් යම් ප්‍රකාශයක් කරන්නට යන ඇමතිවරයකුට නිකම් දේශපාලන ප්‍රයෝජනයක් ලබා ගැනීමේ චේතනාව උඩ හූ කියවනවා නම් එය කොතරම් නරකද? සමහරවිට 1970 මහා මැතිවරණයේ දී එවැනි කරුණුවලින් ඡන්ද ලබා ගන්නට සූදානම් වෙනවා විය හැකියි. එතන හූ කීමේ සූදානමක් නිබුණේ නැතිනම් ඒ අන්දමේ වැදගත් උත්සවයකදී එවැනි දෙයක් සිදු වන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, යළොක්ත සිද්ධිය මා සඳහන් කළේ මගේ ඇසින් දුටු දෙයක් නිසා බව මා අවසාන වශයෙනුත් මතක් කරනවා. මට මෙම අවස්ථාව ලබා දීම ගැන තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මෙම වචන ස්වල්පය අවසාන කරනවා.

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන (කර්මාන්ත හා ධීවර ඇමති)

(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன—கைத்தொழில், கடற்றொழில் அமைச்சர்)

(The Hon. D. P. R. Gunawardena—Minister of Industries and Fisheries)

මා මිනිත්තු දෙක තුනකට වඩා ගන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, විරුද්ධ පාර්ශ්වයේ බොහෝ මන්ත්‍රීවරුන් මෙම සභාව ඉදිරියෙහිදී අසත්‍ය ප්‍රකාශ කිරීම දැන් සිරිතක් කර ගෙන තිබෙනවා. වරක් දෙකක් නොවෙයි, තුන් හතර වරක්ම එසේ සිදු වී තිබෙනවා. කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) අද වුවත් එවැනි යම් ප්‍රශ්නයක් ඇසුවා. දැනට කෙරීගෙන යන සාකච්ඡාවේදී ඊට කිසිම සම්බන්ධකමක් නොමැති කාරණයක් එතුමා කිව්වා. එය සම්පූර්ණ අසත්‍ය ප්‍රකාශයක්. සේරසිංහ මහත්මයාට බොරු සාක්ෂි කියන්නවත්, හරි සාක්ෂි කියන්නවත්, කොයි විධියක සාක්ෂි කියන්නවත්, මා කිසිම අවස්ථාවක සම්බන්ධ වී වැඩ නොකළ බව ප්‍රකාශ කරන්නට කැමතියි. පූනි මාසෙ 12 වෙනිදා බොහෝම දීර්ඝ ලියුමක් කියවමින් කොළොන්නාවේ ගරු මන්ත්‍රී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුමා විසින් මේ අසත්‍ය ප්‍රකාශය කරන්න යෙදුණා. එදා මා එයට මැදිහත් වුණේ නැහැ. එහෙත් ඒ විධියේ අසත්‍ය ප්‍රකාශ නිතරම මේ ගරු සභාව ඇතුළේ කරන නිසා, කොලොන්නාව මන්ත්‍රීතුමා අදත් කෙළේ සම්පූර්ණයෙන්ම අසත්‍ය ප්‍රකාශ යක් බව මා ප්‍රකාශ කරනවා.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

සභාපතිතුමනි, ගරු කම්කාරු ඇමතිතුමා කී විචනය සමහර විට වැරදියට තේරුම් ගන්නට පුළුවන්කම තිබෙනවා. මම කිසිසේත් අසත්‍ය ප්‍රකාශයක් කර නැහැ. මා කර තිබෙන්නේ අද රජයේ නිලධාරියකු හැටියට සිටින සේරසිංහ නමැති කෙනෙක් මේ රටේ අග්‍රාමාත්‍ය තුමාට යවන ලද සන්දේශයක් මේ සභා ගර්භයේ තියවීමයි.

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන
(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)
(The Hon. D. P. R. Gunawardena)

ඒකත් අසත්‍යයක්. එදා—ජූනි මාසෙ 12 වනදා—කියෙව්වේ, අත්තනගල්ලේ මන්ත්‍රී වරියට—විරුද්ධ පාර්ශ්වයේ නායිකාවට—යැවුණ ලිපියක්ය කියා ඒ මන්ත්‍රීතුමාම සඳහන් කර තිබෙනවා.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ඒ වෙනම එකක්. මේ ලිපිය තවත් එකක්. 1966 ජූනි 12 වෙනි දින මා කියවූ ලිපිය ආමන්ත්‍රණය කර තිබුණේ මෙසේයි:

"Honourable Dudley Senanayake,
Prime Minister of Ceylon,
Prime Minister's Office,
Colombo."

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන
(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)
(The Hon. D. P. R. Gunawardena)

By whom is it signed? He said, "I am reading from a copy sent to Mrs. Bandaranaike." Here, it is down in HANSARD.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ඒ ලිපියයි මම කියෙව්වෙ. එය ගරු අගමැතිතුමාට යැවූ ලිපියක්. එයින් පිට පතක් විරුද්ධ පාර්ශ්වයේ නායිකාවටත් යවා මටත් පිටපතක් තැපැල් කර එවා තිබෙනවා. මට එවූ පිටපතයි මම කියෙව්වෙ. කොහොමද එහි කියා තිබෙන්නෙ:

"Honourable Dudley Senanayake,
Prime Minister of Ceylon,
Prime Minister's Office,
Colombo."

ඒ ලිපියට අත්සන් කර තිබෙන්නෙ සේරසිංහ මහත්මයායි. අත්සන් කළ ලියමනේ පිටපත් මටත් විරුද්ධ පාර්ශ්වයේ නායිකාවටත් යවා තිබෙන බවයි මම කිව්වෙ [බාධාකිරීම්] ඒ පත් කළ මන්ත්‍රීතුමා ඒ විධියට කථා කිරීම ගැන මට කනගාටුයි. කර්මාන්ත ඇමතිතුමාත් ඔහුගේ භාර්‍යාවත් තමන් ගෙදරට කැඳවා මෙන්න මෙහෙම සාක්ෂි කියන්නයයි ආණ්ඩුවේ සේවකයෙකුට කී බව අගමැතිතුමාට පැමිණිලි කළ ලිපියක පිටපතකුයි මම කියෙව්වෙ. [බාධා කිරීම්] මෙහි වහගන්න දෙයක් තිබෙනවා නම් තමුන්නාන්සේලා වහගත්තට කමක් නැහැ. එහෙත් මෙය පෙන්වා දීම අපේ යුතුකමක්. අද සිටින රජයේ නිලධාරියෙක් කර්මාන්ත ඇමතිතුමාට අල්ලස් චෝදනාවක් කර තිබෙනවා. අල්ලස් චෝදනාවක් පමණක් නොවෙයි, අධිකරණය නොමඟ යැවීමට එතුමා සහ එතුමාගේ භාර්‍යාව තමන් ලවා බොරු සාක්ෂි කියවා ගත්ත බවටත් චෝදනාවක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මහජන මන්ත්‍රීවරුන් හැටියට ජීවිත ගත කරන අය වශයෙන් අපේ යුතුකමක් තිබෙනවා, මේවා හරියාකාර විභාග කරවා තීරණ කරවීමට. ගරු අගමැතිතුමා ප්‍රසිද්ධ වේදිකාවලදී කියන්නෙත්, ප්‍රසිද්ධ ජීවිත ගත කරන උදවිය පුළුවන් තරම් ඒ ප්‍රසිද්ධ ජීවිතවල ගරුත්වය රැකගත යුතුය කියායි. අඩුපාඩු තිබෙන්නට පුළුවන්. එහෙත් හැකි පමණ දුරට ඒ අඩුපාඩු මහඟරවා මන්ත්‍රීවරුන් වශයෙන් ප්‍රසිද්ධ ජීවිත ගත කරන අපි ඒ ජීවිතයේ ගරුත්වය රැක ගත යුතුයි. මට යම් කිසි

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

ලියුමක් ලැබුණා නම් එහි සඳහන් කාරණය ගැන කරුණු ඉදිරිපත් කිරීම මගේ යුතුකමක්. ඒ ගැන විභාග කර බැලීම අගමැතිතුමාගේ යුතුකමක්. ඒ සමගම මේවා ගැන විභාග කර බැලීමට ඔබතුමාත් බැඳී සිටිනවා. ඒ නිසයි මෙම ලිපිය පාර්ලිමේන්තුවේදී සම්පූර්ණයෙන්ම කියෙව්වෙ. ඒ සමගම මම අගමැතිතුමාට ලියා යැව්වා, මේ කාරණය සම්බන්ධයෙන් මොන විධියේ ක්‍රියා මාර්ගයක් අරගෙන තිබෙනවාදැයි දන්වන්න කියා. මම කලිනුත් ඒ ගැන එතුමාට ලියා ඇති අතර, අගෝස්තු 18 වෙනිදත් ලියා යැව්වා. ඒ ලිපි ලැබුණ බව එතුමාගේ පිළිතුරේ සඳහන් වී තිබෙනවා. එපමණක් නොවෙයි, සේරසිංහ මහතා විසින් එතුමාට යවන ලද ලිපිය ලැබුණ බවත් ඒ ගැන කටයුතු කරගෙන යන බවත් එතුමාගේ පිළිතුරේ සඳහන් කර තිබෙනවා.

ඒ වාගේම සභාපතිතුමනි, මීට කලින් අවස්ථාවලදීත් මෙම ප්‍රශ්නය ගැන පාර්ලිමේන්තුවේ සඳහන් වී තිබෙනවා. කෝට්ටෙ ගරු මන්ත්‍රීතුමා (ස්ටැන්ලි තිලකරත්න මයා.) මේ ගැන විමසූ අවස්ථාවේදී අග්‍රාමාත්‍යතුමා කියන්න යෙදුණා, මේ ගැන පොලීසිය විභාග කළාය, පොලීසියට ප්‍රකාශයක් කිරීමට සේරසිංහ මහතා අකැමති වී තිබෙනවාය කියා.

පූ. භා. 11.45

මා මේක මතු කළාට පසුව ගරු අගමැතිතුමාට නැවතත් ලියා යැව්වා. එවිට ගරු අගමැතිතුමා 1969 අගෝස්තු 23 වැනි දා මෙන්න මේ ලියමන එවා තිබෙනවා. මේ ලියමන කෙරෙහි ගරු කර්මාන්ත ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නට කැමතියි.

"අංකය අ/ආ/23/69

1969 අගෝස්තු මස 23 වන දින, කොළඹ දී ය.

හිතවත් ඉලංගරත්න මහතාණෙනි,

කම්කරු නිළධාරි ඊ. ඩබ්ලිව්. ජේ. ඩබ්ලිව්. සේරසිංහ මහතා පිළිබඳව ඔබ විසින් එවුන ජූනි මස 22 වන දින දරණ ලිපියත්, ඊට අමතරව එවුන ජූලි මස 23 වන හා අගෝස්තු මස 18 වන දින දරන ලිපිත් මා අතට පත් විය.

—කාරක සභාව

මේ කාරණය සම්බන්ධයෙන් මවිසින් ගනු ලබන පියවර පිළිබඳව ඔබට දැන්වීම මම සතුටින් කරන්නෙමි. සේරසිංහ මහතාගේ ලිපිය ලැබුණු වහාම—"

"සේරසිංහ මහතාගේ ලිපිය ලැබුණු වහාම" කියනවා. සේරසිංහ මහතාගෙන් ලිපිය ලැබුණු වහාම අගමැතිතුමා ක්‍රියා කර තිබෙනවා. එහෙනම් අගමැතිතුමාට ලියමන ලැබී තිබෙනවා. එහි පිටපතක් මට එවා තිබෙන්නේ.

"—මා ඒ කරුණ ගැන කර්මාන්ත පිළිබඳ ගරු ඇමතිතුමා සමග සාකච්ඡා කළ අතර—සේරසිංහ මහතා විසින් නියෝජනය කරන ලද කරුණු සම්පූර්ණයෙන් අසත්‍ය බැව් එතුමන් විසින් සහතික වශයෙන් ප්‍රකාශ කරන ලදින් වැඩිදුර විභාග කිරීම සඳහා එම කාරණය මවිසින් පොලිසියට භාර දෙනු ලැබිය. සේරසිංහ මහතා ප්‍රකාශයක් කිරීම ප්‍රතික්ෂේප කර ඇති නිසා පොලිස් **පරීක්ෂණ** අවසන් කළ නොහැකි බැව් පොලිස් පතිගෙන් මට දැනගන්නට ලැබී ඇත. ඡන්ද පෙත්සම අවසාන වූ පසු ප්‍රකාශයක් කරන බැව් සේරසිංහ මහතා එක් අවස්ථාවක පොලීසියට කියා ඇත. කොළොන්නාව ඡන්ද පෙත්සම සම්බන්ධ විභාගය දැන් අවසන් වී ඇති හෙයින්, මෙම කරුණ නැවතත් ආරම්භ කර සේරසිංහ මහතාගෙන් ප්‍රකාශයක් ලබා ගන්නා ලෙස පොලිස් පතිට මවිසින් නියෝග කරන ලදී. මෙම විෂයය සම්බන්ධයෙන් අවසාන ප්‍රතිඵල යථා කල්හි ඔබ වෙත දන්වන බැව් කරුණාවෙන් සැලකුවමැනවි.

මෙයට, හිතවත්,

ඩඩ්ලි සේනානායක,

අග්‍රාමාත්‍ය".

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

තමුන්නාන්සේගේ පැමිණිල්ලට ඔය තිබෙන්නෙ සම්පූර්ණ පිළිතුර.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

මෙය මගේ පෙත්සමක් සම්බන්ධව නොවෙයි. මෙය කලින් සිටි සමරසිංහ මහතාට විරුද්ධව කර්මාන්ත ඇමතිතුමාගේ බිරිඳත් තවත් පිරිසකුත් ඉදිරිපත් කළ පෙත්සමක් සම්බන්ධවයි. ඇත්ත වශයෙන්ම මෙහි මට සම්බන්ධයක් නැහැ. එහෙත් මේවා පෙන්වා දීම අපේ යුතුකමක්. ගරු අගමැතිතුමා මට එවා තිබුණේ මා දැන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිය වූ අන්දමේ පිළිතුරක්. මා එයින් සෑහීමකට පත් නොවන නිසයි එතුමාට කියා හිටියේ මෙය පොලීසියට පැවරීමෙන් පමණක් නිශ්ශබ්ද විය යුතු ප්‍රශ්නයක් නොවෙයි කියා. ආර්. ටී. ද සිල්වා මහතා අල්ලස් දුන්නාය කියා ස.තො.ස. කොම සාරිස්තුමා ඔහු සම්බන්ධයෙන් යම්කිසි ප්‍රකාශයක් කර තිබෙනවා. මේ චෝදනාවත් ආණ්ඩුවේ නිලධාරියෙක් විසින් අග මැතිතුමාට යවා තිබෙන එකක්, කර්මාන්ත ඇමතිතුමා විසින් අල්ලස් දීමට පොරොන්දු වූ නිසා තමන් එම සාක්කිය කීවාය කියා. එම නිසා ගරු සභාපතිතුමනි, කථානායකතුමා හැටියට තමුන්නාන්සේ ත් මේ සම්බන්ධයෙන් වගකිව යුතුව තිබෙනවා. ඒකයි මා කියා සිටින්නේ. ඒ නිසා ගරු අගමැතිතුමාත් ගරු කථානායකතුමාත් අධිකරණ නායකයිනුත් මේ සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතුව තිබෙනවා. සේරසිංහ මහතා කියන එක ඇත්ත නම් අධිකරණය මුළා කර තිබෙනවා. එයට ආධාර දුන්නේ කර්මාන්ත ඇමතිතුමාය කියන එකයි ඔහුගේ ප්‍රකාශය. කොළොන්නාවේ මන්ත්‍රීතුමා හැම විටම මෙය මතක් කරනවාය කියනවා. මම ඕවා මතක් කරන විට එතුමාට ටිකක් රිදෙනවා. ඒකට කරන්න දෙයක් නැහැ. පසුගිය දිනක කථාවකදී ගරු අගමැතිතුමා මෙහෙම කියා තිබෙනවා: "ප්‍රසිද්ධ ජීවිත ගත කරන අය හොඳින් සිටිය යුතුයි; එහෙත් හැම කෙනෙකු ළඟම වැරදි තිබෙනවා; ඒ නිසා කටවහගෙන ඉන්න ඕනෑ; නැත්නම් අපට ඒවා එළි කරන්න වේවි."

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන
(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)
(The Hon. D. P. R. Gunawardena)

Still he seems to be attributing motives. He does not seem to confine himself to Serasinghe's statement. He is imputing that I actually intervened.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

The Hon. Minister has denied it here. The matter now rests with the Prime Minister.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

We must ask for an inquiry in fairness to the Minister.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

The hon. Member has brought it to the notice of the Prime Minister, and therefore it is now a matter for the Prime Minister. What is the use of repeating all these arguments now?

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ගරු කර්මාන්ත ඇමතිතුමා මට චෝදනා කරන්නට ඕනෑ නැහැ මෙය අහවල් දවසේ මතු කළා, අහවල් දවසේත් මතු කළා යනාදී වශයෙන්. මෙය සම්පූර්ණයෙන්ම පරීක්ෂා කරන තුරු මා හැමදාම මෙය මතු කරනවා. මෙහිදී පමණක් නොවෙයි ප්‍රසිද්ධියේ වෙනත් තැන්වලදීත් මතු කරනවා. එය අපේ යුතුකමක්. විශේෂයෙන්ම ආණ්ඩුවේ හොඳ නම රැක ගැනීමට නම් මෙවැනි චෝදනා ඇති ඇමතිවරුන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් කර තීරණයක් ගන්නා තුරුවත් ඔවුන් අයින් කළ යුතුව තිබෙනවා. අධිකරණය කෙරෙහි බලපාන විධියට, අධිකරණය නොමඟ යැවෙන විධියට බොරු සාක්කි දීමට පෙළඹෙව්වා යයි කීම බරපතළ චෝදනාවක්. ඒ චෝදනාව ඇමතිවරයකුට කිරීම වඩාත් බරපතලයි. ඒ නිසා ගරු අග්‍රාමාත්‍යතුමාත්, ගරු සභාපතිතුමාත් අධිකරණ නායකතුමාගේ තිබෙන මොන බලතල හෝ පාවිච්චි කර මේ සම්බන්ධයෙන් ක්‍රියා කරන ලෙසටයි, මා ඉල්ලා සිටින්නේ. මේක පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන
(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)
(The Hon. D. P. R. Gunawardena)

I just want to make one statement. I say definitely that it is absolutely a false statement that Mr. Serasinghe has made.—[*Interruption*]. You can inquire into anything. I am ready for any inquiry. So far as I am concerned, I am not afraid of any inquiry. It is absolutely a false statement. I never intervened at any stage to influence any witness in the Kolonnawa election case. I make that statement.

I also want to correct the hon. Member for Kolonnawa. As reported in Column 2769 of the HANSARD of 12th June 1969, this is what he says after he reads this petition or letter of Mr. Serasinghe :

"This is a copy of a letter addressed to Mrs. Sirima R. D. Bandaranaike, 207/2, Dharmapala Mawatha, Colombo 7, with copy to me."

That is what he stated and it is in HANSARD.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

1969 ජූනි 12 වැනිදා හැන්සාඩ් වාර්තාවේ, මා කියවන ලද ඒ ලියුම් පළ වී තිබෙනවා. සේරසිංහ මහතා ගරු අග්‍රාමාත්‍යතුමාට යවන ලද ලිපියක්ද එහි තිබෙනවා. මා ඒ ලියුම් ඔක්කොම සභාගත කර තිබෙනවා. ඒවා කියවා බලන්නට පුළුවන්. ඔවැනි වචනවලින් ගරු කර්මාන්ත ඇමතිතුමාට හැංගෙන්නට වුවමනාවක් නැහැ.

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන
(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)
(The Hon. D. P. R. Gunawardena)

මට හැංගෙන්නට වුවමනාවක් නෑ. හැංගෙන්නට දෙයක් නෑ.

I read from the HANSARD of 12th June 1969. On 12th June 1969, after reading this letter of Mr. Serasinghe, the hon. Member said, "This is a copy of a letter that has been sent to Mrs. Sirima R. D. Bandaranaike." That is all I say.

මට හැංගෙන්නට දෙයක් නෑ. තමුන්නාන්සේලාට නම් හැංගෙන්නට වේලාව ඒවි. ඒක මා භය නැතිව කියනවා. මට හැංගෙන්නට දෙයක් නෑ.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

මා සභාගත කළ ලිපි පිටපතත් ගරු අග්‍රාමාත්‍යතුමාට මුලින්ම ලැබුණු සේරසිංහ මහතාගේ ලිපියත් අතර වෙනසක් තිබෙනවාදැයි ගරු අග්‍රාමාත්‍යතුමාට පේනවා ඇති. අග්‍රාමාත්‍යතුමාට යැවූ ලිපිය එතුමා ළඟ තිබෙනවා. ඒ නිසා මේ ගැන හොඳ හැටි විභාග කර තීරණයක් කරන්නට පුළුවනි. කර්මාන්ත ඇමතිතුමාට ඔච්චර කේන්ති යන්නට වුවමනාවක් නැහැ.

බර්නාඩ් සොයිසා මයා. (දකුණු කොළඹ)
(திரு. பெர்ணட் சொய்ஸா—கொழும்புத் தெற்கு)
(Mr. Bernard Soysa—Colombo South)

Mr. Chairman, I want to ask the Hon. Prime Minister a question about a very important matter. This is in regard to the idea that has generally been gaining currency in recent times that there has been telephone tapping going on once again.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

You can raise it when the Votes of the Minister of Posts and Telecommunications are taken.

බර්නාඩ් සොයිසා මයා.
(பெர்ணட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

He will be the last person who would know anything about the subject. That this is done without his knowledge or consent, I am prepared to grant. So, it will be useless to ask him.

I was given information that one of the leaders of a communist political party which bases itself on the philosophy of Chairman Mao Tse-Tung had occasion to examine what

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

has been done to his own telephone. In the course of it he had discovered that there were two telephones that were being tapped, and one was mine.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
Absolutely incorrect.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
Then you know something about it ?

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
I know, and I will tell you the facts.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)
I also could have told you the facts. But what you now say is not correct.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
I would like to listen to what the Hon. Prime Minister has to say on this. I am stating here what I have been told. The Hon. Prime Minister can tell us what he knows about the matter, in which case I will invite those who have the necessary information to see whether there is anything in this so that it could be corrected and put to right. And I will raise the matter again.

This was the first intimation I had of this matter and I was a bit surprised because I do not like to believe that other people enjoy listening to my conversations. Apart from that, I was also sent a petition. Unfortunately, I was unable to trace the author of it. But there is no doubt that on the last occasion on which the Telephone Tapping Commission sat, although the Commissioner is a person for whom I have the highest regard and respect, the evidence that was led before him was such as not to lead him to a correct conclusion.

In a certain respect, some of the evidence placed before him and some of the information given by the technical persons concerned, amounted to an irrelevance where the problem was concerned. So, that Commissioner was not helped towards discovering the true facts of what had taken place even earlier.

I am not making any charge against the Hon. Prime Minister saying that he is getting these telephones tapped. I do not know who is behind this. However, I seriously say that what is going on is a government within a government. And the information given to us is that what is gathered, gleaned, from the tapes of conversations over various persons' telephones, including those of certain Ministers, is purveyed not merely to whoever is behind it in the Government or wherever he may be.

When activities of this kind take place, the person concerned is quite capable of serving more than one master and, in fact it is understood, this information is being placed at the disposal of foreign embassies in this country.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
No.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)
It is not so. The hon. Member for Kolonnawa says " No. "

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
I said " No "—" No " with a mark of exclamation.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බර්නාඩ් සොයිසා මයා.

(பெர்ணட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

Now, this is the kind of situation. It may, in fact, be an activity which is illegal. The Hon. Minister of Public Works, Posts and Telecommunications has asked us solemnly to consider and pass a Bill next week which makes it illegal. I do not anticipate the discussion of that Bill. I only say that Hon. Ministers must not bring here laws which they just cannot enforce. It appears that, if I pick up my telephone and I suddenly find that I have connected up with some persons conversing, and if I continue to listen to that conversation, I would be committing an offence under the law. How on earth anybody is going to discover whether it is so or not, I do not know.

As it is, I have often mentioned in regard to the Hon. Minister's telephone system that when I pick up my telephone sometimes to give a very urgent call about a certain matter, I am treated to a broadcast from the National Programme of the Ceylon Broadcasting Corporation--free, gratis, and for nothing.

ගරු මොන්ටේගු ජයවික්‍රම

(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)

(The Hon. Montague Jayewickreme)

It is not happening now ; it has been stopped.

බර්නාඩ් සොයිසා මයා.

(திரு. பெர்ணட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

Now it is not. It stopped a couple of weeks ago.

The Hon. Prime Minister should look into this matter. This may be true or this may be incorrect, but if it is true I only want the Hon. Prime Minister to give his mind to it from this point of view. No Government which does something illegal admits an illegality. From a security point of view the Government might decide to do so, but they very rarely admit it. But when you do engage in this kind of practice you would probably develop persons who are prepared, knowing very well that illegality is being encouraged, to serve more than one master, in which case that which you are trying to protect will in fact be lost, namely, the security of this country.

සභාපති

(அக்கிராசனர்)

(The Chairman)

Order, please! Business is interrupted till 2 P. M.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින් අ. භා. 2 ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு இடை நிறுத்தப்பட்டு, மீண்டும் பி. ப. 2 மணிக்கு ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 2 P.M. *and then resumed.*

ලෙස්ලි ගුණවර්ධන මයා.

(திரு. லெஸ்லி குணவர்தன)

(Mr. Leslie Goonewardene)

Before the Hon. Prime Minister replies I want to refer to a matter which I raised even in the Second Reading Debate. The Hon. Prime Minister did not have the time to reply to my question. You will recollect that this year when Independence Day was celebrated in Kandy a section of army personnel was housed in the university premises. Unfortunately, there was some clash between the students and the troops. We were all concerned about it and in that connection the Hon. Prime Minister read out a statement here which, I believe, was prepared for him by army officers. I do not agree with that statement. It seemed to be biased on the side of the army personnel. However, that may be, within that statement he read out a portion where he said some army personnel had been ragged by university students, stripped and urinated upon. I remember, on that occasion the Hon. Prime Minister

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

got up and—probably he was not reading from the report—stated that he understood that this act had been done not only by people of one sex.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

I think this same matter was raised by the hon. Member for Yatiyantota (Dr. N. M. Perera).

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

I am also raising that same matter. I am glad that the hon. Member for Yatiyantota raised it.

In that connection the secretaries of the three parties of the United Front, Mr. P. G. B. Keuneman, Mr. T. B. Subasinghe and myself took that occasion to write an open letter to the Hon. Prime Minister—this was published in the newspapers—saying that our information was that this was false and that the Hon. Prime Minister should either disclose who informed him of this thing or he should withdraw that statement apologizing at the same time.

Now, Sir, subsequent to that also, I am given to understand, a committee appointed by the university authorities have conducted an on-the-spot investigation and they themselves are of the opinion that this incident certainly did not occur —that is, the story of women students having indulged in an activity of that nature. Certainly there was not a jot of evidence to support such a contention.

The Hon. Prime Minister still continues to be silent on this matter. Many people feel that this is not only a blot on the university students but also a blot on the womanhood of Ceylon. However that may be, I think this should be a good opportunity for the Hon. Prime Minister to make a statement, again, as I say, either to disclose the source of his information or in the alternative to withdraw that statement. If he does not do so, we shall be reluctantly compelled to conclude that this was off the Prime Minister's own bat and that he has a very vivid imagination on something that is not good. Therefore we like to have a reply on this question.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

ගරු සභාපතිතුමනි, 1966 ජනවාරි මස 8 වනදා සිදු වූ සිද්ධිය [බාධා කිරීම්] තමුන්නාන්සේලා කොපමණ කෑගැසුවත්, අවුරුදු 5,000 ක් යනතුරුත් අමතක කරන්නට බැරි තරම් අපකීර්තිමත් සිද්ධියක් ඒක. අධිරාජ්‍යවාදී යුගයෙන් පසු ලංකා ඉතිහාසයෙහි ඇති වුණු ඉතාම අපකීර්තිමත් සිද්ධිය එයයි. හබරාදූවේ ගරු මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) ඒ සම්බන්ධයෙන් කළ ප්‍රකාශය මකා දමන්නට වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (සමරවීර මයා.) උත්සාහයක් දැරුවා.

සමරවීර මයා.
(திரு. சமரவீர)
(Mr. Samaraweera)
මා කිව්වේ මා දැක්ක දේ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
එහෙත්, දඹරුවේ රතනසාර හිමියන් වෙඩි තබා මැරූ සිද්ධිය තමුන්නාන්සේ කිව්වේ නැහැ. වැලිමඩ මන්ත්‍රීතුමා කිව්වේ, එතුමාත් තවත් කීපදෙනකුත් ගමන් කළ කාරෙකට පහර දුන් බව පමණයි.

සමරවීර මයා.
(திரு. சமரவீர)
(Mr. Samaraweera)
ඒ සිද්ධියට තුඩු දුන් හේතු පමණයි මා කිව්වේ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
තුඩු දුන් හේතු වෙන්න පුළුවනි. එහෙත්, බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් මරා දමන්නට තරම් එය කරුණක් වුණායයි මා විශ්වාස කරන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සී. පී. ජේ. සෙනෙවිරත්න මයා. (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
(திரு. சீ. பீ. ஜே. செனெவிரத்ன—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
(Mr. C. P. J. Seneviratne—Parliamentary Secretary to the Minister of Land, Irrigation and Power)

බලන්ගොඩදී බෝතල්වලින් ගල්වලින් ගැසූ අය හිරෙත් ගියේ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

එවැනි දෙයක් වීම හරියයි මා කියන්නේ නැහැ. ජනවාරි 8 වන දා විශාල ජනකායක් අහිංසක ලෙස, සාමකාමීව, අඩු ගණනේ අඟල් 6 ක පමණ ලී කැල්ලක්වත් නැතිව ගමන් කරද්දී [බාධා කිරීම්]

සමරවීර මයා.
(திரு. சமரவீர)
(Mr. Samaraweera)

හබරාදුවේ ගරු මන්ත්‍රීතුමා මොනවද එදා කෙළේ?

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

හාමුදුරුවරුන් එක්ක ආවා. [බාධා කිරීම්]

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

This seems to be a very sore point with the Government. I am very interested.—[*Interruption*].

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

It seems to be a sore point with both sides.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

පිරිත් සජ්ඣායනා කරමින් ගමන් කළ භික්ෂූන් වහන්සේලාටයි එදා පොලීසිය වෙඩි තැබුවේ. තමුන්නාන්සේලා එය නැතැයි කියනවාද?

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

කොමියුනිස්ට්කාරයෝ පිරිත් අහනවද?

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

කොමියුනිස්ට්කාරයන් හාමුදුරුවන් මැරීම වැනි කැත වැඩ නම් කරන්නේ නැහැ. මැතිවරණ කාලයේදී තමුන්නාන්සේලා මහජනයා ඉදිරියට යන්නේ වාමාංශික යන්ගෙන් රට, ජාතිය, ආගම බේරා ගැනීමට කැපසමිනුයි. හිය වාරයේ තමුන්නාන්සේලා බලයට ආවේත් එහෙම කැපහලයි. එසේ බලයට ඇවිත්, පළමුවෙන්ම කළ අපකීර්තිමත් සිද්ධිය මතක් කරන විට තමුන්නාන්සේලාට බොහොම අමාරුයි.

සෙනෙවිරත්න මයා.
(திரு. செனெவிரத்ன)
(Mr. Seneviratne)

එහෙම වුණේ නැහැ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

තමුන්නාන්සේලා හාමුදුරුනමක් වෙඩි තබා මැරුවේ නැද්ද?

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

සාමනේර කෙනෙක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
සාමනේර කෙනකු නම් මැරුවාට කමක් නැද්ද? එක්සත් ජාතික පක්ෂයේ ඒ ගරු මන්ත්‍රීවරයාගේ අදහස අනුව උපසම්පදාවුණු හාමුදුරුනමක් පමණයි, මරන්නට නරක. සාමනේරනමක් නම් මැරුවාට කමක් නෑ.

ගරු සභාපතිතුමනි, මේ සිද්ධිය සම්බන්ධව විශේෂ කොමිසමක් පත් කරන්නට යෙදුණා. එහෙත් එහි වාර්තාව—

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
ඒ ගැන කරුණු කියන්න මට ඉඩ දෙන්න.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
හොඳයි. අප කැමැතියි ඒ කරුණු අහන්න. අසුවල් අසුවල් කරුණු නිසා මේ කොමිසමේ වාතාවරණය පමා වුණායයි කීමෙන්, බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් මරා දැමීමේ සිද්ධිය වහන්න බැහැ. සෑහෙන කොමිසමක් පත්කොට මේ ගැන ප්‍රසිද්ධ විභාගයක් පැවැත්විය යුතුයි. මේ ආණ්ඩුවේ ආයුෂ ඉවර වන්නට පෙර ඒ කටයුත්ත කළ යුතුයි. මෙය බෞද්ධ ලෝකයාගේ ලොකු වේදනාවකට තුඩු දුන් සිද්ධියක්. ලංකාව බෞද්ධ රටක්. [බාධා කිරීම්] තමුන්නාන්සේලාට ඒක ටත් හිනා. මේ රටේ වැඩි දෙනා බෞද්ධයන් බව තමුන්නාන්සේලා පිළිගන්නේ නැද්ද? මා බෞද්ධයකු නොවේය කියා තමුන්නාන්සේලා හිතනවාද? මා මාක්ස්වාදියෙක්; එහෙත් මා බෞද්ධයෙක්. ආගමත් දේශපාලනයත් පටලවා ගන්නට වුවමනාවක් නැහැ. තමුන්නාන්සෙලා තමයි, දේශපාලනයට ආගම රුවා ගෙන මැතිවරණ කාලයේදී කෑ ගහන්නේ. මාක්ස්වාදි ගින්නෙන් ආගම් බේරා ගන්නය කියා සඳහන් වන, වෙහෙර විහාර දාගැබ් ගිණි ගන්නා අන්දම විදහා දක්වන, විශාල පත්‍රිකා ගහන්නේ තමුන්නාන්සේලායි.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
අපි ඉදිරියටත් ගහනවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
එහෙම නම් අපටත් කියන්නට සිද්ධ වෙනවා, "හාමුදුරුවරුන් පුළුස්සන එක්සත් ජාතික පක්ෂයෙන්, හාමුදුරුවරුන්ට වෙඩි තබන එක්සත් ජාතික පක්ෂයෙන් රට බේරා ගන්න" කියා. ගරු සභාපතිතුමනි, මේ හිතකම් කෑ ගැසුවට හරි යන්නෙ නැහැ. ළඟදී ජනතාවට උත්තර දෙන්නට සිද්ධ වෙයි.

ජෝර්ජ් කොතලාවල මයා. (බණ්ඩාරගම)
(திரு. ஜோஜ் கொத்தலாவல—பண்டாரகம)
(Mr. George Kotelawala—Bandaragama)
අපි උත්තර දෙනවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
තමුන්නාන්සෙ උත්තර දෙයි, සුප්‍රීම් උසාවියෙන්.

ජෝර්ජ් කොතලාවල මයා.
(திரு. ஜோஜ் கொத்தலாவல)
(Mr. George Kotelawala)
මම උත්තර දෙන්නෙ තමුන්නාන්සේලාගේ නායකයාගේ ආසනයෙන්.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
කවදාවත් වෙන වෙන කාරණා ගෙනල්ල, වෙන වෙන ප්‍රශ්න ගෙනල්ල මේ සිද්ධිය වහන්නට පුළුවන් වෙයි කියා මා හිතන්නෙ නැහැ. මේ ප්‍රශ්නවලට උත්තර දෙන්නට පමණක් නොවෙයි, මේ ගැන සෑහෙන විභාගයක් පවත්වන්නටත් ගරු අගමැතිතුමා කටයුතු කරයි කියා මා විශ්වාස කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එස්. ඩී. බණ්ඩාරනායක මයා. (ගම්පහ)
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹ)
(Mr. S. D. Bandaranayake—Gampaha)

ගරු සභාපතිතුමනි, මේ ළඟදී ගරු අග මැතිතුමා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කරන්නට යෙදුණා, රට සභා ක්‍රමයට පෞද්ගලිකව එතුමා සතුටුය—

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

නැහැ. කොහෙදිද?

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

පාර්ලිමේන්තුවෙදි. — නමුත් පාර්ලිමේන්තු කණ්ඩායම ඒකට විරුද්ධ වුණාය කියා.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

නැහැ. තමුන්නාන්සේ ටිකක් වාඩි වෙනව නම් මම ඒ ගැන කියන්නම්.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

මට මතක හැටියට අගමැතිතුමා කිව්වෙ ඒ ආකාරයටයි. ජාතික ආණ්ඩුවය කියා ගන්නා එක්සත් ජාතික පක්ෂයේ මේ ආණ්ඩුවෙන් පෙඩරල් පක්ෂය අස්වුණේ ඒ නිසා බවයි ගරු අගමැතිතුමා කියා සිටියේ. ඔවුන්ගේ ඉල්ලීම්වලට අගමැතිතුමා එකඟ වුණාය, නමුත් පක්ෂය නැත්නම් පාර්ලිමේන්තු කණ්ඩායම විරුද්ධ වුණාය කියන එකයි—

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

මම කොහෙදිවත් එහෙම කිව්වෙ නැහැ. තමුන්නාන්සේ ටිකක් වාඩි වෙනවා නම් මම තත්ත්වය කියා දෙන්නම්.

A number of matters have been raised on the Votes of the Prime Minister. Firstly, the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) referred to the Maritime Pact with the Chinese, and I asked him to raise that matter on the Votes of the Ministry of External Affairs. I have no doubt he will raise it when those Votes are discussed, and I shall deal with it then.

Then there was a matter raised about the unfortunate incident at the Peradeniya University, both by the hon. Member for Yatiyantota and the hon. Member for Panadura (Mr. Leslie Goonewardene). I am glad that they have raised it and thereby given me an opportunity of withdrawing that particular statement, expressing my regret and apologizing to any section whose feelings may have been hurt. I am thankful to those Members for giving me this opportunity.

අ. භා. 2.15

Then there was a matter raised by the hon. Member for Kolonnawa (Mr. Ilangaratne) as regards one Mr. Serasinghe. The Hon. Minister of Industries has emphatically repudiated what was stated in the letter of Mr. Serasinghe. Without in any way trying to prejudice anyone's mind, might I ask hon. Members—because it is in HANSARD—to read that letter of Mr. Serasinghe. It is a long letter which was quoted, and it is in HANSARD of 12th June 1969. You will see that it is a letter by a person who says that he was asked to give false evidence on the promise of a promotion, and because he did not get that promotion after giving the false evidence, he is bringing this matter to my notice. That is all I like to say about the individual. This is an allegation by an individual who himself says that he was promised a promotion if he gave false evidence, and, therefore, he proceeded to give false evidence. That is the individual. And there is also the statement by the Minister.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

However, the matter did not stop there. The last letter to the hon. Member was written by me, dated July 26th 1969. This is my letter :

"Dear Mr. Ilangaratne,

I am in receipt of your letter of June 22nd and your further letter of July 23rd on the subject of Mr. E. W. J. W. Serasinghe, Labour Officer. I see that you wish to know the action taken by me on the letter addressed to me by Mr. Serasinghe on the 3rd of August, 1967, and I shall be glad to keep you informed of the steps taken. As soon as the letter was received by me, I had a discussion with the Minister of Industries and, on being assured by him that the representations made were totally false, I handed the matter over to the Police for inquiry."

I wanted them to iquire into it further.

"I understand from the Inspector-General of Police that the police inquiries could not be completed due to the refusal of Mr. Serasinghe to make a statement. Mr. Serasinghe at one time had said that a statement would be made after the election petition had been disposed of. The Police inquiries on the subject are being continued, and after the matter has been disposed of, I shall write to you further."

What more can I say ? What more can I do ? And the hon. Member has got that reply from me because he referred to it.

Then there was a reference to the incidents of January 8th. It is amusing, the way hon. Members try to exploit various situations—I do not want to refer to recent incidents—for political purposes. Now, as regards this matter hon. Members themselves know that they kept on harping on the fact that a priest was deliberately shot. They know it was not so. There was no deliberate shooting of a priest. They know how and under what circumstances the priest unfortunately received the bullet. They are well aware of this situation

It is true there was a commission. First, the Public Service Commission had to inquire into the conduct of certain Police officers in connection with the incident. They appointed—the usual procedure they adopt—a committee with powers vested in the Public Service Commission. Two witnesses, who were thought to be material witnesses, refused to give evidence before that committee. So the committee was made a commission merely to compel two witnesses to give evidence. If not there would have been no commission. The committee was made a commission to compel those two witnesses who refused to give evidence to come and give evidence. The findings of that commission were made available to the Public Service Commission and the Public Service Commission has acted. I do not know how you can find fault about that matter at all. That is what exactly happened.

Then there was the matter raised by the hon. Member—I think he is referred to as the Joint Member—for Colombo South, about telephone tapping. I also saw something in the papers, and all I can say is this : there is a legally laid down procedure if a telephone is to be tapped. You cannot just tap telephones. Under a particular law, certain steps have to be taken—certain legal steps. In fact, authority has to be obtained from the Governor-General himself, I think. And after taking the legal steps, it was found necessary in the interests of security to tap the telephone of one particular individual. I might say—not that it makes any difference—that that individual is not a Member of this House. All the normal legal steps were taken. Lest Members think there is no provision for tapping, I wish to say that there is legal provision for it, and if a telephone is to be tapped all those steps have to be taken. A telephone cannot be just tapped. The authority of the Head of the State has to be obtained for the purpose. In the case of this particular individual that authority was obtained. That is all I have to say about that.

The hon. Member for Gampaha (Mr. S. D. Bandaranayake) made the statement—I do not know who gave him the information—that I said that I withdrew the District Councils Bill because the hon. Members on this side were opposed to it. I never said

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩඩ්ලි සේනානායක]

that anywhere. I do not know from where he got that idea. I said that it looked as if the people were opposed to it and, therefore, I did not want to proceed with it. That is the reason why that Bill was withdrawn.

Those are the matters that have been raised.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ගරු සභාපතිතුමනි, ගරු අගමැතිතුමා තමන්ගේ පිළිතුරු කථාවේදී ඉතාමත්ම කෙටියෙන් කීවා, දේශපාලන ප්‍රයෝජන ගැනීම පිණිස ජනවාරි 8 වනදා සිද්ධිය ගැන අප සඳහන් කරනවාය කියා. එහෙම නම් මා එතුමාගෙන් අහන්න කැමතියි, ආණ්ඩු පක්ෂය මෙබඳු සිද්ධීන් දේශපාලන ප්‍රයෝජනය සඳහා යොදා ගන්නේ නැද්ද කියා.

ගරු මන්ත්‍රීවරු
(கௌரவ அங்கத்தவர்கள்)
(Hon. Members)
නැහැ.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

The other point is the problem of the appointment of judges to the Supreme Court. I was thinking of the far more sensible way in which it is done in Singapore. It is not upon the recommendation of the Government in power that the judge is appointed. The judges themselves—the nine or seven Judges of the Supreme Court of Singapore—recommend a person either from the unofficial Bar or from the Attorney-General's Department as being a person fit for appointment to the Supreme Court Bench. It is not within the power of the Minister of Justice, as we have in Ceylon. If that is done, then there would be no question of any political patronage. That is one of the common charges against Judges of the Supreme Court today. It is a very unfortunate feeling. I have heard people refer to judges as U. N. P. judges or S. L. F. P. judges. That should not happen.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

Not judges, only Attorneys-General.

ගරු එම්. ඩී. එච්. ජයවර්ධන
(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)
(The Hon. M. D. H. Jayawardena)

I am glad that in Ceylon there are no judges belonging to any particular party. The Judges of the Supreme Court are honourable, straight men.

Now, Sir, the other point made by the hon. Member for Habaraduwa (Mr. Prins Gunasekera) was that a judge should not accept appointment as a member of a board after his retirement. Well, Ceylon is a small country. If it should be so, then all Ministers should be debarred from accepting any appointment after they are defeated because we, as Ministers, deal with many matters pertaining to people and institutions. For instance, take my own case. I was a Minister of Finance and after I was defeated I set up a finance company with certain other people. It may look bad although none of my actions was connected with the finance company at all. There is a convention that judges should not practise after they retire. That is really a salutary provision. Just because one particular judge has accepted a post as a member of the board of directors of a company after his retirement, I do not think that it should be held against him. He would not have been aware that he was going to accept that appointment at the time he heard that case. It was stated, "Well, a judge going to sit in judgement in the case of an insurance firm, having hopes of being a director of that insurance firm, would hold against some person."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Well, there was a judge with a broken leg sustained in a car accident, and in every such case that came up before him he might have thought, " Let us award the maximum amount. " I am happy that our judges did not act in that way but have maintained the highest and noblest traditions of the Supreme Court.

On the question of salaries, I think I should not speak as I am a Front-Bencher. However, since it was mentioned, I must say that it is the salaries of the minor judiciary which are woefully inadequate. Salaries of the Supreme Court Judges are quite all right, and most of them have earned a lot of money while at the Bar. When they are appointed to the Bench they are entitled to a pension. There is a pension scheme under which every year of service is counted as two years' service, so that in the case of most judges, when they have served five years, that period is counted as ten years, and in addition they add another five years. That makes it fifteen years for purposes of pension. It is really the minor judiciary who are not paid well and are undergoing hardship. I know that some of the judges are paid about Rs. 750. Today in some of the firms they pay the most junior executive very much more than we pay the minor judiciary. We should really be concerned with the salaries of the minor judiciary.

As regards the question of housing, I am glad that the Minister of Justice is taking steps to see that every year a certain number of houses are provided. All the houses necessary cannot be provided in one year. There was only one judge who applied to the Housing Department for a house, and I am glad that we were able to accommodate him in one of the flats. If there are any particular persons to whom priority should be given, certainly we are prepared to do that. In any case, it is very unbecoming of a judge if he has to go house-hunting.

The hon. Joint Member for Colombo South (Mr. Bernard Soysa) said that it is high time we did away with some of these useless ceremonies that the judges are accustomed to. The other day I went to see the Minister of Justice and I was nearly thrown into the drain by the police pilot car which went past blaring that a judge of the Supreme Court was following in his car. The road was too narrow and if I did not stop my car and make way I might have been hauled up for contempt of court. By this I do not mean any disrespect to the court. I think that certain things which were abolished in 1938 by the Macdonald Commission—things like court-criers and so on—were reintroduced when a particular person became the Chief Justice. There were added ceremonies and he wanted silken canopies over their heads and expensive carpets underfoot. I might mention here that the judges in England walk to the court and travel by tube. I should not have stated that. I have met them at lunch in a certain place where ordinary people have their lunch. At that time Mr. L. M. D. de Silva was there. He recognized me, came up to me, said some of those there were judges of the High Court, and introduced them to me. I must say that it was not such a posh place ; it was near the court.

Some of our judges today want to have their houses guarded. There has not been a single case where a stone has been flung at a judge. Of course, there was one instance in the Supreme Court where a prisoner threw a stone at the judge. Today most of the judges think it is a mat-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. එච්. ජයවර්ධන]

ter of honour and respectability to have their houses guarded. It is high time that we did away with some of these things.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

They live in a world of their own.

ගරු එම්. ඩී. එච්. ජයවර්ධන
(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)
(The Hon. M. D. H. Jayawardena)

Quite apart from their loyalty, impartiality, truthfulness, I do not think these other external trappings are necessary. Their conduct would itself bring honour to them. I am happy that the Supreme Court of Ceylon and for that matter even the minor judiciary today have shown sturdy independence. I congratulate the minor judiciary for the sturdy independence they have shown. And on the whole when we think of the judiciary we must be happy that in a small country like ours where people are related to each other we have still a judiciary in which we have the highest confidence.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ගරු සභාපතිතුමනි, විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගේ කතාවෙන් පසු එතුමාට ස්තුති කරන්නට සිතාගෙනයි, මා නැඟී සිටියේ. ආණ්ඩු පක්ෂයේ ඉදිරිපස ආසනයක සිටින ගරු ඇමතිවරයකු වශයෙන් එතුමාගේ මුවින් පළ වූ බොහෝ අදහස් මාද අනුමත කරනවා. එහෙත් එක කාරණයක් පිළිබඳව පමණක් එතුමා සමඟ එකඟ වන්නට මට පුළුවන්කමක් නැහැ. එනම් අධිකරණයට පත් වන ගරු විනිශ්චයකාරතුමන්ලා පදවියෙන් අස් වූවාට පසු ඇති වගකීම් පිළිබඳවයි.

අ. භා. 3.30

ඇමතිවරුන්ටත් එම නීතියම පැනෙව් වොත් කරන්නේ කුමක්දැයි එතුමා ප්‍රශ්න කළා. මගේ හීනෙකින්වත් අදහසක් ඇත්තේ නැහැ, අපේ ගරු විනිශ්චයකාරතුමන්ලා මෙම ආණ්ඩුවේ ඇමතිවරුන්ගේ තත්ත්වයට පත් කරන්නට. [බාධා කිරීමක්] තමුන්නාන්සේ දන්නවා පසුගිය දිනවලදී පදවියෙන් අස් වන්නට ආසන්නව සිටි ඇමෙරිකාවේ ජොන්සන් ජනාධිපතිතුමා එක්තරා විනිශ්චයකාරයකු අග්‍ර විනිශ්චයකාර ධුරයට නම් කළ බව. ඒ රටේ බලපවත්වන නීතිය අනුව අග්‍ර විනිශ්චයකාර ධුරයට යම් කෙනෙකු නම් කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනුයි. මාත් කැමතියි, දැන් තිබෙන පිළිවෙළට වෙනස් පිළිවෙළක් අනුව අපේ රටේ අග්‍ර විනිශ්චයකාරවරුන් පත් කරනවා නම්. එහෙත් එම බලය විනිශ්චයකාරතුමන්ලාට දීම වටින්නේ නැත යන්නයි මගේ හැඟීම. ඇමෙරිකන් ක්‍රමය යටතේ නම් කරන ලද අග්‍ර විනිශ්චයකාරතුමාට එම පදවියෙන් පමණක් නොව තමන් දැරූ සාමාන්‍ය විනිශ්චයකාර ධුරයෙනුත් අන්ති මට අස් වී යන්නට සිදු වෙනවා, එම රටේ බලපවත්වන එක්තරා සම්ප්‍රදායයක් නිසා. මන්ත්‍රී මණ්ඩලයට අයිතියක් ලැබෙනවා, අග්‍ර විනිශ්චයකාර වරයකු පත් කිරීමට නම් කිරීමේදී එසේ නම් කරනු ලබන පුද්ගලයා ගැන පරීක්ෂණයක් පැවැත්වීම පිණිස ඔහු මන්ත්‍රී මණ්ඩලීය විශෙෂ කාරක සභාවක් හමුවට කැඳවා ඔහුගෙන් ප්‍රශ්න විචාරීමට. මන්ත්‍රී මණ්ඩලයක් එම අයිතියෙන් අයුතු ප්‍රයෝජන ගතයුතුයයි මා කියන්නේ නැහැ. එහෙත් යම් චෝදනාවක් නැගීම සඳහා, යම්කිසි කරුණක් පැහැදිලි කර ගැනීම පිණිස, එම විනිශ්චයකාරතුමා පිළිබඳව දැනගතයුතු තොරතුරක් තිබෙනවා නම් එය මහජන මන්ත්‍රී මණ්ඩලය දැනගත්තාට කිසිම වරදක් නැහැ. එම අයිතිය ක්‍රියාවට යොදවන්න ගිහින් තමයි, ඇමෙරිකන් අග්‍ර විනිශ්චයකාරධුරයට නම් කළ ඒබ් ෆෝටාස් මහතාට අන්තිමට ලැබෙන්නට තිබුණු අග්‍ර විනිශ්චයකාර ධුරයත් තිබුණු විනිශ්චයකාර ධුරයත් නැතිව ගියේ. තමන් විනිශ්චයකාර ධුරයට පත් වීමට පෙර එක්තරා සමාගමකින් ලබාගත් යම්කිසි ගාස්තුවක් පිළිබඳ ප්‍රශ්නයක් මතු වී ඒ සමාගමට සම්බන්ධ එක්තරා පුද්ගලයෙක් නඩුවකට පැටලී ඇති කෙනෙකැයි කියන චෝදනාව පිට විනිශ්චයකාරයකුට එබඳු තැනක සම්බන්ධකමක් තිබී ම වටින්නේ නැතැයි කියන කාරණය උඩ ඒබ් ෆෝටාස් මහතාට තමන්ගේ නඩුකාර පදවියත් නම් කරන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලද අග්‍ර විනිශ්චයකාර ධුරයත් නැතුව ගියා. ඒක හොඳ ලකුණක්. චරිත ශුද්ධිය පිළි බඳව පැහැදිළි නිකැළැල් වාර්තාවක් තිබෙන අයයි විනිශ්චයකාරවරුන් විය යුත්තේ. අබමල් රේණුවකවත් සැකයක් තිබෙනවා නම් එය දුරලාගෙනයි එම පදවි යට පත් විය යුත්තේ.

අද බලපවත්නා නීතිය යටතේ එබඳු අවස්ථාවක් අපට ඇත්තේ නැහැ. මන්ත්‍රී මණ්ඩලයටවත් මහජනයාටවත් එබඳු අවස්ථාවක් ඇත්තේ නැහැ. අධිකරණයේ එබඳු පදවි දරණ පුද්ගලයන් පිළිබඳව ප්‍රශ්න කිරීමේ අයිතියක් යම්කිසි මාර්ගයකින් ලබා ගන්නට පුළුවන්නම් මා සිතනවා එය අධිකරණයේ පරිශුද්ධ භාවය ආරක්ෂා කර ගැනීමේ පියවරක් වෙනවා ඇත කියා.

නයිනා මරික්කාර් මයා.

(நைனா மரிக்கார்)

(Mr. Naina Marikar)

Mr. Chairman, I do not know whether it is necessary for me to reply to most of the points that have been raised, because the Hon. Minister of Scientific Research and Housing intervening in the discussion referred to those matters which concern the Ministry of Justice. We are all agreed that there is really a great necessity for improvement in the accommodation of our judges, for revision of salaries of judges and for improvement of their conditions of service to enable them to carry out their judicial responsibilities and duties. I am happy that all these matters have been raised by hon. Members, particularly by the hon. Member for Colombo South (Mr. Bernard Soysa) who is always an advocate not only for the underdog but also for the topdog. We shall certainly go into these matters very carefully. I personally think that these two matters, accommodation and salaries, should be given priority as far as judges are concerned.

There is one other matter to which my good Friend the hon. Member for Habaraduwa (Mr. Prins Gunasekera) referred with evangelical solemnity, as he always does ; namely, the right to criticize judges. It is not only an accepted convention but also a necessary protection for the judges that nobody should impute motives, that they should not be attacked on purely personal grounds on any of the judgements they deliver. But a judge can always be impeached, if I may use the word, and criticized, on a substantive Motion brought in this House. I think hon. Members are aware of that. So, a judge is not, if I may say so, altogether free if he errs in judicial rectitude.

The lack of accommodation in the Supreme Court was referred to by some hon. Members. It is perfectly correct that there is not enough accommodation and we are trying to do something about it. I understand that one of the Chambers of a former judge is now being converted into a court-house. The plans are ready and the money has been sanctioned. So we hope that there will be an extra court-house.

Another complaint has been with regard to the disposal of long-standing cases. I think an hon. Member drew attention to the non-disposal of 1965 and 1966 cases. We are going into it because it is a matter which has been raised earlier. I think no case should be delayed for so long because justice delayed is justice denied. It is one of the many impediments, if I may say so, to the speedy administration of justice in the country when cases are not dealt with within reasonable time. This is a matter which will be gone into.

There was a serious fear expressed that we might reduce the number of Judges from 11 to 9. As far as I understand, I do not think that is going to happen because of the large number of cases we have and the possible increase in cases in the future. So that is the only assurance I can give to the hon. Members of this House.

All matters that have been raised here will be considered by the Ministry and given effect to wherever possible.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"3 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 6,48,164 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

3 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"3 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் ரூபா 6,48,164 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

3 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 648,164 for Head 3, Vote No. 1, be inserted in the Schedule" put, and agreed to.

Head 3, Vote 1, ordered to stand part of the Schedule.

2 වන සම්මතය—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 93,950

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச செலவுகள்—மீண்டுவரும் செலவு, ரூபா 93,950

Vote No. 2.—Administration Charges—Recurrent Expenditure, Rs. 93,950

"3 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 93,950 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

3 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"3 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 93,950 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொளளப்பட்டது.

3 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 93,950 for Head 3, Vote No. 2, be inserted in the Schedule" put, and agreed to.

Head 3, Vote 2, ordered to stand part of the Schedule.

4 වන ශීර්ෂය.—කැබිනට් කාර්යාලය

1 වන සම්මතය—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 1,38,711

4 ம் தலைப்பு :—அமைச்சர் சபை அலுவலகம்

வாக்குப்பணம் இல. 1—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூபா 1,38,711.

Head 4.—Cabinet Office

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 138,711

"4 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 1,38,711 මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

4 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"4 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் ரூபா 1,38,711 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

4 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 138,711 for Head 4, Vote No. 1, be inserted in the Schedule" put, and agreed to.

Head 4, Vote 1, ordered to stand part of the Schedule.

2 වන සම්මතය—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 22,500

வாக்குப்பணம் இல. 2—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு, ரூபா 22,500

Vote No. 2.—Administration Charges—Recurrent Expenditure, Rs. 22,500

"4 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 22,500 මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

4 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"4 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 22,500 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொளளப்பட்டது.

4 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 22,500 for Head 4, Vote No. 2, be inserted in the Schedule" put, and agreed to.

Head 4, Vote 2, ordered to stand part of the Schedule.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

5 වන ශීර්ෂය.—උත්තර මන්ත්‍රණ සභාව

1 වන සම්මතය:—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 4,36,767

5 ම් தலைப்பு :— மேல் சபை

வாக்குப்பணம் இல. 1—பணியாளரின் ஆளுக் குரிய வேதனமும் பிறபடிகளும், ரூபா 4,36,767

HEAD 5—SENATE

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 436,767

"5 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 4,36,767 මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

5 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"5 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் ரூபா 4,36,767 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

5 ஆம் தலைப்பு, 1 ஆம் வாகுப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 436,767 for Head 5, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.

Head 5, Vote 1, ordered to stand part of the Schedule.

2 වන සම්මතය—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 2,18,445

வாகுப்பணம் இல. 2—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு, ரூபா 2,18,445.

Vote No. 2.—Administration Charges—Recurrent Expenditure, Rs. 218,445

"5 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 2,18,445 මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

5 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"5 ஆம் தலைப்பு, 2 ஆம் வாகுப்பணம் ரூபா 2,18,445 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

5 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 218,445 for Head 5, Vote No. 2, be inserted in the Schedule" put, and agreed to.

Head 5, Vote 2, ordered to stand part of the Schedule.

6 වන ශීර්ෂය.—නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

1 වන සම්මතය:—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 9,46,472

6 ம் தலைப்பு :—பிரதிநிதிகள் சபை

வாக்குப்பணம் இல. 1—பணியாளரின் ஆளுக் குரிய வேதனமும் பிற படிகளும் ரூபா 9,46,472.

HEAD 6.—HOUSE OF REPRESENTATIVES

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 946,472

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I move,
"That the Vote be reduced by Rs. 10."

There is only one point; it is only an appeal to you. The Salaries Commission has made certain changes with regard to the salaries of government servants, and I think the Government intends to implement those recommendations. Something comparable will have to be done for the members of our staff. I do not know whether it is a committee that we should have or a commission. Whatever it is, I do think that we should not treat our staff with any less consideration vis-a-vis the Public Service. I think something will have to be done, and I do wish to appeal to you to take the necessary steps to see that a proper committee is set up for the purpose of looking into their case also.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

I support what the hon. Member for Yatiyantota has said.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பேர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

Now that this matter has received the support of Colombo South, as represented by a Front-Bencher of the Government, it is hardly necessary

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

to mention it except to refer to one point. Time and again, we have here brought to light certain anomalies in regard to the various grades of employees in the service of this House—here as well as in the other place and also at "Sravasti".

In regard to all these anomalies, if we merely preserve the existing ratios of salaries in line with the general principle of the increase, the anomalies will be preserved. I would like this committee, or whatever it is that may be appointed to examine the salary structure of the employees of the House of Representatives, to go into the question of the anomalies that have been mentioned in regard to the various grades of employees, such as reporters, simultaneous interpreters, *karyala karya sahayakas*, those who are called cleaners, and so on. I do not know why these "cleaners" have been given this peculiar designation. The bulk of the minor employees are called "පවිත්‍ර කරන්නෝ". I do not know why this label has been given to them.

All these various grades have grievances in regard to anomalous situations that have arisen in their classification and the respective ratios that their salary scales bear to one another. I would like this committee or commission that may be appointed, not to freeze the existing structure but to go into those questions as well when they draw up new salary scales for all these posts.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

ගරු සභාපතිතුමනි, නියෝජිත මන්ත්‍රී මණ්ඩලය යටතේ වවන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට මාත් බලාපොරොත්තු වෙනවා. පළමුවෙන්ම නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ වැඩ කටයුතු වාර්තා කිරීම පිළිබඳව සඳහන් කරන්නට කැමතියි. ගරු සභාපතිතුමනි, මේ රටේ රාජ්‍ය භාෂාව සිංහල බව තමුන්නාන්සේත් දන්නවා. එහෙත් මෙහි වැඩ කරන්නේ එංගලන්තයේ රාජ්‍ය භාෂාවෙන්. මේ ගරු සභාව තුළ—රටේ ඉතාමත්ම උසස් ආඥ තනය තුළ—කෙරෙන කටයුතු අපේ ස්ථාවර නියෝගවලට අනුව භාෂා තුනෙන්ම කරන්නට පුළුවන්කම තිබුණත්, ඒ තත්ත්වය වෙනස් කර ඉංග්‍රීසියෙන් කෙරෙන කථාත් සිංහල හා දෙමළ භාෂාවලට පරිවර්තනය කර හැන්සාඩ් වාර්තාවේ පළ කළ යුතුයයි මා කියා සිටිනවා. රටේ ජනතාවට මේ මන්ත්‍රී මණ්ඩලය තුළ කෙරෙන කටයුතු ගැන පැහැදිලි අවබෝධයක් ලබා ගන්නට පුළුවන් වන්නේ එසේ කිරීමෙන් පමණයි. විශේෂයෙන්ම මහජනතාවගෙන් වැඩි දෙනා සිංහල භාෂාව දන්න අය හා දෙමළ භාෂාව දන්න අය නිසාත්, ඉංග්‍රීසි භාෂාව තේරුම් ගැනීමට බහුතර ජනතාවට නොහැකි නිසාත්, මේ ගරු සභාවේ කෙරෙන කථා සිංහලෙන් සහ දෙමළෙන් හැන්සාඩ් වාර්තාගත කිරීම ඉතාම අවශ්‍යයි. ඒ නිසා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ස්ථාවර අණපනත් අපේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට පටහැණි නොවන අන්දමට සකස් කර මේ ගරු සභාව ඇතුළත කෙරෙන සියලුම කතාබහ සිංහලෙන් සහ දෙමළෙන් වාර්තාගත කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

එමෙන්ම ගරු සභාපතිතුමනි, නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරුන් සම්බන්ධවත් කිය යුතු කරුණක් තිබෙනවා. මේ ආණ්ඩුව 1965 සිට රථ වාහන විශාල සංඛ්‍යාවක් මේ රටට ගෙන්වා තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. 5 ශ්‍රී කාර් පන් දහසකටත් වඩා තිබෙනවා. එහෙත් මේ රටේ කුලී රථ අයිතිකාරයින්ට සලකන අන්දමින්වත් මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ට සලකන්නට මේ රජයට පුළුවන් වුණේ නැහැ. මන්ත්‍රී කෙනෙකුට වාහනයක් නැතිව තමන්ගේ වැඩ කටයුතු කර ගෙන යන්නට පුළුවන්ද බැරිද කියන එක තමුන්නාන්සේත් දන්නවා. මන්ත්‍රීවරුන්ට තම ඡන්ද කොට්ඨාශයේ වැඩ කටයුතුත් ඡන්ද කොට්ඨාශයෙන් බැහැර වැඩ කටයුතුත් වාහනයක් නැතිව කර ගෙන යෑම බොහොම අමාරු වැඩක්. මන්ත්‍රීවරුන්ට දුම්රිය ප්‍රවේශ පත්‍රයක් නම් නොමිලේ දෙනවා. එහෙත් ඡන්ද කොට්ඨාශ තුළ ගමන් කිරීමට දුම්රිය පාරවල් නැහැ. සමහර ඒවායේ බස් පාරවලුත් නැහැ. දුම්රිය හා බස් රිය නැති පාරවල මන්ත්‍රීවරුන් ගමන් කරන්නේ කොහොමද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ නිසා මන්ත්‍රීවරයෙකුට වාහනයක් දීම ඉතාමත්ම සාධාරණ කටයුත්තක්. එහෙත් මේ ආණ්ඩුව එය සාධාරණ බව පිළිගන්නේ නැහැ. ආණ්ඩුවේ අයට නම් වගා ව්‍යාපාරයේ මුවාවෙන් ජීප් රථවත් ලැබෙනවා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

විරුද්ධ පාර්ශ්වයේ අයටත් ලැබෙනවා. දෙවිනුවර මන්ත්‍රීතුමාට (ආර්. ජේ. ජී. ද මැල් මයා.) හා මුල්කිරිගල මන්ත්‍රීතුමාට (ජෝර්ජ් රාජපක්ෂ මයා.) ලැබී තිබෙනවා. එපමණක් නොවෙයි අකුරැස්සේ මන්ත්‍රීතුමාටත් (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) ලැබී තිබෙනවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

අකුරැස්සේ මන්ත්‍රීතුමාට ලැබී නැහැ. මා කියන්නේ අනික් මන්ත්‍රීවරුන් ගැන නොවෙයි. හොඳයි, මට වාහනයක් දෙන්නට ලැහැස්තිද?

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

තමුන්නාන්සේට කාර් එකක් නැගි ලැබුණේ!

අ. භා. 3.45

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

මහජනයාගෙන් තමයි අපට ලැබෙන්නේ. මාතර කොට්ඨාශයේ ඡන්ද දායකයින් මුදල් එකතු කර මට EN කාර් එකක් අරගෙන දුන්නා. දැන් ඒක ගරාජ් එකේ. එය අලුත්වැඩියා කරන්නට දමලා. දැන් මම ටැක්සිවලින් තමයි ගමන් කරන්නේ. වාහන නැති මන්ත්‍රීවරුන්ට වාහනයක් දෙන්නට බැරි ඇයි? තිබෙන අයට නම් ඕනෑ නැහැ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

නිකම්ද?

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

නිකම් නොවෙයි, මුදල්වලට. අපි නිකම් ඉල්ලන්නේ නැහැ. තමුන්නාන්සේ ඒක ඉෂ්ට කරනවාද? ඒ ප්‍රශ්නයට උත්තර දෙන්නට අමාරුයි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ඡන්දෙට පස්සෙ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

මහා මැතිවරණයෙන් පසුවලු, කාර් දෙන්නේ. එතකොට තමුන්නාන්සේලාට කාර් දීම ගැන අප කල්පනා කර බලනවා.

මන්ත්‍රීවරුන්ගේ ලිපිකරුවන් ගැනත් වචනයක් කියන්නට ඕනෑ. ගමන් පහසු කම් නැති නිසා ලිපිකරුවන්ට ඡන්ද කොට්ඨාශවල ඇවිදින්නට අමාරුයි. ඒ ලිපිකරුවන්ට බස් රථවල යෑමට බල පත්‍ර නිකුත් කරන ලෙස කාලයක් තිස්සේ අප ඉල්ලුවා. එහෙත් තවම එය ඉෂ්ට කර නැහැ.

ගරු සභාපතිතුමනි, මෙම ගරු සභාවේ ශුද්ධ කරන්නන්—ක්ලීනර්ස්—ගණයේ 13 දෙනකු සිටිනවා. ඒ වාගේම පණිවුඩ කරුවන් සිටිනවා. ඔය ශුද්ධ කරන්නන් වශයෙන් සිටින උදවිය ඇත්ත වශයෙන්ම ඒ වැඩ කරනවා ඇත්තේ ඉතාමත්ම සුළු වේලාවක් වන්නට පුළුවනි. ඔවුන් වැඩි වේලාවක් පණිවුඩකරුවන් හැටියට වැඩ කරනවා. පණිවුඩකරුවන් හැටියට ඔවුන් එහාට මෙහාට යනවා; ටෙලිෆෝන් එකට එනවා; වෙනත් වැඩවලට යනවා. ඒ උදවිය ශුද්ධ කරන්නන්ගේ ගණයට දමා තිබීම ඉතාමත්ම අසාධාරණයි. පණිවුඩ කරුවන්ට මාසයකට මූලික පඩිය වශයෙන් රුපියල් 55 ක් ලැබෙන අතර

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා]

ශුද්ධ කරන්නන්ට රුපියල් 50 ක් ලැබෙනවා. ඒ වාගේම ශුද්ධ කරන්නන්ගේ උපරිම වේතනයත් රුපියල් 5 කින් අඩුයි. මේ භේදය නැති කර දමන ලෙස මා ඉල්ලා සිටිනවා. ශුද්ධ කරන්නන්ද පණිවුඩකරුවන්ගේ තත්ත්වයට දමා වැටුප් සකස් කිරීම කාලෝචිත ක්‍රියාවක් බව මතක් කරන්නට කැමතියි.

ශුද්ධ කරන්නන්ටත්, පණිවුඩකරුවන්ටත් විශේෂ නිල ඇඳුමක් සැපයීම ගැන සතුටු වෙනවා. දැන් ඔවුන් කලිසම් ඇඳ ගෙන සිටීම ගැන සතුටුයි. එහෙත් දී තිබෙන නිල ඇඳුම පමණක් ඇන්දොත් අවලක්ෂණ තත්ත්වයක් ඇති වෙනවා. ඔවුන්ට සෙරෙප්පු හෝ සපත්තු දී නැහැ. එක්කෝ සෙරෙප්පු කුට්ටමක් දෙන්නට ඕනෑ; නැත්නම් සපත්තු කුට්ටමක් දෙන්නට ඕනෑ. ඇඳුමේ හැටියට නම් වැඩිය ඔබින්නේ සපත්තු කුට්ටමක් නිසා එය සැපයීමට විධිවිධාන යොදනවා ඇතැයි බලාපොරොත්තු වෙනවා.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මෙන්ම ශ්‍රාවස්තිගය සිටින සේවකයන්ගේ ද ප්‍රශ්න ගැන පසුගිය අවුරුදු දෙක තුන තුළදීම අප කරුණු ඉදිරිපත් කළා. ශ්‍රාවස්තියේ සිටින සේවකයන්ට විශ්‍රාම වැටුපක් ලබා දෙන්නට කටයුතු කරන්නැයි අප ඉල්ලා සිටියත් තවම එය ඉෂ්ට කර නැහැ. සේවා කාලයෙන් පසුව ඒ සේවකයන්ට ජීවත් වන්නට අවස්ථාව සලස්වා දීම යුතුකමක්. ඒ සේවකයන්ගේ දුක්ගැනවිලි ගැන ගරු සභාපතිතුමා කීප විටක්ම වග විභාග කළ බව අප දන්නවා. ඒ ගැන ඔබතුමාට ස්තුතිවන්ත වන අතර ඒ සේවකයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රශ්නය සම්බන්ධයෙන් ඉක්මණින් තීරණයක් කර එය ක්‍රියාත්මක කරන්නට කටයුතු සලස්වන ලෙස මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

ගරු සභාපතිතුමනි, මාතර මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නයක් අසන්නට යෙදුණා. ඒ ප්‍රශ්නයට උත්තර දීමට ගරු රාජ්‍ය ඇමතිතුමාට පුළුවන්දැයි මා දන්නේ නැහැ. අබලන් මෝටර් රථ තිබෙන මන්ත්‍රීවරුන්ට සහ මෝටර් රථ නැති මන්ත්‍රීවරුන්ට මෝටර් රථ දෙන්නට විදේශ විනිමය වෙන් නොකරන්නේ මන්දැයි එතුමා ප්‍රශ්න කළා. ඒ ප්‍රශ්නයට උත්තර දෙන්නට මට පුළුවන්කමක් තිබෙනවා. මන්ත්‍රීවරුන්ට කාර් ගැනීම සඳහා විදේශ විනිමය වෙන් කර නොදෙන්නේ, එසේ දුන්නොත් මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයන්ට එයින් අවාසියක් වන නිසායි. පරණ කාර් තිබෙන හෝ කාර් නැති හෝ මන්ත්‍රීවරුන්ට කාර් ලබා ගැනීම සඳහා වුවමනා කරන විදේශ විනිමය වෙන් කර දීමේ යෝජනාවක් කලකට පෙර තිබුණා. එය ක්‍රියාවේ නොයෙදුණු හේතුවත් මා දන්නවා. "දෙනවා නම් ලොකු කාර් දිස පොඩි කාර් එපාය" යි මන්ත්‍රීවරුන් කියා සිටියා. එසේ කියා සිටියේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ද විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ද යන වග නින්දු කර ගැනීම මොළේ ඇති කෙනෙකුට අමාරුවක් නැහැ.

බද්දේගම ගරු මන්ත්‍රීතුමා (නීල් ද අල්විස් මයා.) කාර් ප්‍රශ්නය ගැන නිතරම කතා කරනවා. එතුමාට ලොකු කාරෙකක් තිබෙනවා. හැබැයි, බද්දේගම සිට ගාල්ලට ඒ කාරෙකෙන් එන්න පිටත් වුණොත් ගාල්ලට එනතුරු එන්න පුළුවන් වේදැයි සැක සහිතයි. කොළඹට නම් කොහොමවත් ඒකෙන් එන්න බැහැ. "මට වුවමනා ලොකු කාර් නොවෙයි, මගේ ලොකු කාරෙක අරගෙන මට පොඩි කාරෙකක් ලබා දෙන්න" කියා එතුමා ඉල්ලනවා. මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) වාමාංශිකයකුත් වී මෙවැනි ප්‍රශ්නයක් ඇසීම ගැන මා පුදුම වෙනවා. අපට කාර් ලබා නොදෙන්නේ එසේ ලබා දීමෙන් මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයන්ට අවාසි වන නිසා බව මා එතුමාට මතක් කරන්නට කැමතියි.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ගරු සභාපතිතුමනි, මෙම වැය ශීර්ෂයට අදාළ යෝජනාව, ලේකම් මහත්මයාගේ පඩියෙන් රු. 10 ක් කැපිය යුතුය යන්න පමණක් වුවත්, වැය ශීර්ෂයට අදාළ නොවන වෙනත් දේවල් කතා නොකර වාඩි වන ලෙස මට අණ කරන්න එපායැයි මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ගැන සඳහන් කරන්නට අපට ලැබෙන එකම අවසථාව මෙයයි. මේ අවස්ථාවේදී නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ හැම අංශයක් ගැනම සඳහන් කරන්නට සිදු වී තිබෙනවා.

මා පළමුකොටම මතක් කරන්නේ, මෙම මණ්ඩලයේ ගරු මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම්, හොඳ නාමය හා පැවැත්ම පිළිබඳව සම්පූර්ණයෙන්ම වග කියන එහි ආරක්ෂකයා හැටියට සිටින තමුන්නාන්සේ ඒවා සම්බන්ධයෙන් ඉදිරිපත් වී ක්‍රියා කළ යුතු බවයි. අද තිබෙන නීති රීති යටතේ හෝ වේවා, සම්ප්‍රදායයන් යටතේ හෝ වේවා, වෙනත් වත්පිළිවෙත් යටතේ හෝ වේවා මන්ත්‍රීවරුන්ට කැළලක් සිදු වන යමක් තිබේ නම් එය වැළැක්වීමට ඉදිරිපත් වීම තමුන්නාන්සේගේ පරම යුතුකමක්. මෙම මණ්ඩලයේ සාමාජික යන් වන ගරු මන්ත්‍රීවරුන්ගේ හොඳ නම ආරක්ෂා කර ගැනීම සඳහා කථානායක හැටියට හැම පියවරක්ම ගැනීම තමුන්නාන්සේගේ යුතුකමක්. අද මෙම මණ්ඩලයේ විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් කෙරෙහි කෙසේ වෙතත්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් බොහෝදෙනා කෙරෙහිත් විශේෂයෙන් ඇමති මණ්ඩලය කෙරෙහිත් නොයෙක් විට එල්ල වන චෝදනාවක් නම්, වත්කම් හා පගා පිළිබඳ චෝදනාවයි. මෙයට ඉඩකඩ සැලසී තිබෙන්නේ අද පවත්නා නීතියේ ඇති දුර්වලතා වගයකුයි. මාත් මෙම මණ්ඩලයේ සාමාජිකයකු වන නිසා මෙම මණ්ඩලයේ සිටින හැම දෙනාටම නිගරු වන විධියේ පොදු චෝදනාවක් එල්ල කරනු ලබන වාට මා කැමති නැහැ.

ගම්පහ ගරු මන්ත්‍රීතුමා (එස්. ඩී. බණ්ඩාරනායක මයා.) මෙම මණ්ඩලය එක්තරා නාමාවලියකින්, "අභිනන්දනයකින්" සඳහන් කරන අවස්ථාවලදී තමුන්නාන්සේ, "මේ මන්ත්‍රී මණ්ඩලය එවැනි නම්වලින් හඳුන්වන්න එපා; ඒ කතාව නැවත වරක් මෙහි කියන්න එපා; තමුන්නාන්සේ මේ ගරු සභාවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්; තමනුත් සාමාජිකත්වය දරන මණ්ඩලයක් ඔය 'ගුහා' නාමයෙන් හඳුන්වන්න එපා" යනාදී වශයෙන් ඒ ගරු මන්ත්‍රීතුමාට අවවාද කරනවා. බොහෝම හරි. යම්කිසි විධියකින් තමුන්නාන්සේගේ ඒ ඉල්ලීම් ඒ ගරු මන්ත්‍රීතුමා ඉෂ්ට නොකළොත් සභාගර්භය තුළට එන්න එපායයි තමුන්නාන්සේ එතුමාට නියම කරන්නේ මොන හේතුවක් නිසා ද? මේ ගරු සභාවේ හොඳ නම ආරක්ෂා කළ යුතු නිසායි. ඒ ස්ථාවර අණපනත් යටතේ ඔබතුමාට කරන්නට පුළුවන් දේ පමණයි.

මේ පාර්ලිමේන්තුවේ අවසාන සැසි වාරයේ අවසාන අයවැය ලේඛන පිළිබඳ විවාදයේදී මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටින්නේ ඒ ස්ථාවර අණපනත්වලින් පමණක් මන්ත්‍රීවරුන්ගේ හොඳ නාමය ආරක්ෂා කිරීම සඳහා ප්‍රයෝජන නොගෙන ඊට වඩා දැඩි පියවරක් ගන්න කියායි. නීති සම්පාදනයට ඔබතුමා විසින් මන්ත්‍රීවරුන් හෝ ඇමතිවරුන් මෙහෙයවීම සාමාන්‍ය සිරිත නොවෙයි. ඔබතුමා නමින් නීතියක් ඉදිරිපත් වෙන්නේ නැහැ. අපේ ආණ්ඩු ක්‍රම පනත අනුව මුදල් පිළිබඳ නීතියක් නම් ගරු ඇමතිවරයකු විසින් ඉදිරිපත් කරන්නට ඕනෑ. ඒ හැරුණු කොට මන්ත්‍රීවරුන් හැටියට—ආණ්ඩු පක්ෂයේ හෝ වේවා, විරුද්ධ පාර්ශ්වයේ හෝ වේවා—යම් යම් කොන්දේසි අනුව, යම් යම් කල්දිම් ඇතිව, යම් යම් දැන්වීම් ආදිය පළ කිරීමෙන් පසු නීති සම්පාදනය පිණිස මේ මන්ත්‍රී මණ්ඩලයට යම් යම් පනත් කෙටුම්පත් ඉදිරිපත් කරන්නට අපට පුළුවන්කම තිබෙනවා. ඒ සාමාන්‍ය පිළිගත් චාරිත්‍ර මාලාවයි. එහෙත් මහජන ජීවිතය පිළිබඳව අද පවත්නා පරිහානිය දෙස බැලුවාම "මේ පිළිවෙත්වලින් බැඳිල අපට කරන්නට බලයක් නැහැ; කථානායක හැටියට මට නීතියක් ගෙනෙන්නට පුළුවන්කමක් නැහැ; මම නීතියක් ගෙන ඒම සාමාන්‍ය පාර්ලිමේන්තු සිරිත නොවෙයි" කියා අහක බලාගෙන සිටීම ඔබතුමාට වටින්නෙ නැති බවයි මම කියන්නේ. ස්ථාවර අණපනත් යටතේ ඔබතුමාට මන්ත්‍රී මණ්ඩලයේ ගරුත්වය ආරක්ෂා කරන්නට බලය තිබෙන බව හැබෑව. එහෙත් එපමණකින් සෑහීමට පත්වන්නට එපා ගරු සභාපතිතුමනි. කථානායකතුමා හැටියට ඔබතුමා ඉදිරිපත් වී කියන්න, "මේ මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරුන්ට විරුද්ධව මෙන්න මේ විධියේ චෝදනා මන්ත්‍රී මණ්ඩලය ඇතුළතදීත් ඉදිරිපත් වන්නෙ මෙන්න මේ වාගේ හේතුන් වගයක් නිසයි" කියා.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

මේ මන්ත්‍රී මණ්ඩලයට පත්ව එන හැම සාමාජිකයන්ගේම පෞද්ගලික ජීවිතයත්, සමාජ ජීවිතයත් පිළිබඳව හැම අස්සක් මුල්ලක් නෑර සොයා බලන්නට මහජනයාට අයිතියක් තිබෙනවා. මහජන ජීවිතයට එළඹෙන හැම කෙනෙකුම ඒ කාරණය අවිවාදයෙන් පිළිගෙන තමයි, මහජන ජීවිතයට එළඹෙන්නේ. එහෙම නැති අයත් ඇති. ඒ අය තමතමන් පෞද්ගලිකව ඒ තමන් පිළිගත් අදහස් ආරක්ෂා කර ගත්තාවේ. එහෙත් මා පෞද්ගලිකව කියා සිටින්නේ මහජන ජීවිතයට පා තබන හෙනෙකු තමන්ගේ ජීවිතයේ හැම අංශයකින්ම මහජනයාගෙන් පත් කරනු ලැබීමට කැමැත්තෙන් ඉදිරිපත් විය යුතු බවයි. ඒ නිසා මන්ත්‍රිවරුන්ගේත්, මන්ත්‍රී මණ්ඩලයේත් ගරුත්වයේ ආරක්ෂකයා හැටියට මා ඔබතුමාගෙන් එක ඉල්ලීමක් කරනවා. මේ පාර්ලිමේන්තුවේ මේ අවසාන වාරයේදී මා මේ ඉල්ලීම කරන්නේ මේ නිසයි. ලබන වාරයේදී "ඔබතුමාත් මාත් මෙහි හිටියිද කියන්නට බැහැ. අනාගතය ගැන එබඳු අස්පිරි තත්ත්වයක් තිබෙන නිසා අපි විනිමානය දිහා විතරක් බලා ක්‍රියා කරමු. අපෙන් පසුව එන අයටවත් මේ වගේ චෝදනා නොඑන විධියට, මා කලින් සඳහන් කළ අන්දමට මේ මන්ත්‍රී මණ්ඩලයට නරක විධියේ නම් ඉදිරිපත් කර, නැවතත් ඒවා ඉල්ලා අස්කර ගන්නට සිදුවන අවස්ථා නොඑළඹෙන විධියට අපි නීති පනවා තබමු. තේ පානයෙන් පසුව ඒ පිළිබඳව මා යෝජනා කරන කරුණු සවිස්තරව ඔබතුමාට ඉදිරිපත් කරන්නම්.

අ. භා. 4

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

The Sitting is suspended till 4.30 p.m.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு இடை நிறுத்தப்பட்டு, மீண்டும் பி. ப. 4 30 மணிக்கு ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 4.30 P.M. and then resumed.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේත්, පාර්ලිමේන්තුවේත් ගෞරවය ආරක්ෂා කිරීම සඳහා ඔබතුමාගේ අනුග්‍රහය ඇතුව ගත යුතු පියවරක් ගැනයි මා රැස්වීම අත්සිටුවීමට පළමුව සඳහන් කරමින් සිටියේ. මෙම පරමාර්ථය කොතරම් උසස් කොට වර්තමාන ආණ්ඩුව පිළිගෙන තිබුණාද කියතොත්, මෙම ආණ්ඩුව බලයට පත් වීමට පෙර පසුගිය මහා මැතිවරණයේදී, මහජනතාවට දුන් පොරොන්දුවලින් එකක් තමයි මෙය. මම ඒ කොටස දැන් කියවන්නම්:

"රජයේ සහ පොදු අංශ හැම එකකින්ම අල්ලස් හා දූෂණ අතුගා දැමීමට විශේෂ කොමිසමක් පත් කිරීමට එක්සත් ජාතික පක්ෂය පොරොන්දු වෙයි. අපේ මහජන මන්ත්‍රීවරුන් ඔවුන්ගේ වත්කම් සහ ආදායම් මාර්ග අවුරුදු පතා හෙළි කරනු ඇත. උසස් පෙළේ රජයේ සේවකයකු හෝ වේවා දේශපාලනඥයකු හෝ වේවා අල්ලස් දූෂණ චෝදනාවකට වරදකාරයකු වුවහොත් ඔහුට කිසිම සමාවක් හෝ ආරක්ෂාවක් එක්සත් ජාතික පක්ෂයෙන් නොලැබෙනු ඇත."

ඇත්ත වශයෙන්ම මෙය හැම දෙනා විසින්ම අවිවාදයෙන්, ගෞරවයෙන් පිළිගත යුතු අදහස් මාලාවක්. පිළිගතයුතුවා පමණක් නොවෙයි, එසේ පිළිගනු ලැබූ නිසා තමයි මෙම ආණ්ඩුව බලයට පත් වුණේ, මෙයට අවුරුදු හතර හමාරකට පමණ පෙර. නමුත් මෙම ප්‍රතිඥාව මේ දක්වා ක්‍රියාවේ යෙදුවේ නැහැ. ක්‍රියාවේ යොදන බවට දැන් පොරොන්දුවක් දී තිබෙනවා. එසේ නම් හැකි තරම් ඉක්මනින් එම පොරොන්දුව ඉටු කරවාගැනීමට තමුන්නාන්සේගේ අනුග්‍රහය සහ සහයෝගය අපේක්ෂා කරනවා. ගරු සභාපතිතුමනි, එසේ වත්කම් හෙළි කිරීමේ දී එය මැති ඇමතිවරුන්ට පමණක් සීමා නොකොට මැති ඇමතිවරුන් හා සම්බන්ධ කම් තිබෙන අනිකුත් හැම දෙනාටමත් බල පැවැත්වෙන ආකාරයෙන් මෙම නීතිය ඉදිරිපත් කළ යුතු බවයි අපේ අදහස. ගිය සතියේදී අගමැතිතුමාගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් එතුමා පොරොන්දුවක් දී තිබෙනවා, මෙම පනත ඉදිරිපත් කරනවාය කියා. නමුත් කවදා ඉදිරිපත් කරනවාදැයි සඳහන් කර නැහැ. එහෙනම් කවදා ඉදිරිපත් කරන්න

Digitized by Noolaham Foundation. noolaham.org | aavanaham.org

බලාපොරොත්තු වෙනවාදැයි එතුමාට අද වත් කියන්න පුළුවන්ද? ගරු අගමැතිතුමා මෙම පනත කවදා ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවාද? මා මෙම ප්‍රශ්නයට පිළිතුරක් දැනගන්න කැමතියි.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

පනත් කෙටුම්පත දැනට සකස් කර ගෙන යනවා.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

බොහොම සන්තෝෂයි, දැනට සකස් කර ගෙන යන බව එතුමාගෙන් දැනගන්න ලැබීම ගැන. අප බලාපොරොත්තු වෙනවා, හැකිතරම් ඉක්මනට ගරු සභාවට ඉදිරිපත් කරනවා ඇත කියා. ඒ අතරම සඳහන් කරන්න කැමතියි, මා විසින් සකස් කළ පනතක් තිබෙන බව. ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේගේ මාර්ගයෙන් එම පනත මා සභාගත කරන අතරම එයින් ඉදිරිපත් කර ඇති අදහස් ගැන සලකා බලා, ගරු අගමැතිතුමා විසින් ඉදිරිපත් කරන්න යන පනතට එම අදහස් ඇතුළත් කරන්නට පුළුවන්දැයි දැනගන්න කැමතියි. ගරු සභාපතිතුමනි, මෙම පනත ලබන සතියේදී ඉදිරිපත් කිරීමට තමුන්නාන්සේගෙන් මා අවසර ඉල්ලුවා. සමහර විට මා ඉදිරිපත් කරන්න යන ඒ පනතට වඩා අංග සම්පූර්ණ පනතක් ගරු අගමැතිතුමා——

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

මන්ත්‍රීතුමා පනතක් ඉදිරිපත් කරන්න යනවා? කොහොමද? That will be anticipation.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ඇන්ටිසිපේෂන් එකක් නොවෙයි, එක් සත් ජාතික පක්ෂයේ සමහර ගරු මන්ත්‍රීතුමන්ලා——

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

As a matter of fact, I did not want to interrupt the hon. Member because we are discussing the Votes of the House of Representatives and it might be thought that I am interested. With regard to what the hon. Member has in mind, it cannot be discussed now; it can only be discussed on a substantive Motion of a Member or when the Hon. Prime Minister introduces his proposals in the form of a Bill.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

දැනට යෝජනාවක් ඉදිරිපත් කර නැහැ, පනතක් ඉදිරිපත් කරලාත් නැහැ. නමුත් ගරු අගමැතිතුමා සඳහන් කළා, මා ඉදිරිපත් කරන අදහස් සලකා බලා, වටිනවා නම් පනතට ඇතුළත් කරනවාය කියා. එම නිසා ගරු අගමැතිතුමාගේ දැනගැනීම පිණිස මා විසින් සකස් කර ඇති පනත් කෙටුම්පත තමුන්නාන්සේගේ මාර්ගයෙන් ඉදිරිපත් කරන්න කැමතියි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ඉදිරිපත් කිරීමේ මාර්ගයක් තිබෙනවා.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

නීත්‍යානුකූල මාර්ගයක් තිබෙනවා තමයි. නමුත් මේ පැත්තේ සිටින මට ගරු අගමැතිතුමාට හෝ තමුන්නාසේට පනත් කෙටුම්පතේ පිටපතක් දෙන්නට බැරි මන්ද? මෙවැනි දේවලට හරස් කපන්නට එපා, ගරු රාජ්‍ය ඇමතිතුමනි. මොකද බැරි? මේ කාර්යාල කාර්ය සහායකයෙකුට බැරිද ගරු අගමැතිතුමාගේ අතට මේ පනත භාර දෙන්නට? ඇයි නිකම් හරස් කපන්නෙ?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ඔක පනතක් නොවෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

පනත් කෙටුම්පතක් නොවෙයි, අදහස් මාලාවක් හැටියටයි ඉදිරිපත් කරන්නෙ. එතකොට ස්ථාවර නියෝගවලට කොහෙත්ම බල පාන්නේ නැහැ. ගරු සභාපතිතුමාගේ අනුග්‍රහය ඇතිව මෙය අගමැතිතුමාගේ අතට පත් කරන මෙන් මා ඉල්ලා සිටිනවා. ඔබතුමාගේ මාර්ගයෙන් මෙය සභාගත වන පරිදි මා ඔබතුමාටත් පිටපතක් එවනවා. ගරු සභාපතිතුමාත් භාර ගත්තා. ගරු අගමැතිතුමාත් භාර ගත්තා. කිසිම අසභ්‍ය දෙයක් මෙහි නැති බව මා ඔබතුමාට පෞද්ගලික වශයෙන් කියන්නට සතුටුයි. එම නිසා ඔය පනත තිබෙන විධියටම මා ඉදිරිපත් කළ අදහස් මාලාවක් හැටියට කරුණා කර වාර්තාගත කරන්න.

ගරු සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පතේ මුඛ්‍යාර්ථය වශයෙන් පරමාර්ථය වශයෙන් මා ඉදිරිපත් කරන්නේ මෙන්න මේ අදහස් ස්වල්පයයි. ගරු මන්ත්‍රීවරුන්ට පමණක් වත්කම් හෙළි කරන්නටය කියා නීතියෙන් බල කරන්නට එපා. ගරු මන්ත්‍රීවරුන්ට පමණක් මේක සීමා කරන්නට එපා. මන්ත්‍රීවරයා හා සම්බන්ධ මුළු ඥාති වර්ගයාටම එය බල පවත්වන්නට ඕනෑ. ගරු අගමැතිතුමා ඔළුව වනමින් එය අනුමත කිරීම ගැන මා බොහොම සතුටුයි. රාජ්‍ය ඇමතිතුමා නම් නිකම් බලා ගෙන ඉන්නවා.

ගරු සභාපතිතුමනි, අප නීති පැනවිය යුත්තේ මේ රටේ සමාජයට ගැළපෙන හැටියටයි. එංගලන්තයේ මෙවැනි නීතියක් නැහැ. අප්‍රිකාවේ, ඕස්ට්‍රේලියාවේ, කැනඩාවේ මෙවැනි නීතියක් නැහැ. ජාත්‍යන්තර නීති අනුව නොගැළපෙන වාය, මන්ත්‍රීවරුන්ගේ සහෝදරයාටත් නැත්නම් මස්සිනාටත් වත්කම් හෙළි කරන්නය කියා නීතියෙන් බල කිරීම වටින්නේ නැත කියා ඇඟ බේරා ගන්නට උත්සාහ කරන්නට එපා. මේ රටේ සමාජ තත්ත්වය අනුව, මේ රටේ සමාජ ඉතිහාසය අනුව පවුල් සම්බන්ධකම් අනුව දේපොල වත්කම් හරි හම්බ කරන බව අප කවුරුත් දන්නවා. මා ඒවා ගැන දිගින් දිගට කථා කරන්නට අදහස් කරන්නේ නැහැ. නමුත් මගේ තර්කය සනාථ කිරීමට එක කාරණයක් පමණක් ඉදිරිපත් කරනවා. ගරු ඇමතිතුමන්ලාගේ පෞද්ගලික ලේකම්වරුන්, හැටියට ඥාතීන්, සහෝදරවරුන්, දූවරුන් හා බෑණාවරුන් කී දෙනෙකු කටයුතු කරනවාද? විශ්වාසකමට කී දෙනෙකු කටයුතු කරනවාද? එසේ නම් මන්ත්‍රීවරුන්ට පමණක් වත්කම් හෙළිදරව් කරන්නටය කියා බල කිරීමෙන් ඇති ඵලය කුමක්ද? අද එවැනි තත්ත්වයක් තිබෙනවා නම්, වත්කම් හෙළි කිරීම මන්ත්‍රීවරුන්ට පමණක් සීමා කිරීම වැරදියි. තවත් කාරණයක් තිබෙනවා. මා මේ පනතින් අදහස් කළේ මන්ත්‍රීවරුන්ගේ හතර වර්ගයාම මේ පනතට අල්ලා ගැනීම පමණක් නොවෙයි. දැනට අප අවුරුදුපහක් ආදායම් බදු දෙපාතී මේන්තුවට ප්‍රකාශ ඉදිරිපත් කරනවා. නමුත් ඒවා රහසිගත ප්‍රකාශයි. ඒවා මහජනතාවට දැනගන්නට බැහැ. මා යෝජනා කර තිබෙන මේ පනතින් මන්ත්‍රීවරුන්ගේ වත්කම පිළිබඳව කරන ප්‍රකාශ සාක්ෂි ආඥා පනතේ ඒ වගන්තිය අනුව පොදු ප්‍රකාශයක් බවට පත් වෙනවා. එතකොට මේ ප්‍රකාශන ගැන ඕනෑම කෙනෙකුට දැනගන්නට පුළුවනි. පිරිසිදු මහජන ජීවිතයක් අනුමත කරන පාර්ලිමේන්තුවක් විසින් නීති පැනවිය යුත්තේ අන්න ඒ ආකාරයටයි.

ගරු සභාපතිතුමනි, මේ වත්කම් හෙළි කිරීමේ නීතිය පිළිබඳව ප්‍රවෘත්ති පත්‍ර සමහරක් එක්තරා විධියක ව්‍යාපාරයක් පටන් ගෙන තිබෙනවා. අද "ටයිම්ස් ඔf ජ සිලෝන්" පත්‍රයෙන්—මොන හේතුවක් නිසාද කියා මා දන්නේ නැහැ—විරුද්ධ පක්ෂයට මඩ ගැසීමේ උත්සාහයක් කර තිබෙනවා. "'Bare assets' bid : Reds shy ?" යනුවෙන් මේ පත්‍රයේ පළ කර තිබෙනවා. වත්කම් හෙළි කිරීම පිළිබඳව වාමාංශිකයන් ලජ්ජා වෙයිද, බයේ අයින් වෙන්නට සිද්ධ වෙයිද, යන අදහස මෙහි දැක්වෙනවා. විරුද්ධ පක්ෂයේ සෑම දෙනෙකු වෙනුවෙන්ම කථා කරන්නට මට අයිතියක් නැහැ. නමුත් විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් කීප දෙනෙකු වෙනුවෙන් අප කිසිම කෙනෙකු මේකට බයේ පැනල දුවන්නෙ නැති බව කෙලින්ම ප්‍රකාශ කරන්නට පුළුවනි. මේ පත්‍රය උත්සාහ කරන්නේ මොකකටද? "ටයිම්ස්"

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

පත්‍රයේ ප්‍රධාන මහත්මයාට එළිදරව් කරන්නට බැරි දෙයක් ඇති. [බාධා කිරීමක්]

ඩොනල්ඩ් ජේ. රණවීර මයා. (නුවර එළිය)

(திரு. டொனல்ட் ஜே. ரணவீர—நுவரெலிய)

(Mr. Donald J. Ranaweera—Nuwara Eliya)

ඔකට මගේ සම්බන්ධකමක් නැහැ.

ප්‍රින්ස් ගුණසේකර මයා.

(திரு. பிறின்ஸ் குணசேக்கர)

(Mr. Prins Gunasekera)

එසේනම් කරුණාකර කියන්න, මේ විධියේ වාර්තා පළ කරන්න එපාය කියා. ගරු සභාපතිතුමනි, පොදු ජන ජීවිතයේදී පොදු ජන නායකයන් කොයි තරම් පිරිසුදු විධියට ජීවත් වන්නට ඕනෑද කියන කාරණය සම්බන්ධයෙන් අපේ ඇස් ඇරෙන්නට ඕනෑ, මේ දිනවල ඇමෙරිකාවේ සිදු වන එක්තරා සිද්ධියක් නිසා. ජනාධිපති කම බලාපොරොත්තුවෙන් සිටි—හිටපු ජනාධිපතිතුමාගේ සහෝදරයා වූ—එඩ්වඩ් කෙනඩි මහත්මයා සම්බන්ධ වූ එක්තරා කණගාටුදායක මාරාන්තික සිද්ධියක් නිසා ඒ මහත්මයාගේ පෞද්ගලික දේශපාලන ජීවිතය සම්පූර්ණයෙන්ම නැති වී ගොස් තිබෙනවා. මා හිතන පිළිවෙලට අලි දමාවත්, නැව් දමාවත්, රොකට් දමාවත් ඒ වළෙන් නැවත ඔහු ගොඩ ගන්නට බැහැ. ඇමෙරිකාවේ සිදු වන බොහෝම දේ ගැන අප මෙහිදී දොස් කියනවා. එහෙත් ඒ දේශපාලනඥයන්ගේ චරිත පාරිශුද්ධිය ගැන අප ආඩම්බර වන්නට ඕනෑ. පෞද්ගලික ජීවිතය පිළිබඳ ප්‍රශ්නයක් ගැනයි, සැකය ඇති වී තිබෙන්නේ. ඒ නිසා දේශපාලන නායකයකුගේ සම්පූර්ණ දේශපාලන අනාගතය නැති වී තිබෙනවා.

එස්. ද එස්. ජයසිංහ මයා. (කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. எஸ். டி. எஸ். ஜயசிங்ஹ—தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. S. de S. Jayasingha—Parliamentary Secretary to the Minister of Labour, Employment and Housing)

හැමෝගෙම චරිත සම්බන්ධව සොයා බැලීමත් මේ පනතට ඇතුළත් වෙන්නේද?

ප්‍රින්ස් ගුණසේකර මයා.

(திரு. பிறின்ஸ் குணசேக்கர)

(Mr. Prins Gunasekera)

පෞද්ගලික දේ පළ පිළිබඳව.

ජෝර්ජ් කොතලාවල මයා.

(திரு. ஜோஜ் கொத்தலாவல)

(Mr. George Kotelawala)

නියම නැදෑයන්ගෙද, අනියම් නැදෑයන්ගෙද?

ප්‍රින්ස් ගුණසේකර මයා.

(திரு. பிறின்ஸ் குணசேக்கர)

(Mr. Prins Gunasekera)

තමන්ගේ පැත්තේ සිටින මන්ත්‍රීවරුන් ගැන හරියට දන්න උසාවියේ මන්ත්‍රීතුමා අහනවා, නියම නැදෑයන්ගෙන්ද, අනියම් නැදෑයන්ගෙන්ද කියා. තමන්ගේ පැත්තේ සිටින මන්ත්‍රීවරුන්ට අනියම් සම්බන්ධකම් තිබෙන අය කොපමණ ඉන්නවාද යන්න එතුමා දන්නවා. මා ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පතේ උප ලේඛනයට අනියම් ඥතීනුත් ඇතුළත් කරන්නට මාර්ගයක් තිබෙනවා නම් ඒ අයත් ඇතුළු කරන්නට මම සූදානම්. පොදු ජන ජීවිතය පිරිසුදු කිරීම සම්බන්ධයෙන් පසුගිය අගෝස්තු මස 22 වැනිදා නිකුත් වූ "ටයිම්ස්" සඟරාවේ විශේෂ වැකියක් තිබෙනවා. මේ කාරණයට අදාළ වාක්‍ය දෙකක් පමණක් මම කියවන්නම්.

"PUBLIC FIGURES AND THEIR PRIVATE LIVES

The public's curiosity is insatiable, and often for good reason. If a politician behaves badly in private matters. he might act the same way in his public duties. That, at any rate, is the theory that has always linked scandal and history, low gossip and high statesmanship."

යම්කිසි දේශපාලනඥයකු තමන්ගේ පෞද්ගලික ජීවිතයේදී නරක විධියට හැසිරෙනවා නම් පොදු ජන ජීවිතයේදීත් ඒ විධියටම නරකට හැසිරෙන්නට ඉඩ තිබෙනවාය කියන විශ්වාසයක් මිනිසුන් තුළ තිබෙනවා. ඒ නිසයි, මහජනයා පොදු ජන ජීවිතයේදී, දේශපාලන නායකයන්ගේ චරිත පාරිශුද්ධිය ගැන බොහෝ විට විපරම් කර බලන්නේ; එවැනි වැරදි එළිදරව් වූ විට කිසිම සමාවක් නොදෙන්නේ. මේ ලිපියේ තවත් තැනක මෙහෙම තියෙනවා:

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

"Empires have been shaken and governments have fallen because of the private indiscretion".

නොයෙකුත් දේශපාලනඥයන්ගේ පෞද්ගලික නොසැලකිලිකම් නිසා අධිරාජ්‍ය විනාශ වී ගොස් තිබෙනවා; ආණ්ඩු බිඳ වැටී තිබෙනවා. මේ ආණ්ඩුව බිඳ වැටෙන්නට යන්නේ කාගේ කාගේ නොසැලකිලිකම් නිසාද, කාගේ නොහොබිනා කම් නිසාද කියා මා දන්නේ නැහැ. තම තමන්ගේ අතින් සිදු වන වැරදි තම තමන් දන්නවා ඇති. මහජනයා කසුකුසු ගාන විට, බස්වල, ටැක්සි කාර්වල යන මහජනයා කියන දේ ඇසෙන විට ඒ ගැන අවබෝධයක් ඇති කර ගන්නට පුළුවන්. මේ කෙටුම්පත් පනතට ඇතුළත් කර තිබෙන අදහස් ගරු අගමැතිතුමා හැකි තරම් දුරට පිළිගෙන පොදු ජන ජීවිතය පිරිසිදු කිරීම සඳහා අංගසම්පූර්ණ නීතියක් ඉදිරිපත් කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

අ. භා. 4.45

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අභ්‍යන්තර කාරණා කිහිපයක් ගැන ඔබතුමාගේ සැලකිල්ල යොමු කරන්නට ඊළඟට බලාපොරොත්තු වෙනවා. මා කථා කරන්නට පටන් ගත් අවස්ථාවේත් සඳහන් කළ පරිදි මෙය මේ පාර්ලිමේන්තුවේ අවසාන අයවැය විවාදයයි. පාර්ලිමේන්තුව ගැන හොඳ වචනයක් කී මන්ත්‍රීවරයකු හැටියට මගේ නම සඳහන් වන්නේ නැහැ. පසුගිය අවුරුදු හතරහමාර තුළ ඉදිරිපත් කරන ලද අයවැය විවාදවලදී මවිසින් කියන්නට යෙදුණේ පාර්ලිමේන්තුව පිළිබඳව හොඳ දේ නොවෙයි. යල් පැනපු පාර්ලිමේන්තු යන්ත්‍රානුසාරයෙන් අපේ සමාජයේ තිබෙන අඩුපාඩුකම් හැදෙන මගක් සොයා ගන්නට බැහැ. අප මුහුණ පා සිටින ප්‍රශ්නවලට පිළිතුරු ලබා ගන්නට මේ පාර්ලිමේන්තු ක්‍රමය යටතේ පුළුවන්කමක් නැහැ. මේ කතාව මීට පෙර කී වතාවක් මා කියා තිබෙනවාද? නැවත නැවතත් ඒ ගැනම කියන්නට සිදු වීම කනගාටුදායක දෙයක්. එකම තැන කර කැවෙන පාර්ලිමේන්තු සෙක්කුව උපයෝගි කරගෙන එකම සුළු ප්‍රශ්නයක්වත් සාර්ථක ලෙස විසඳා ගන්නට පුළුවන් වෙලා නැහැ. එකම සුළු ප්‍රශ්නයකටවත් සතුටුදායක පිළිතුරක් ලබා ගන්නට ගතවූ අවුරුදු පහ තිස්සේම බැරි වූ නිසයි, එක තැන කරකැවෙන සෙක්කුවකටත් වඩා මෙය නරකයයි මා කියන්නේ. මේ සෙක්කුවෙන් තෙල් පෙරා ගන්නා පස්වැනි පොල් වඩියයි මේ. මේ සෙක්කුවෙන් පෙරෙන්නේ පුස්කාපු තෙල් වගයක් පමණයි. පිරිසිදු තෙල් සාදා ගැනීමට, පිරිසිදු සමාජ ක්‍රමයක් කරා ගමන් කිරීමට, මේ සෙක්කුව ප්‍රයෝජනවත් ලෙස උපයෝගි කර ගන්නට බැහැ.

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ පාලනය යටතේ පවත්නා මේ යන්ත්‍රය තුළ කෙරෙන දේ බලන්න. පසුගිය අවුරුදු හතරහමාර තුළ ඔබතුමාට කී වතාවක් අපේ පැමිණිලි ඉදිරිපත් කර තිබෙනවාද? සුළු වරප්‍රසාද සහ අසිතිවාසිකම් ගැන පවතින කනගාටුදායක තත්ත්වය හරිගස්සා ගන්නට අපට පුළුවන් වී තිබෙනවාද? මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) ටිකට් එකක් ගැන සඳහන් කළා. සුද්දන්ගේ කාලයේ මන්ත්‍රීවරයකු සමග සපත්තු උස්සන් යන්න කෙනකුට ටිකට් එකක් දුන්නා. එංගලන්තයේ ඒ ක්‍රමයම තව දුරටත් පවත්වාගෙන යනවා. ඒ සම්බන්ධයෙනුත් අපට සතුටුදායක විසඳුමක් ලබා ගන්නට මේ මුළු පාර්ලිමේන්තු වාරයේදී හතර වතාවක්ම කියා සිටි නමුත් තවමත් සතුටුදායක විසඳුමක් ලබාගන්නට පුළුවන් වුණාද? අපේ පැමිණිලි සම්බන්ධයෙන් සතුටුදායක විසඳුමක් තවමත් ලැබී නැහැ.

දුම්රිය දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන ටිකට් වැනි ටිකට් පත් නොවෙයි ලංකා ගමනාගමන මණ්ඩලයෙන් නිකුත් කරනු ලබන්නේ. මන්ත්‍රීවරයාට දෙන ටිකට් පත පමණයි ලංකා ගමනාගමන මණ්ඩලයෙන් ලැබෙන්නේ. දුම්රිය සේවයක් නැති මැතිවරණ කොට්ඨාශ කීයක් ලංකාවේ තිබෙනවාද? දුම්රිය සේවයක් තිබෙන ආසනවලත් වැඩිම වුණොත් සැතපුම් දහයක් පහළොවක් පමණයි දුම්රියෙන් සේවයක් ලැබෙන්නේ. ඉතිරි හරිය ගමන් කරන්නට සිදු වන්නේ බස් රියෙනුයි. වැඩිපුරම ගමන් කරන්නට තිබෙන්නේ ලංගම බස්වලයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එහෙත් මන්ත්‍රීවරුන්ට දෙන්නේ එකම එක බස් ටිකට්ටුවක් පමණයි. එකකින් පුළුවන්ද මුළු ආසනයේම තිබෙන වැඩ කටයුතු ටික බලාගන්නට? මන්ත්‍රීවරයා සමඟ ගමන් කරන ලියන මහත්මයාටවත් බල පත්‍රයක් දෙන්නට ඕනෑ නේද? මන්ත්‍රීවරයාට බස්වලින් ගමන් කරන්නට බැරි තැන්වලට යන්නට කාර් දෙන්නැයි මන්ත්‍රීතුමන්ලා ඉල්ලුවා. ඒ ඉල්ලීම මාත් අනුමත කරනවා. මන්ත්‍රීවරුන්ගේ පඩි වැඩි කිරීමට යෝජනාවක් ඇති වුණා. අප ඊට විරුද්ධ වුණේ අපේ පඩිය පමණක් වැඩි කිරීම යුක්තිසහගත නොවේයයි අප කල්පනා කළ නිසයි. හැන්ද අතේ තිබෙන නිසාම මන්ත්‍රීවරුන් තමන්ගේ පඩිය වැඩි කර ගත්තාය යන චෝදනාවට අහු වන්නට කාටවත් වුවමනාවක් නැහැ. ඒ නිසා ලබන මහා මැතිවරණයෙන් පසු තේරී එන මන්ත්‍රීවරුන්ගේ පඩිය වැඩි කරන්නට තීරණය කළ හැකියි. එසේ කළොත්, හැන්ද අතේ තිබුණු නිසා අපේ පඩිය අපිම වැඩි කර ගත්තා කියා චෝදනා කරන්නට බැහැ. මේ ආණ්ඩුව ඉවර වන්නට ඉස්සර වෙලා කරුණා කර ලබන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ පඩිය සෑහෙන ගණනකින් වැඩි කරන්නැයි කියනවා.

අද මන්ත්‍රීවරුන්ට ලැබෙන දීමනාවෙන් විශාල ප්‍රමාණයක් ගමන් බිමන් සඳහා ටැක්සි වෙනුවෙන් වැය කරන්නට සිදු වෙනවා. ඔබතුමා ගරු මන්ත්‍රීන් වෙනුවෙන් කොයි තරම් දුරට උනන්දු වෙලා මේ කාරණය ආණ්ඩුවට ඉදිරිපත් කර තිබෙනවාදැයි මම දන්නේ නැහැ. ගරු කථානායකතුමාට නම් නිල කාර් රථයක් ලැබී තිබෙනවා. එය තමන්ගේ ආසනයේ වැඩ කටයුතු කිරීමටත් යොදා ගන්නට පුළුවනි. එහෙත් එවැනි නිල කාර් රථ අපට දෙන්නැයි මම කියනවා නොවෙයි. මන්ත්‍රීවරුන් වශයෙන් අප සේවය කරන විට අපට නොයෙක් නොයෙක් අන්දමේ ගමන් බිමන් යන්නට සිදු වන බව තමුන්නාන්සේ දන්නවා. මන්ත්‍රී මණ්ඩලයට ආවාසින් පස්සේ පවා අපට හදිසි දේට සහභාගී වන්නට සිදු වෙනවා. ඒ හැම ගමනක්ම අපට දුම්රියෙන් යන්නට බැහැ. ඒ වාගේම බස් රියෙන් වුවත් යන්නට බැරි ගමන් ඇති වෙනවා. මා නියෝජනය කරන හබරාදුව ප්‍රදේශයේ හදිසි මරණයකට සහභාගි වන්නට සිදු වුණා, ඊයේ. දවල් 2 ට මේ ගරු සභාවේ සාකච්ඡාවට සහභාගි වන්නට තිබුණා. ඒ නිසා උදේ වුණත් හිහින් ආපසු එන්න පුළුවන් කමක් නැහැ. එහෙත් කෙසේ හෝ අව මංගල්‍යයට සහභාගි විය යුතුයි. එම නිසා මට සිදු වුණා, ප්‍රවාහණ ඇමතිතුමාගේ ආඛාරය ඇතිව ලබා ගත් 5 ශ්‍රී "වෝක්ස් වැගන්" රථයකට රුපියල් 70 ක් ගෙවා පැය 5ක් තුළ සැතැපුම් 74ක් ගොස් ආපසු එන්නට. මාසයකට කී වරක් මෙසේ කුලී රථවලට ගෙවන්නට මහජන මන්ත්‍රීවරුන්ට පුළුවන්කමක් තිබෙනවාද? පසුගිය මාස කීපය තුළ නැති වුණත්, මට නම් වෙනත් ආදායම් මාර්ගයක්වත් තිබෙනවා. එම නිසා මගේ දීමනා වැඩි කරන්නට කියනවා යයි හිතන්න එපා. මන්ත්‍රීවරයකු විසින් ඉටු කළ යුතු යුතුකම් රාශියක් තිබෙනවා. එහෙත් එවැන්නක් වෙනුවෙන් විදුලි පණිවුඩයක්වත් යැවීමේ අයිතියක් මන්ත්‍රීවරයකුට තිබෙනවාද? සභාපතිතුමනි, මන්ත්‍රීවරුන්ට විදුලි පණිවුඩ යැවීමේ අයිතිය දෙන්නැයි තැපැල්පතිවරයා කැඳවා කථානායකතුමා වශයෙන් ඔබතුමා කී වරක් නියෝග කර තිබෙනවාද? ඒ නියෝගය අදවත් ක්‍රියාත්මක වෙනවාද? ඔබතුමා කථානායකතුමා වශයෙන් මේ පාර්ලිමේන්තු වාරය තුළ කට යුතු කරන අවසාන සැසි වාරය මෙයයි. එහෙත් තම ප්‍රදේශයේ පුරවැසියකුගේ මරණය වෙනුවෙන් කණගාටුව පළ කොට විදුලි පණිවුඩයක් යැවීමේ අයිතියවත් මන්ත්‍රීවරයකුට ලබා දීමට ඔබතුමාට තවමත් පුළුවන් වුණේ නැහැ. මෙන්න, පසුගිය සතියේදී තැපැල්පතිවරයාගෙන් මට ලැබුණු ලිපියක්:

"පාර්ලිමේන්තු සභ උත්තර මන්ත්‍රීවරුන් විසින් යවන ලද රාජ්‍ය සේවා විදුලි පුවත්"

2. ඉහත දක්වන ලද අංක 1 ට සම්බන්ධිත වූ හෝ අංක 2 සහ 3 ට සම්බන්ධිත වූ සියලුම විදුලි පණිවුඩයන් හි ශාස්තුව අදාළ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා හෝ උත්තර මන්ත්‍රීතුමා විසින් ගෙවිය යුතු බව තීරණය කර ඇත....."

ඉහත සඳහන් ලිපියට අදාළ විදුලි පණිවුඩ දෙක යැවූයේ ශෝකය පළ කිරීමක් වශයෙන් මරණ දෙකක් වෙනුවෙනුයි. මා ඒවා යැවූයේ පෞද්ගලික හිතමිතුරුකම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

හෝ දේශපාලන සම්බන්ධකම් සලකා බලා නොවෙයි. පළාතේ මන්ත්‍රීවරයා වශයෙන් මට ඒ මරණ පිළිබඳව දැනුම් දීම යුතුකම කැයි ඔවුන් හිතන්න ඇති. මට ඒ අව මංගල්‍යවලට සහභාගි වන්නට බැරි වුණේ, පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගි වීම සඳහා කොළඹ සිටින්නට සිදු වූ නිසා වන්නට ඇති. එම නිසා මා කොළඹ සිට මගේ ශෝකය පළ කොට විදුලි පණිවුඩ යවා තිබෙනවා. මෙන්න, මා යැවූ විදුලි පණිවුඩ:

"ඒ. ඩබ්ලිව්. ලයනල්,
උපස්ථාපති,
කිත්තගල්ල,
අහංගම.

පවුලේ දුක්මුසු මොහොතේදී අපගේ ශෝකය පිළිගත මැනවි.

මහජන මන්ත්‍රී ප්‍රින්ස් ගුණසේකර,"

මෙන්න, අනෙක් විදුලි පණිවුඩය:
"මහින්ද අබේදීර,
ගොයියාපාන,
අහංගම.

පියාණන්දාගේ අභාවය ගැන බලවත් ශෝකය පිළිගත මැනවි.

මහජන මන්ත්‍රී ප්‍රින්ස් ගුණසේකර."

මේ විදුලි පණිවුඩ දෙක වෙනුවෙන් මා අතින් මුදල් ගෙවිය යුතු බවයි, අර ලිපියෙන් දන්වා තිබෙන්නේ. ඉහත සඳහන් විදුලි පණිවුඩ දෙක මා යැව්වේ ලයනල් හා අබේදීර යන මහතුන් සමඟ මගේ ඇති පෞද්ගලික සම්බන්ධකමක් නිසා නොවෙයි. මහජන මන්ත්‍රීවරයා වශයෙන් ඒ මරණ පිළිබඳව ඔවුන් මට දැන්නුවාම ඒ අවමංගල්‍ය උත්සවවලට සහභාගි වීම, එහෙම නැත්නම් ශෝකය පළ කිරීම මගේ යුතුකමක්. එය මහජන මන්ත්‍රීවරුන් වශයෙන් අප වෙත පැවරී තිබෙන එක්තරා යුතුකමක් නොවෙයිද? එහෙත් ඒ අයිතියවත් මේ පාර්ලිමේන්තු සෙක්කුවේ නැහැ. පසුගිය අවුරුදු $4\frac{1}{2}$ තුළවත් එය හරිගස්සන්නට බැරි වී තිබෙනවා. තමුන්නාන්සේ කථානායකතුමා වශයෙන් නියෝග කර තිබෙන නමුත්, තැපැල්පති වරයා තවමත් ඒ අයිතිය අපට ලබා දී නැහැ.

විදුලි පණිවුඩ පිළිබඳ තත්ත්වයට දෙවැනි නැහැ, ටෙලිෆෝන් පිළිබඳ තත්ත්වය. තම ගෙදර ඇති පෞද්ගලික ටෙලිෆෝනයෙන් රාජකාරී හදිසි පණිවුඩයක් ගන්නට මන්ත්‍රීවරයකුට තවමත් පුළුවන්කමක් ලැබී නැහැ. ඒ පණිවුඩය රාජකාරියට සම්බන්ධ එකක් වුණත්, තැපැල් කන්තෝරුව අහනවා, එය ලබා ගන්නේ රාජකාරී ටෙලිෆෝනයෙන්ද කියා. මන්ත්‍රීවරයකුට දෙන්නේ එක රාජකාරී ටෙලිෆෝනයයි. සමහර මන්ත්‍රීවරුන් ඒ රාජකාරී ටෙලිෆෝනය කොළඹ සවි කරගෙන තිබෙනවා; තවත් සමහර මන්ත්‍රීවරුන් තම ඡන්දදායක කොට්ඨාශයේ සවි කරගෙන තිබෙනවා. එහෙත් තමන් අතින් මුදල් ගෙවන ටෙලිෆෝනය වුණත් රාජකාරී පණිවුඩ සඳහා යොදා ගන්නට බැහැ. මේ ගැන පසුගිය අවුරුදු $4\frac{1}{2}$ තුළම කථානායකතුමාට දන්වා ඇතත්, එය හරිගස්සා ගන්නට තවමත් බැරි වී තිබෙනවා. මෙවැනි ඉතා සුළු දෙයක්වත් පාර්ලිමේන්තු ආයතනයෙන් කර ගන්නට බැරි නම්, මේ රටේ පොදු ජන ප්‍රශ්න විසඳන්නට මේ ආයතනයට පුළුවන් යයි මහජනතාව විශ්වාස කරයිද? මහජනයා එවැනි විශ්වාසයක් තබාවි යයි මා නම් හිතන්නේ නැහැ. අයවැය විවාදයේදීත්, තවත් බොහෝ අවස්ථාවලත් රාජ්‍ය ඇමතිතුමා කියා තිබෙනවා, යම් යම් දේවල් සඳහා, මහජන මුදල් වියදම් කිරීම් සම්බන්ධයෙන් විරුද්ධ පාර්ශ්වයේ සහයෝගය දෙන්නය කියා. එවැනි නොයෙක් අදහස් ගෙනෙනවා. එහෙත් මේ ආයතනය එවැනි ප්‍රශ්න විසඳා ගැනීමට ප්‍රමාණවත් නොවන බව මේ නායකයන් කල්පනා කර තිබෙනවාද? පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඉතාම පොඩි ප්‍රශ්නයක්වත් කථානායකතුමා මාර්ගයෙන් විසඳා ගන්නට බැරි නම් මේ ආයතනයේ ඇති වටිනාකම මොකක්ද?

ගරු සභාපතිතුමනි, කථානායකතුමාට පාර්ලිමේන්තු සම්ප්‍රදායානුකූලව සැළකිය යුත්තේ ගරු ඇමතිවරයකුටත් ඉහලිනුයි. ගරු කථානායකතුමා දෙපාර්තමේන්තු නිලධාරීන් කැඳවා මෙවැනි කරුණු ගැන —විශෙෂයෙන් ටෙලිෆෝන් පණිවුඩ සහ විදුලි පුවත් ගැන—යම් යම් නියෝග නිකුත් කර තිබෙන බව අප දන්නවා. එහෙත් එම නියෝග එකකටවත් තුට්ටු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දෙකක හෝ සැලකිල්ලක් දක්වා නැහැ නේද? මේවා ගැන නිලධාරීන්ට දොස් තබා අසීන් වන්නට නරකයි. මෙය මෙම පාර්ලිමේන්තු සෙක්කුවේ තිබෙන වරදයි. කවුරුවත් මේකට සලකන්නේ නැහැ. රජයේ නිලධාරීන්වත් මහජනයාවත් මේකට සලකන්නේ නැහැ. මහජනයා මේ පාර්ලිමේන්තුවට එන සැම දෙනාටම—මට කනගාටුයි, මාත් මෙහි සාමාජිකයකු වී සිටීම ගැන—මේවා ගැන දොස් කියන්නේ ඇඟ බේරාගන්නට පුළුවන් වන විධියට නොවෙයි. වේගයෙන් වෙනස් වන්නට එක පයින් බලා සිටින මුළු සමාජය ටම එපා වෙච්ච සංස්ථාවක් හැටියට මෙය පත්ව තිබෙනවා. ඒක එතරම් හොඳ කරුණක් නොවෙයි.

අවුරුදු පතා මේ පාර්ලිමේන්තු ගොඩ නැගිල්ල අළුත්වැඩියා කරන්නට ඕනෑය කියා රුපියල් 10ක සංකේත වැය ශීර්ෂ යක් අයවැය ලේඛනයට ඇතුළත් වී තිබෙනවා. එහෙත් මේ පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ ඇති පහසුකම් මොනවා ද? මෙහි එන මන්ත්‍රීවරුන්ට ඇති පහසු කම් මොනවාද? ඊයේ පෙරේදා මෙහි කතා අහන්නට පැමිණි මා හඳුණන දෙන් නෙක් මට කිව්වා මෙහි කතා අහන්නට පැමිණෙන මිනිසුන්ට මෙතන නිලධාරීන් සලකන්නේ බොහොම නරක විධියටය කියා. මෙතන සිටින පොලිස් නිලධාරීන් ඔවුන්ට ඉතා නරක විධියට සලකන බවට පැමිණිල්ලක් කළා. ඒ උදවිය කිසිම කරුණාන්විත විධියකට හැසිරෙන්නේ නැතැයි කිව්වා. ඒක බොහොම නරකයි නේද? මෙතන කතා අහන්නට එන්නේ එක්තරා දේශපාලන උනන්දුවක් තිබෙන උදවියයි. ඒ උදවියට ඔය අන්ද මට සලකන්නට වටින්නේ නැහැ. ඒ ගැන විශේෂයෙන් පරීක්ෂා කර බලන ලෙස මා ඉල්ලා සිටිනවා. ගරු සභාපති තුමනි, මෙහි පැමිණෙන පොලිස් නිලධා රීන්ට විශෙෂ නියෝගයක් නිකුත් කරන්න ම ඕනෑ, අතිරේක කරුණාවක් දක්වන්න ටය කියා. කතා ඇසීම සඳහා මෙහි පැමිණෙන ශ්‍රාවක මහත්වරුන්ට අතිරේක කරුණාවක් දැක්විය යුතුයි.

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේ කථානායකතුමා හැටියට නොයෙක් වර දොස් කියනවා, මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්න වලට උත්තර දෙන වේලාවලදී මන්ත්‍රී වරුන් පාර්ලිමේන්තුවේ නොසිටීම ගැන. මා නමින් ඇති ප්‍රශ්න වගයක් පිළිබඳ වත් පසු ගිය සතියේ එවැනි අවස්ථා දෙකක් ඇති වුණා. මා එම චෝදනාවට වැරදිකාරයා වන්නට පුළුවන් නිසා මගේ නිදහසට අදාළ වන කරුණක් කියන්නට ඕනෑ. මෙම න්‍යාය පත්‍රයට මේ ප්‍රශ්න ඇතුළත් වන්නේ අපට කල් දීමක් ඇතුව නොවෙයි. එම ප්‍රශ්න න්‍යාය පත්‍ර යට ඇතුළත් වී තිබෙනවාදැයි අප දැන ගන්නේ එය අප අතට පත් වූ පසුයි. මෙම න්‍යාය පත්‍රය අපට කාලවේලාවට ලැබෙන්නේ නැහැ. මෙම කාරණය පිළි බඳව පසුගිය අවුරුදු ගණනාව තුළදීත් තමුන්නාන්සේට පැමිණිලි කර තිබෙන වා. පසුගිය සති දෙක ඇතුළතදී පාර්ලි මේන්තුව රැස් වුණේ උදේ 10 ටයි. මා සිටින තැනට මෙම න්‍යාය පත්‍රය ලැබෙන්නේ උදේ 11½ ත් පසුවෙලයි. ඉතින් කෙසේද තමන්ගේ ප්‍රශ්නවලට දෙන උත්තර ඇසීම පිණිස මන්ත්‍රීවරයෙක් රැස්වීම ආරම්භ වන වේලාවේදී පැමිණ සිටින්නේ. මේ මූලික පහසුකම ලබා දීමට තැපැල් දෙපාර්තමේන්තුව මෙහෙයවා ගන්නට පාර්ලිමේන්තුවට පුළුවන්කමක් තිබුණේ නැහැ. මෙවැනි සීමාසහිත වර ප්‍රසාද වලට මැදිවී මහජනයාගේ දොස් වලට ගොදුරු වී මෙම පාර්ලිමේන්තුවේ කටයුතු කරන්නට අපට සිදු වී තිබෙනවා. එම නිසා මහජන මන්ත්‍රීවරුන් ආරක්ෂා කර ගැනීමට තමුන්නාන්සේ විසින් ගතයුතු පියවර මේ දක්වා නොගෙන තිබීම ගැන මගේ කනගාටුව ප්‍රකාශ කර නවා.

ගරු සභාපතිතුමනි, මේ ආදී වශයෙන් එකින් එක කරුණු කියන්නට ගියොත් තව බොහෝ වේලා ගත වන්නට පුළුවනි. එම නිසා මෙම කරුණු විෂයෙහිලා වැඩි වේලාවක් ගත කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. තවත් එක කාරණයක් මතක් කරන්නට කැමතියි. එනම් මෙම පාර්ලිමේන්තු ගොඩනැගිල්ල පිළිබඳවයි. ගරු අගමැතිතුමාත් මෙහි සිටි න නිසා එතුමාගේ අවධානයට යොමු වීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

පිණිස මා එක්තරා යෝජනාවක් ඉදිරිපත් කරන්නට කැමතියි. පාර්ලිමේන්තු ගොඩනැගිල්ලක් සාමාන්‍යයෙන් පිහිටුවන්නේ රටක අගනුවරයි. අද මේ රටේ අගනුවර වන කොළඹයි, අපේ මන්ත්‍රී මණ්ඩල ගොඩනැගිල්ල පිහිටුවා තිබෙන්නේ. මෙම ගොඩනැගිල්ල වර්තමාන මන්ත්‍රී මණ්ඩලයට ප්‍රමාණවත් නොවන හෙයින් අළුතින් ගොඩනැගිල්ලක් ඉදි කරන්නට යෝජනාවක් තිබෙනවා. එම නිසා මේ රටේ අගනුවර පිළිබඳ ප්‍රශ්නය ගැනත් මෙම අවස්ථාවේදී ගරු අගමැතිතුමාගේ අවධානය යොමු කරවන්නට මා කැමතියි. කොළඹ අපේ අගනුවර වුණේ එක්තරා ඓතිහාසික පසුබිමක් යටතේයි. මේ රටේ අගනුවර වීමට කොළඹට වඩා සුදුසු වෙනත් ඓතිහාසික නගර තිබෙනවා. දිගින් දිගට කියන්නට පුළුවන් කතාවක් කෙටි කිරීමට වුවමනා නිසා මා කෙටියෙන් ගරු අගමැතිතුමාට යෝජනා කරනවා, ඓතිහාසික වැදගත්කමක් ඇති, ජාත්‍යන්තර වැදගත්කමක් ඇති, එමෙන්ම අනාගතයේදී මේ රටේ ඒකීය ආණ්ඩුවක් ආරක්ෂා කර ගැනීම සඳහා වැදගත් විය හැකි, උතුරු පළාතටත් නැගෙනහිර පළාතටත් ඉතා කිට්ටු මධ්‍යස්ථානයක් වශයෙන් සිතිය හැකි, අනුරාධපුරය මේ රටේ අගනුවර හැටියට සලකාගෙන යෝජිත මන්ත්‍රී මණ්ඩල ගොඩනැගිල්ල එහි පිහිටුවන්නට කටයුතු යොදන ලෙස. ඒ ගැන එතුමාගේ අවධානය යොමු වේවායි පතමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 5

ටී. බී. එම්. හේරත් මයා. (වලපනේ)
(திரு. ரீ. பி. எம். ஹேரத்—வலப்பனை)
(Mr. T. B. M. Herath—Walapane)

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේගේ වැය ශීර්ෂය යටතේ වචන කීපයක් සඳහන් කරන්නට මා බලාපොරොත්තු වෙනවා. හබරාදුව ගරු මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) විසින් ඉදිරිපත් කරන ලද කරුණු කීපයක් අපටද අනුමත කරන්නට සිදු වී තිබෙන බව මා ප්‍රථමකොටම කිවයුතුයි.

මන්ත්‍රීවරුන්ට ලැබියයුතු වරප්‍රසාද, මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම්, පිළිබඳව රාජ්‍ය මන්ත්‍රණ සභා කාලයෙන් පසු කල්පනාව යොමු නොකර තිබෙන බවයි මට පෙනී යන්නේ. තමුන්නාන්සේට මා මතක් කරන්නට කැමතියි, මේ රටට ඉතා විශාල සේවයක් කළ හිටපු අධ්‍යාපන ඇමතිවරයකු වන සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාගේ ජීවිතය පවත්වාගෙන යාම පිණිස යම්කිසි දීමනාවක් දීම සඳහා පසුගිය ආණ්ඩුවට එක්තරා යෝජනාවක් මෙම ගරු සභාවේදී සම්මත කර ගන්නට සිදු වුණු බව. මේ රටේ මහජනයාට සේවය කරන ගරු මන්ත්‍රීවරයකුට දක්වන සැලකිල්ල මේකදැයි මා අහන්නට කැමතියි. අවුරුදු 15, 20, 25, 30 තරම් කාලයක් තිස්සේ, සමහරවිට ඊටත් වඩා කාලයක් තිස්සේ බලපෑ ප්‍රශ්න පිළිබඳව පැය 24 ක සුළු කාලයක් තුළ ක්‍රියා කරමින් මහජනතාවට සේවයක් කළ ගරු මන්ත්‍රීවරයකුට දැක්විය යුතු සැලකිල්ල මෙයදැයි මෙම ගරු සභාවෙන් අහන්නට මා කැමතියි. එසේම ඒ පිළිබඳව මෙම ගරු සභාවේ සැලකිල්ල යොමු කරවන්නට මා කැමතියි. මන්ත්‍රීවරුන්ගේ දීමනාව ගැන මන්ත්‍රීවරුන්ම කථා කරනවාය කියා සමහර විට චෝදනා එන්න පුළුවන්. මේ ගැන කථා කරන විට, සමහර විට වැඩියෙන් ජනප්‍රිය වීම පිණිස මන්ත්‍රීවරුන්ගේ දීමනා වැඩි කරන්න වුවමනා නැත කියන සමහර මන්ත්‍රීවරයෙක් ඉන්න බැරි නැහැ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ඉන්නවා.

ටී. බී. එම්. හේරත් මයා.
(திரு. ரீ. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

ඔව්, ඉන්නවා. එහෙත් අප කල්පනා කළ යුතුයි මේ රටේ සිටින දෙවැනි ශ්‍රේණියේ ලිපිකරුවාගේ සිට ඊට උඩින් සිටින සියලුම රජයේ සේවකයන්ට මන්ත්‍රීවරුන්ට වඩා දීමනා ලැබෙන බව. අප ඒ ගැන කිසිසේත් ඊර්ෂ්‍යා කරන්නේ නැහැ. මෙම මන්ත්‍රී මණ්ඩලයේත් මන්ත්‍රීවරුන්ට වැඩියෙන් දීමනා ලැබෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිලධාරි මහත්වරුන් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. එම නිසා අප කියා සිටින්නේ මේ රටේ ගරු සේවයක් කරන මන්ත්‍රීවරයාට ඔහුගේ වුවමනාවන් ඉටු කර ගැනීම සඳහා, ණය නොවී, අල්ලස් නොගෙන, අනුන්ට අත පාන්නෙ නැතුව, ආත්ම ගරුත්වය රැකගෙන, කොඳු ඇටය කෙළින් තබාගෙන ජීවත් වන්නට තරම් සෑහෙන දීමනාවක් ලැබීමට මන්ත්‍රීවරුන්ට අයිතියක් යුතුකමක් තිබෙන බවයි.

සමහර මන්ත්‍රීවරුන් කල්පනා කරනවා මන්ත්‍රීවරුන්ගේ දීමනා ගැන කථා කිරීම දේශපාලන වශයෙන් අවාසිය කියා. හොඳයි මම මා ගැනම කථා කරන්නම්. මට ඡන්ද ටිකක් අඩු වුණාට කමක් නැහැ. මම ඇත්ත කියන්නම්. වලපනේ ආසනය වෙනුවෙන් පෙනී සිටිමින් මෙහි ඇවිත් කටයුතු කිරීමේදී ශ්‍රාවස්තියට ගෙවිය යුතු මුදල රුපියල් 150කට වැඩි වන බව මා කියන්න ඕනෑ. ඉඳුම් හිටුම් කෑම ආදී සෑම දේකටම ගෙවන්න ඕනෑ. අපට කාර් නැහැ. ඒ නිසා ටැක්සි වලට දවසකට රුපියල් 5 ක් පමණ ගෙවන්න ඕනෑ. ඒ කියන්නේ කොළඹ නගරය තුළ වැඩ කිරීමේදී. ඊට පසුව ආසනය ඇතුළත වැඩ කරන අවස්ථාවෙදි තවත් අමතර ගාස්තු ගෙවන්න සිද්ධ වෙනවා. ඒ වාගේම මේ ගරු සභාවේ තිබෙන තමුන්නාන්සේගේ සම්ප්‍රදාය යටතේ අපි තේ කෝප්පයක් නොබී ගියත් ඒ සඳහා රු. 1.50 ක් ගෙවන්න ඕනෑ. මම දන්නෙ නැහැ ඒ නීති කවුරු මොනවට හදපු නීතිද කියා. ඒවා වෙනස් කරන්නට කවුරුවත් ක්‍රියා කරන්නේත් නැහැ. ඇයි මන්ත්‍රීවරුන් මෙවැනි තත්ත්වයකට පත් කර තිබෙන්නෙ? එයින් අදහස් කරන්නේ සල්ලි තිබෙන උදවිය පමණක් මෙහි සේවය කළ යුතුය කියාද? නීතිඥ වෘත්තියේ යෙදී සිටින අයට හෝ වතුවලින් නොයෙක් විධියෙන් මිල මුදල් හම්බ කරන අයට හෝ හැන්දෑවට විනෝදයට විවේක ගන්න පමණක්ද මේ ගරු සභාව තිබෙන්නෙ? එසේ නොවේ නම් මේ රටේ දුප්පත් මිනිසුන්ගේ මහජන නියෝජිතයින් වශයෙන් පැමිණ තමන්ගේ තත්ත්වය නියාගෙන ඒ සේවය කරන්නට මහජන නියෝජිතයින්ට සෑහෙන සැලකිල්ලක් නොදක්වන්නේ ඇයි කියා අපට අසන්නට සිදු වී තිබෙනවා. මම හිතන්නෙ නැහැ, එය දේශපාලන පක්ෂ වශයෙන් ගත යුතු ප්‍රශ්නයක්ය කියා. මොන පක්ෂයේ වුණත් සල්ලි තිබෙන නොතිබෙන උදවිය ඉන්න පුළුවන්. ඒ නිසා මේ ප්‍රශ්නය විසඳීමේදී ටිකක් ක්‍රියා කාරී විය යුතු යයි කියන්නට අපට සිද්ධ වී තිබෙනවා.

මන්ත්‍රීවරයකුට තම සේවය හරියාකාර ඉෂ්ට කරන්නට මිල මුදල් නැති වන විට අල්ලස් ගැනීමට පෙළඹෙන්නට බැරිකමක් නැහැ. එක එක්කෙනාගෙ උදව් ඉල්ලන්න පෙළඹෙන්නට බැරිකමක් නැහැ. වත්කම් හෙළි කිරීමේ පනතක් ගෙනෙනවාය කියා අගමැතිතුමා පොරොන්දුවක් දී තිබෙනවා. ඒක බොහෝම හොඳයි. ඒ වාගේම එය ඉතාමත් අවශ්‍ය එකක්. හැබැයි ඒ සම්බන්ධයෙන් මම එක ඉල්ලීමක් කරන්න කැමතියි. පනත ගෙනා විට, ඒ පනත ඉදිරිපත් කළ හෝ සම්මත වුණ දවසේ සිට නොව, ඒ ඒ උදවිය දේශපාලනයට බැස්ස දවසේ සිටම වත් කම් හෙළි කිරීමට එහි විධිවිධාන සලස්වන්න ඕනෑ. සමහර අය සිතාගෙන ඇති පසු ගිය අවුරුදු පහ හය තුළ කළ ඒවා යටපත් කර දානට තිබෙන තත්ත්වය පමණක් පෙන්වන්න. 1965 සිට පෙන්වන්නය කියා මා යෝජනා කළොත් තමුන්නාන්සේලා හිතාවි මා පැත්තකට ගැවී කථා කරනවාය කියා. ඒ නිසා අපි 1955-1956 සිට අර ගනිමු.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
අවුරුදු 30කට ඉහත සිට.

ටී. බී. එම්. හේරත් මයා.
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)
ඔව්, තමුන්නාන්සේ යම් දවසක සිට පටන්ගත්තා නම් එදා සිටම ගත්තට කමක් නැහැ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
මට දින වකවානු මතකත් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ටී. බී. එම්. හේරත් මයා.
(திரு. ரீ. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

1956දී මේ පනත ගේනවාය කිව්වා. 1970 දී ගෙනාවාය කියමු. එතකොට 1965 සිට තිබුණ වත්කම් හෙළි නොකළොත් මේ අවුරුදු 5 ඇතුළත හම්බ කළ දේවල් ගැන දැනගන්න ලැබෙන්නෙ නැහැ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

මම එදාට වඩා අද හුඟාක් දුප්පත්.

ටී. බී. එම්. හේරත් මයා.
(திரு. ரீ. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

එහෙම තමයි කවුරුත් කියන්නෙ. යම් කෙනෙක් එදාට වඩා දුප්පත් කියා ඕනෑ කෙනෙකුට කියන්න පුළුවන්. සමහරු තවත් අනකට කියයි; ඔව්, එයා එදාට වඩා බොහෝම දියුණුයි, හුඟක් දේවල් හම්බ කරගෙන තිබෙනවා; මිල මුදල් තිබෙනවා කියා. අපි මොකටද එවැනි කථාවලට ඉඩ දෙන්නේ?

මට මතකයි, 1957 නැත්නම් 1958 දී දැනට සිටින කර්මාන්ත ඇමතිතුමා විසින් කුඹුරු පනත ඉදිරිපත් කරන විට 1956 අහවල් දවසේදී අද ගොවියන් වශයෙන් සිටි අය තමයි, අද ගොවියන් හැටියට සල කන්නේ කියා නියමයක් කළ බව. ඇයි එහෙම දෙයක් කළේ? ඊට පසුව යම් යම් වෙනස්කම් ඇති වීම වැළැක්වීම පිණිසයි. ඒ වගේම මේ වත්කම් හෙළි කිරීමේ පනත ගෙන එන විටත් අපි පටන් ගත් තැන සිටම වත්කම් පෙන්වීම සඳහා නීති රීති සකස් කරන්න ඕනෑ. පටන් ගත් තැන සිටම දියුණු වී තිබෙනවාද, පරිහානියට ගොස් තිබෙනවාද කියා පෙන්වන්න ඕනෑ. හරි විටියට වත්කම් හෙළි කිරීමක් සිදු වන්නේ එවිටයි. එහෙම නැත්නම් පටන් ගන්නා විට රුපියල් 5,000 ක් වත් නොතිබුණ මිනිහෙක් රුපියල් ලක්ෂ 5ක් පමණ උපයා ගෙන අවසන් වී මට දැන් රුපියල් ලක්ෂ 5 ක් තිබෙනවාය කියා වත්කම් හෙළි කරන්න පුළුවනි. මොකක්ද එහි තිබෙන ප්‍රයෝජනය? මා හිතන්නේ නැහැ, එසින් ප්‍රයෝජනයක් ඇති වේවිය කියා. පටන් ගත් තැනත් හෙළි කරන්න ඕනෑ; ඒ වගේම දැන් ඉන්න තත්ත්වයත් හෙළි කරන්න ඕනෑ. එතකොට තමයි, වත්කම් හෙළි කිරීම නියම වශයෙන් පෙන්වන්න පුළුවන් වන්නෙ. අවංක භාවයක් තිබෙනවා නම් ඒ අවංක භාවය ඔප්පු කරන්න පුළුවන් වන්නේ එවිටයි. විරුද්ධ පක්ෂයේ සිටින මන්ත්‍රීවරුන් ඒ විධියට කරන්න ලැහැස්තියි. පටන් ගත් තැනත් දැන් සිටින තැනත් හෙළි කරන්න අපි ලැහැස්තියි. ගරු රාජ්‍ය ඇමතිතුමා එයට ලැහැස්තිද නැද්ද කියා මා දන්නේ නැහැ.

එස්. ද එස්. ජයසිංහ මයා.
(திரு. எஸ். டி. எஸ். ஜயசிங்ஹ)
(Mr. S. de S. Jayasingha)

පටන් ගත් තැන හුඟක් අයට මතක නැහැ.

ටී. බී. එම්. හේරත් මයා.
(திரு. ரீ. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

එය තමයි අපට තිබෙන කරදරය. වරද එයයි. පටන් ගත් ඒවා පමණක් නොවෙයි, පටන් ගන්න පොරොන්දු වූ දේවල් පවා අමතක වී තිබෙනවා. අච්චු ගසා තිබෙන දේවල් පවා අමතක වී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මා කියන්නේ මන්ත්‍රීවරුන්ගේ කටයුතු කරන්න පුළුවන් වන ආකාරයට මන්ත්‍රීවරුන්ගේ දීමනාවල් සකස් වෙන්න ඕනෑ බවයි. එහෙම නැත්නම් මෙය කර ගෙන යන්නට බැහැ. සමහර ආසන හැතැප්ම 100 ක් නැත්නම් 200 ක් පමණ ඈත පිහිටා තිබෙනවා. ඒ වගේම බොහොම දුෂ්කරතාවයන් තිබෙන ආසන තිබෙනවා. ඒ ආසනවල සිටින මන්ත්‍රීවරුන් කොහොමද මේ වැඩ කරන්නෙ?

මා හිටපු අධ්‍යාපන ඇමතිතුමා ගැන සඳහන් කළා. මා හිතන හැටියට මේ රටේ අධිකරණ සේවා කොමිෂන් සභාව යටතේ වැඩ කරන උදවිය පවා අවුරුදු 7 ක් වැඩ කළාට පසුව විශ්‍රාම වැටුප්වලට හිමිකම් කියනවා. නමුත් මන්ත්‍රීවරුන්ට, අපේ රාජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ, අවුරුදු 30 ක් සේවය කර තිබුණත් බැරි දවසට ගෙදර යන්න සිදු වෙනවා; සතයක්වත් ලැබෙන්නෙ නැහැ. කිසිම දෙයක් ලැබෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නෙ නැහැ. ඇත්ත වශයෙන්ම මන්ත්‍රීවරයා සැලකිය යුතු කෙනෙක්. ඔහු මහජන සේවයේ යෙදී සිටින කෙනෙක්. අවුරුදු 10 ක්, 15 ක් නැත්නම් 20 ක් තිස්සේ දවසට තිබෙන පැය 24 තුළම දිගටම මහජන සේවය කරන මන්ත්‍රීවරයෙකුට මන්ත්‍රීකම අත්හැර ගියාට පසුව යම්කිසි දීමනාවක් දෙන්න ඕනෑ. අනික් රටවල ඒ විධියට දෙනවා. ඒ විධියේ දීමනාවල් දෙනවා නම් ගරු අගමැතිතුමනි, මිනිසුන් අර වාගේ දේවල්වලට නොපෙළඹී අවංකව කටයුතු කරනවා. හැමදාම ජීවත් වෙන්න කෑදහෝ ලැබෙනවා නේද කියා ඒ අය කල්පනා කරනවා. එවිට ඔවුන් තුළ අවංකකමක් ඇති වෙනවා. එහෙම නැත්නම් ඔවුන් මොනවාද කල්පනා කරන්නෙ? මන්ත්‍රීකම නැති වුණ දවසට මොකක්ද කරන්නෙ? ඒ නිසා තමයි, කොමිස් එකක් හරි මොකක් හරි ගන්න පටන් ගත්තෙ. කොමිස් එකක් ගන්නවාය කිව්වත් අපට හිතා ගන්න පුළුවන් වන්නේ අල්ලස් නැත්නම් පගාව ගන්නව කියලයි. කොයි විධියට ගත්තත් අල්ලස් ගැනීම තමයි කෙරෙන්නෙ. මේ කොමිස් එකක් ගැනීම අපේ රටේ පගා ගැනීමක් විධියට සලකන්නේ නැහැ. "බිස්නස්" කරන අය නැත්නම් වෙළඳ ව්‍යාපාර කරන අය කොමිස් එකක් ගත්තට වරදක් නැත, එසින් පව් සිදු වන්නේ නැත කියා අපේ රටේ මතයක් තිබෙනවා. නමුත් එයත් එක්තරා විධියක අල්ලස් ගැනීමක් තමයි. ඒ විධියට කොමිස්වලින් හෝ අල්ලස් මාර්ගයෙන් හෝ තමන්ගේ වත්කම් දියුණු කර ගන්න මහන්සි වන්නේ ඔවුන්ට වෙනත් බලාපොරොත්තුවක් නැති නිසයි. ඉදිරියේදී බලාපොරොත්තු විය හැකි දෙයක් නැහැ.

ගරු සභාපතිතුමනි, රජයේ සේවයේ යෙදී සිටින අය තමන්ගේ විශ්‍රාම වැටුපට අහිමි වේය යන බියෙන් තමන්ගේ රැකියාව ප්‍රවේශමෙන් බොහොම හොඳට කරන්න උත්සාහ කරනවා. අපි කියන්නේ නැහැ, මන්ත්‍රීවරුන්ටත් විශ්‍රාම වැටුපක් ලබා දෙන්නය කියා. මොකක් හෝ දීමනාවක් දෙන්න කියායි අපි කියන්නෙ. රටට සේවයක් කළ අයට ඉතිරි කාලයේදීත් ජීවත් වෙන්න පුළුවන් මාර්ගයක් සකස් කර දෙන්න. මේ රටේ සිටින හැම සේවකයෙකුටම ඒ දීමනාව ලැබෙනවා නම් ඒක ජන සේවකයන් පමණක් ඒ තත්ත්වයට අහිමි කරන්න හේතුව මොකක්ද? [බාධා කිරීම්] ඔව්. කාලසීමාවක් තිබෙනවා. හොඳට කල්පනා කර බලා කාල සීමාවක් ඇති කරගන්න ඕනෑ.

අපේ අනිකුත් වරප්‍රසාද ගැන හබරා දූවේ ගරු මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) සඳහන් කළා. මන්ත්‍රීවරයෙකුට කාර් එකක් අවශ්‍යද නැද්ද කියන කාරණාව ගැනත් එතුමා සඳහන් කළා. මේ රටේ "බිස්නස්" කරන ලොකු මුදලාලිලාට කාර් වුවමනා කරන්නේ කුමකටද? ඒ අය පිට ඇවිදින්න යන්නෙ නැහැ. තමන් ව්‍යාපාරය කරන ස්ථානයේ සිට ගෙදරට යාම පමණයි ඔවුන් අතින් කෙරෙන්නෙ. නමුත් මන්ත්‍රීවරයෙකුට මහජන වැඩ කොතෙක් තිබෙනවාද? මන්ත්‍රීවරයෙකුට ඇවිදින්න සිදු වන්නේ දේශපාලන වැඩවලට පමණක් නොවෙයි. මහජනයාගේ ඕනෑ එපාකම් ඉටු කිරීම සඳහා අර ඇමතිතුමාගේ කන්තෝරුවට යන්න සිදු වෙනවා, මේ ඇමතිතුමාගේ කන්තෝරුවට යන්න සිදු වෙනවා; අනිකුත් දෙපාර්තමේන්තුවලට යන්න සිදු වෙනවා. තමුන්නාන්සේලාත් දන්නවා ඇති, ගරු ඇමතිවරයෙක් යම්කිසි නියෝගයක් දුන් විට එයත් අරගෙන අපි ස්ථිර ලේකම්තුමාළඟට යන්න ඕනෑ. එය ස්ථිර ලේකම්තුමාළඟ තබා ගියහොත් ඒ වැඩේ කවදාවත් කෙරෙන්නේ නැහැ. ඒ නිසා එතුමා ලවා එය ලියවා ගෙන ඊළඟට දෙපාර්තමේන්තු ප්‍රධානියා ළඟට යන්න ඕනෑ. පියුන් සේවයකුයි අපට කරන්න සිදු වන්නෙ. දෙපාර්තමේන්තු ප්‍රධානියා ලවා එය ලියවා ගෙන ඊළඟට ලිපිකරු මහතා ළඟට යන්න ඕනෑ. කොතනක හෝ ලියමන තබා ආවොත් වැඩේ වරදිනවා. මන්ත්‍රීවරයා හැම දෙයක්ම කරන්න ඕනෑ. එවැනි කොටසකට වාහනයක් දෙන්නට තමුන්නාන්සේලා අකමැතියි. ආණ්ඩු පක්ෂයෙත් පිටිපස්සේ සිටින අයට වාහන නැහැ. ඇමතිවරුන්ට හා පාර්ලිමේන්තු ලේකම්වරුන්ට නම් ආණ්ඩුවේ කාර් පාවිච්චි කරන්න පුළුවන්. සමහර අය වහාවටය කියා ජීප් අරගෙන තිබෙනවා. එහෙත් කරන වහාවක් නම් නැහැ.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

ඔය පැත්තේ අයත් අරගෙන තිබෙනවා.

ටී. බී. එම්. හේරත් මයා.
(திரு. ரீ. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

වරද කොයි පැත්තෙන් කළත් එකයි. එහෙත් ඒ වරදට අනුබල දී තිබෙන්නේ ඇමතිතුමායි. වගා කරන්නේ කවුද කියා හරියට සොයා බලලයි දෙන්නට ඕනෑ. ඒ නිසා වගාව නොකරන අයට දුන්නා නම් ඇමතිතුමා එයට වගකියන්නට ඕනෑ. ගරු සභාපතිතුමනි, මැතිවරණයක් ආවාම අපි යන්නේ පයින්ද? ටැක්සි මුදලාලිලාට කාර් දීම වැරදියි කියා අපි කියන්නේ නැහැ. ඒ අය කරන්නෙත් සේවයක්. එහෙත් ඒ අය එයින් මුදල් උපයනවා. ඒ අයටත් කාර් දුන්නා නම් මන්ත්‍රීවරුන්ට නොදීමේ සාධාරණය කුමක්ද? තමන්ටම බෙදා ගත්තාය කියා මහජනයා දෙස් කියනවාටයි මන්ත්‍රීවරුන්ට නුදුන්නේ. කලින් නම් මන්ත්‍රීවරුන්ට වාහන දෙන්නට ලැහැස්තියක් තිබුණා. මහජනයා දෙස් කියාවිය කියා එය නතර කළා. එහෙත් එසේ නතර කිරීම වැරදියි. වලපනේ වැනි ඡන්ද කොට්ඨාශවල හැතැප්ම තිහ හතලිහ ගමන් කරන්නට සිදු වෙනවා. කොතැන කට හෝ උදේ ගිය බස් එක ආපසු එන්න පිටත් වන්නේ සවසයි. [බාධා කිරීමක්] ඒ පාරවල බරකරත්තයක්වත් යන්නට බැහැ. හැතැප්ම දහය පහළොවේ නැග්ම වල් තිබෙන්නේ. එක තැනක අඩි 1,500 යි; තව තැනක 3,500 යි. එවැනි දුෂ්කර ප්‍රදේශ අයිති ආසනවල මන්ත්‍රීවරුන්ට වාහනයක් නැතිවම බැහැ. ගරු අගමැතිතුමාගේ දැදිගම ආසනයේත් එවැනි දුෂ්කර ප්‍රදේශ තිබෙනවා. ඒ නිසා මන්ත්‍රීවරුන්ට මුදල් ගෙවා ලබා ගන්නට වාහනයක් දෙන්න.

අ. භා. 5.15

හබරාදූව ගරු මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) විදුලි පණිවුඩ ගැන කිව්වා. 1960 සිට 1964 දක්වා වූ කාලය සඳහා විශාල මුදලක් ගෙවන්නය කියා මට කීවා. මට ඒ දැන්වීම ලැබුණේ දිවංගත කථානායකතුමා සිටියදීයි. මුදල් ගෙවිය යුතුව ඇති විදුලි පුවත්වල පිටපත් එවන ලෙස මා කීවා. එසින් සමහර ඒවා එක්කෝ රැස් වීමකට එන්නට බැරිය කියා යැවූ විදුලි පුවත්; නැත්නම් නියම කරගෙන තිබුණු සම්මුඛ සාකච්ඡාවක් අවලංගු කරමින් යැවූ විදුලි පුවත්. මට ලැබුණු විදුලි පුවත් පිටපත් ටික මම ශ්‍රීමත් ඇල්බට් එෆ්ජ්. පිරිස් කථානායකතුමාට ගෙනිහින් දුන්නා ඒවා රාජකාරිද නැද්ද කියා තීරණයක් කරන්නය කියා. මම එතුමාට කීවා තැපැල්පතිගේ තීරණය පිළිගන්න මා කැමති නැති නිසා එතුමාට තීරණයක් දෙන්නය කියා. එවිට ඇල්බට් එෆ්ජ්. පිරිස් මැතිතුමා කීවා ඔක්කොම රාජකාරි විදුලි පුවත්, සතයක් ටත් ගෙවන්න එපා කියා. එහෙත් අද වන තුරුත් කියනවා එය ගෙවන්නය කියා. මන්ත්‍රීවරුන් රුපියල් අටදහස් ගණනක් ගෙවන්නට තිබෙනවාය කියා අද "සන්" පත්‍රයේ කියනවා. මන්ත්‍රීවරුන්ගේ හොඳ නමට කැළලක් ඇති කිරීමට එය නිකුත් කර තිබෙන්නේ තැපැල් දෙපාර්තමේන්තුව මගින්මයි. විදුලි පණිවුඩය රාජකාරිද නැද්ද කියා තීරණය කරන්න ඕනෑ අපයි. ඒ සඳහා අපට තැපැල්පතිගේ උපදෙස් ඕනෑ නැහැ. ගරු සභාපතිතුමනි, තැපැල්පතිට වුවමනා අන්දමට මෙවැනි දේවල් ගැන ක්‍රියා කරන්නට තමුන්නාන්සේ ඉඩ දෙන්නේ ඇයි?

ටෙලිපෝන් සේවයත් ඒ වගේමයි. 1964 අවුරුද්දේ අවසාන භාගයේ මා පාර්ලිමේන්තු ලේකම්වරයෙක් හැටියටයි සිටියේ. ඊට පසුව පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. ඒ මැතිවරණයේදී මා නැවතත් පත් වුණා. මා පාර්ලිමේන්තු ලේකම් කාලයේ මගේ නමින් ටෙලිපෝනයක් ශ්‍රාවස්තියේ තිබුණා. ඒ ටෙලිපෝනය වෙනුවෙන් රුපියල් දහතුනකුත් ගණනක් ගෙවන්නය කියා මට කිව්වා. මා ඇහුවා ඇයි කියා. ඊට පසුව මට ලියා එවා තිබෙනවා අහවල් අහවල් අංකවලට ටෙලිපෝන් පණිවුඩ අරගෙන තිබෙනවාය, ඒවාට ගෙවන්න ඕනෑය කියා. එවිට මා කීවා මම පාර්ලිමේන්තු ලේකම්වරයෙක් හැටියට රාජකාරිය කරන කාලයේදීයි එම ටෙලිපෝන් පණිවුඩ අරගෙන තිබෙන්නේ, ඒ නිසා මට ගෙවන්නය කියන්නේ ඇයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා. ඊට පසුව කියා එවනවා ඒ ටෙලිපෝන් පණිවුඩ දී තිබෙන්නේ පෞද්ගලික ඒවාට නිසා ඒ මුදල ගෙවන්නට ඕනෑය කියා. ඒ නිසා මේවා ගෙවන්නට වුවමනාවක් නැහැ. මා ඊට පසුව මේ ටෙලිපෝන් ගැන පරීක්ෂා කර බැලුවා. බදුල්ලේ ගරු මන්ත්‍රීතුමාටත්, පස්සර ගරු මන්ත්‍රීතුමාටත්, නුවරඑළියේ දිසාපතිතුමාටත්, බදුල්ලේ දිසාපතිතුමාටත්, කුරුණෑගල දිසාපතිතුමාටත් මා ටෙලිපෝනයේ කථා කර තිබෙනවා. ඒ උදවියගේ ටෙලිපෝන් පෞද්ගලික ගණයේ ඒවාද? ඇත්තෙන්ම මේ දෙපාර්තමේන්තුව කරන්නේ මොන තක්කඩි වැඩද? ආණ්ඩු පැත්තේ සිට විරුද්ධ පැත්තට අවුත් වාඩි වුනාම අර ලියමන එව්වා. ආණ්ඩු පැත්තේ මන්ත්‍රීවරුන්ටත් මේ තත්ත්වයට මුහුණ පාන්නට සිදු වී ඇතිවා වන්නට පුළුවනි. ඉතින් ඒ බිල් නොගෙවූ විට ඒ පිළිබඳව පුවත්පත්වල වාර්තා පළ කොට මන්ත්‍රීවරුන්ට නිග්‍රහ කරනවා. ඉස්සර නම් රාජකාරි ටෙලිපෝන් පණිවුඩ පෞද්ගලික ටෙලිපෝනයකින් ලබා ගන්නට පුළුවන් කම තිබුණා. එහෙත් දැන් ඒකට ඉඩක් නැහැ. රාජකාරි ටෙලිපෝන් පණිවුඩයක් ලබා ගන්නට රාජකාරි ටෙලිපෝනයක්ම ඕනෑ. දුෂ්කර පළාත්වල ඔය තරම් රාජකාරි ටෙලිපෝන් තිබෙනවාද? කොළඹදී වුණත් හදිසි රාජකාරි පණිවුඩයක් දෙන්නට රජයේ කාර්යාලයකට යන්නට ඕනෑ නේද? ඉතින් හදිසි රාජකාරි පණිවුඩයක් පෞද්ගලික ටෙලිපෝනයකින් දෙන්නට ඉඩ නොදෙන්නේ ඇයි? හදිසි පණිවුඩයක් දෙන්නට පැය තුනක් හතරක් තිස්සේ බලාගෙන ඉන්නටත් ඕනෑ. ඇයි මෙවැනි තත්ත්වයක් ඇති කර තිබෙන්නේ? ගරු සභාපතිතුමා කරුණා කර මේ කාරණා ගැන තීරණයක් ගත යුතුව තිබෙනවා. මන්ත්‍රීවරුන්ගේ අසිතිවාසිකම් රැකිය යුතුව ඇත්තේ ගරු සභාපතිතුමා විසිනුයි.

ගරු සභාපතිතුමනි, මේ අවුරුද්දේ ශ්‍රාවස්තිය සඳහා තවත් රුපියල් 25,000ක් වැඩිපුර වෙන් කර තිබෙනවා. ඇත්තෙන්ම මේ වෙන් කර තිබෙන රුපියල් 1,50,000ක් වූ මුදලේ ප්‍රයෝජනය ගරු මන්ත්‍රීවරුන්ට ලැබෙන්නේ නැහැ. මන්ත්‍රීවරුන් 75 දෙනකු එහි සිටිනවා. එතකොට එක මන්ත්‍රීවරයකු සඳහා රුපියල් 2,000 ක් වියදම් වෙනවා. මේ අතර ආණ්ඩුවේ ගෙවල් නිකම් ලැබී තිබෙනවා. මන්ත්‍රීවරුන් හැම දේටම සල්ලි ගෙවනවා. මන්ත්‍රීවරුන්ට පොඩි පොඩි පහසුකම් ලැබෙන බව ඇත්තයි. එසේ වුණත් රුපියල් 1,50,000 ක සේවය ලැබෙන්නේ නැහැ. ආණ්ඩුවෙන් නොමිලයේ බංගලා ලැබී තිබෙනවා. එත කොට ආණ්ඩුවෙන් සහ මන්ත්‍රීවරුන් ගෙන් රුපියල් ලක්ෂ $2\frac{1}{4}$ ක විතර මුදලක් ලැබෙනවා. එහෙත් එහි වැඩ පිළිවෙළ ගැන බලන විට සතුටු වන්නට පුළුවන්කමක් නැහැ. ශ්‍රාවස්තිය පාලනය කරනු ලබන්නේත් ගරු සභාපතිතුමා විසිනුයි. ශ්‍රාවස්තියේ කටයුතු සම්බන්ධයෙන් උපදේශක කාරක සභාවකුත් පත් කර තිබෙනවා. එහෙත් ඒ කාරක සභාව රැස් වන්නේ නැහැ.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
තමුන්නාන්සේත් ඒ කාරක සභාවේ ඉන්නවා නේද?

ටී. බී. එම්. හේරත් මයා.
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)
ඇත්ත තමයි. රැස්වීම් කැඳවන්නේ නැත්නම් මොනවා කරන්නද? රැස්වීම් කැඳවන්නේ නැත්නම් කියන්නට ඕනෑ දේ මෙහිදිවත් කියන්නට එපායැ? ඇත්තෙන්ම ඒක නිකම් මුදල් නාස්ති කිරීමේ ව්‍යාපාරයක්. රුපියල් 1,50,000ක් මන්ත්‍රීවරුන් වෙනුවෙන් වියදම් කරනවා නම්, මන්ත්‍රීවරුන්ට සලසන සේවා වෙනුවෙන් ඒ මන්ත්‍රීවරුන්ගෙන් මුදල් ද අය කරනවා නම්, තේවාසිකාගාරයක් ආණ්ඩුවෙන් නොමිළයේම ලැබී තිබෙනවා නම්, දැනට වඩා සුදුසු තත්ත්වයකින් මෙහි කටයුතු සිදු විය යුතු නේද? මා කාටවත් පෞද්ගලික වශයෙන් චෝදනා කරන්නේ නැහැ. එහෙත් මුදල් නාස්ති වන ආකාරයට මෙහි වැඩ සිදු වන බව නම් නොකියාම බැහැ. අවංක සේවයක් සිදු වන්නේ නැහැ. මේ තත්ත්වය උදා වී තිබෙන්නේ ඒ නිසයි. සුදුසු පියවරක් ගෙන ශ්‍රාවස්තියේ කටයුතු පිරිසිදු කරන්නට ඕනෑ. ඉතින් මන්ත්‍රීවරුන් ගැන තත්ත්වය මෙසේ නම් රටේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

අනෙක් තැන් ගැන කුමක් කියන්ටද? අනෙක් තැන් ගැන කථා කරන්නම දෙයක් නෑ.

සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය නැති කළ යුතුයයි කියන කාලයකයි අප මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ගැන කථා කරන්නේ. සෙනෙට් මන්ත්‍රීවරුන්ට මෙම මන්ත්‍රී මණ්ඩලයේ ඕනෑම තැනක ඇවිදින්නට පුළුවනි; අපේ භෝජනාගාරයට යන්නට පුළුවනි; ප්‍රධාන ගැලරියට යන්නට පුළුවනි. එහෙත් නියෝජිත මන්ත්‍රීවරයකු සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයට ගිය විට ඔහුට සලකන්නේ කොහොමද? පිකව් පතක් ගැනීම සඳහා සෙනෙට් මන්ත්‍රීවරයෙකු සොයා ගෙන යන්නට ඕනෑ. ඒ වාගේම සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ භෝජනාගාරයට ගොස් අපට තේ එකක් බොන්නට බෑ. ඇමතිවරුන්ට නම් ඒක පුළුවනි. මෑතකදී පාර්ලිමේන්තු ලේකම්වරුන්ටත් ඒ සඳහා ඉඩ දී තිබෙනවා. ස්ථිර ලේකම්වරුන්ටත් ඒ සඳහා ඉඩ දී තිබෙනවා. නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරුන් විසින් පත් කරනු ලබන සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ භෝජනාගාරයට ගොස් නියෝජිත මන්ත්‍රීවරයකුට තේ එකක් බොන්නට බැහැ. මොකක්ද මේ තත්ත්වය?

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

අපේ අරක්කු අපටම ගහනවා.

ටී. බී. එම්. හේරත් මයා.
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

ඒ අය අපට ඉඩක් දෙන්නේ නැත්නම් මෙහේදී ඒ අයටත් දෙන්න එපායයි මා ඉල්ලා සිටිනවා. [බාධා කිරීමක්] බීර හෝ වේවා විස්කි හෝ වේවා, ඉස්සරහ පේළිවල අයට බොන්න අවසර තිබෙනවා නම්, පසුපස පේළිවල අයත් ගිහින් බිව්වට ඇති වරද මොකක්ද? කවුරුන් බොන්නෙත් තමන්ගේ සල්ලි ගෙවලයි. එක්තරා කොටසකට පමණක් එය සීමා කරන්නේ ඇයි? මන්ත්‍රීවරුන් පමණක් කොන් කරන්නේ ඇයි?

විදුලි පණිවුඩ ගැන කථා කිරීමේදී මතක් කළ යුතු තවත් වැදගත් කරුණක් තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ උත්තර මන්ත්‍රීවරයකු වන ජීනදාස නියතපාල මහත්මයාගේ පියාණන්දා දිවංගත වුණු අවසථාවේදී මගේ ශෝකය ප්‍රකාශ කොට මා විදුලි පණිවුඩයක් යැව්වා. අප මෙහෙ පැත්තේ සිටියත් එවැනි අවස්ථාවේදී ශෝකය ප්‍රකාශ කිරීම මගේ යුතුකමක්. ඒ විදුලි පණිවුඩය පෞද්ගලික එකක් නිසා ඊට මුදල් ගෙවිය යුතුයයි මට දන්වා තිබෙනවා. ඒ වාගේම, දොඩම්ගස්ලන්දේ මන්ත්‍රීතුමියගේ (ලෙටීෂියා රාජපක්ෂ මිය) පියා හෝ මාමා පරලෝ සැපත් වුණු අවස්ථාවේදීත් මා ඒ පිළිබඳ ශෝකය ප්‍රකාශ කොට විදුලි පණිවුඩයක් යැව්වා. එයද පෞද්ගලික විදුලි පණිවුඩයක් වශයෙන් සලකා මුදල් ගෙවන ලෙස මට දන්වා එවා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේට තනිවම බැරි නම් කොමිටියක් පත් කර හෝ මේවා ගැන තීරණයක් ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා. මේ තත්ත්වය අනුව අපට අහසේ සිටින්නටයි සිදු වී තිබෙන්නේ. රාජකාරී ලියුම් කුමක්ද පෞද්ගලික ලියුම් කුමක්ද යන වග තීරණය කරන්න අපට ඉඩක් නැහැ. මගේ සීල් එක ගසා යවන ලද ලියුම් සමහර තැපැල් කාර්යාලවලදී කඩා තිබෙනවා. අප ලියුමක් තැපැල් කළ විට එය කඩා බලන්න පුළුවන් තැනැත්තා කවුද? ටැලිපෝන් පණිවුඩවලට ඇහුම්කන් දීමත් දැනටම පටන් ගෙන තිබෙනවා. අසුවල් තැනැත්තා අසුවලා සමග පෞද්ගලික කරුණක් ටැලිපෝනයෙන් කතා කළා, ඒ නිසා මුදල් අය කළ යුතුයයි තව පික දවසකින් කියයි. මෙවැනි තත්ත්වයකට අද අප පත් වී සිටිනවා. මේ සම්බන්ධව නිසි පරිදි කටයුතු කිරීමට තමුන්නාන්සේගේ බලය පාවිච්චි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

මේවාට උත්තර දීමට මට අසීතියක් නැහැ. එහෙත්, එක් කරුණක් කියන්න ඕනෑ. තමුන්නාන්සේලා යවන විදුලි පණිවුඩයක් රාජකාරී එකක් බව තමුන්නාන්සේලා සහතික කරනොත් දෙපාර්තමේන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුව එය රාජකාරී විදුලි පණිවුඩයක් බව බාර ගත යුතුයි. ඒ විධියේ නියෝගයක් කර තිබෙනවා. ඒ ගැන කිසියම් වෙනසක් තිබෙනවානම් දැනුම් දෙන ලෙස පබ්ලික් එකවුන්ට්ස් කොමිටියත් කියා තිබෙනවා.

ටී. බී. එම්. හේරත් මයා.
(திரு. ரீ. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

සභාපතිතුමනි, අප විදුලි පණිවුඩයක් තැපැල් කාර්යාලයට බාර දෙන්නේ එය රාජකාරී එකක් බව සහතික කරලයි. එය සහතික කිරීම සඳහා අප අත්සන් කරනවා.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

බිල ආ විට සහතික කළොත් එය භාර ගත යුතුයි.

ටී. බී. එම්. හේරත් මයා.
(திரு. ரீ. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

මෙම ගරු සභාවේ සේවකයන්ගේ අමාරුකම් ගැනත් අප ටිකක් කල්පනා කළ යුතුයි. සෝපානය පදවන සේවකයකු එක දිගටම පැය 11 ක් 12 ක් වැඩ කරන්නේ කොහොමද? වෙනත් රටවල නම් ඔවැනි සේවකයකු වැඩ කරන්නේ පැය 4 ක හෝ 5 ක පමණ කාලයක් පමණයි. සෝපානය පදවන්නකු, සේවය කරන හැම වේලාවේම හිටගෙන සිටිය යුතුයි. ඒවා ගැන අප සැලකිල්ලක් දක්වන්නට ඕනෑ. ශුද්ධ පවිත්‍ර කිරීමෙහි යෙදෙන සේවකයන් අවුරුදු 8, 9, 10 ඒ තත්ත්වයේම සේවය කරනවා. ඒ අයට උසස් වීම් අඩුයි. යම් යම් තනතුරු ඇති වන විට පිටින් ජ්‍යෙෂ්ඨ සමතුන් ගනු ලබනවා. උගත් අය ඒ වැඩවලට ඒම ගැන අප කැමැතියි. එහෙත්, දැනට මෙහි සිටින අය ගැනත් සැලකීම් යුතුකමක්. ඒ අය ගැන සැලකිල්ලක් දක්වන්න පමණයි මා මතක් කරන්නේ.

ඊළඟට මේ පාර්ලිමේන්තු ගොඩනැගිල්ල ගැන සලකා බලමු. හැම අය වැය ලේඛන විවාදයකම කාරක සභා අවස්ථාවේදී මේ රු. 10 යෝජනාව දකින්න ලැබෙනවා. එයින් කුමන වැඩක් සිදු වනවාදැයි මා දන්නේ නැහැ. කොළඹ, රාජ්‍ය නගරයක් වීමට සුදුසු නොවන බව හබරාදුවේ ගරු මන්ත්‍රීතුමා මෙන්ම මාත් කියා සිටිනවා. කොළඹ වෙළෙඳ නගරයක්. හැම අතින්ම තදබද අමාරුකම් පවතින්නේ ඒ නිසායි. හැම රටකම වගේ වෙළඳ නගරයත්, රාජ්‍ය නගරයත් වෙන වෙනම පිහිටුවා තිබෙනවා. මේ දෙක එක තැනක තබා ගත්තාම බොහොම අමාරුකම් ඇති වෙනවා. ඒ නිසා රාජ්‍ය නගරය අනුරාධපුරයට, ගාල්ලට හෝ මහනුවරට ගෙන යන්නට යයි මා කියන්නෙ නැහැ. මා කියන්නෙ ටිකක් ඉඩ කඩ තිබෙන පහසු තැනක එය පිහිටුවන්න කියායි. මේ නගර දෙක හුහක් ඇත් කරන එකත් අමාරුවක්. අපටමයි අමාරු වෙන්නෙ. ඒ නිසා ටිකක් කිට්ටු, විවේකව වැඩ කරන්නට පුළුවන් ස්ථානයක රාජ්‍ය නගරය පිහිටුවීමේ වැදගත්කම ගැන අපට කල්පනා කරන්නට සිද්ධ වෙයි. නැත්නම් එන්ට එන්ටම අමාරු වෙයි. "වඩුවා ගේ ගෙදර පුටුව නැහැ" කියා කථාවක් ගමේ ගොඩේ තිබෙනවා. වඩුවා හැමෝටම පුටු හදා දෙන නමුත් එයාගේ ගෙදර වාඩි වෙන්න එකක් නැහැ. ඒ වගේ මේ මන්ත්‍රී මණ්ඩලයේ සිටින මන්ත්‍රීවරුන් කාගේත් දුක්ගැනවිලි ගැන කථා කරනවා. ආඥා පනත් මගින් කාටත් පහසුකම් සලසා දෙනවා. මිළ මුදල් වෙන් කර දෙනවා. මේ ඔක්කොම කරන අපට මොකවත් නැතිවීම ගැන කනගාටු වෙමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

I completely endorse the remarks made by my Colleagues, the hon. Member for Walapane (Mr. T. B. M. Herath) and the hon. Member for Habaraduwa (Mr. Prins Gunasekera). I agree with the hon. Member for Habaraduwa particularly, that the time is surely right for all sections of this House to recognize the fact that Members of Parliament should be paid an allowance in keeping with their responsibilities which will enable them to live decently and not be led into temptation of all kinds. I appreciate very much that it is a difficult enough decision for

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

Members of Parliament to take to change their own salary structure, especially when there is so much unemployment, so much distress and poverty all around us. But I agree with the formula of the hon. Member for Habaraduwa.

Perhaps it may be a good thing if a decision is not taken for ourselves but for a future group. In other words, if one Parliament were to take a decision not to be effective or operative now but to be operative for a Parliament to be elected subsequently it does not become a charge by everybody that we are trying to increase our salary for our own benefit.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

Now is a good time.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

I think the essential thing is that it must be done, because if it is not done and we wait till after the next election the chances are that it will never be done.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

You will be on the other side.

අ. භා. 5.30

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

My good Friend, the hon. Member for Kolonnawa pays me the compliment that I will probably be on the other side.

Mr. Chairman, I really rose to dwell on a different point altogether. It has been the practice of this House —I do not know under what legal sanction, but I know that it has been the practice of this House, at least from 1960 onwards—whenever allegations of bribary arose affecting Members of this House, to refer the matter to the Speaker, and to obtain the authority of the Speaker for the Bribery Commissioner to investigate any matter affecting the correctness or otherwise of a conduct pertaining to any Member of this House.

That is a privilege which I think is a salutary one and I think it is a privilege which we should hesitate to forego in any circumstances whatsoever. I think that, in a sense, vests a great responsibility on you as Mr. Speaker not merely to see that people are protected from Members of Parliament but that Members of Parliament are themselves protected against possibilities of investigations affecting them at the instance of an official who may act impartially, or may not act impartially, or perhaps not act as impartially as we would like him to sometimes. But it is necessary that the machinery should be there, a machinery which should ultimately, as far as Members of Parliament are concerned, be under your safekeeping.

Recently, an incident arose which caused a certain amount of disquiettude in my mind, maybe wrongly, when you corrected the hon. Member for Matara (Mr. Tudawe) in regard to a statement which the Hon. Prime Minister had made earlier in the course of the Debate on the Address. I know the Hon. Prime Minister had made a statement a little different to what you thought it was, but it led you to the conviction that in that insatnce, maybe you had not been apprised of it, you as Speaker were unaware as to the course of action that the Hon. Prime Minister had taken.

Now we all know what action the Hon. Prime Minister has taken. The Hon. Prime Minister made a statement about it. I am not doubting it, I am not questioning it, and I am not doubting the sincerity and correctness of what the Hon. Prime Minister has done in any manner whatsoever. We all know that he had occasion to

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

refer a certain matter to the Bribery Commissioner for investigation relating to a particular Minister, whom he has named.

This is the point I wish to make. It would appear that in that instance the Hon. Prime Minister had not consulted you or sought to make the subject matter of the investigation channelled, if I may say so, through you or place it before you for your consideration, because that is the only inference I can draw from the fact that you apparently knew nothing about it. I am not blaming anybody but I am merely stating that as a fact. Now, this is the consequence of it. To what extent does the Bribery Commissioner in such a situation where the matter is not channelled through you, really have the authority to conduct a proper investigation? For example, would he have the power to send for people, to question them, excepting with your authority? Let us suppose a complaint is made concerning any one of us in the Opposition—I am not trying to throw mud at anybody; I am just trying to clarify a point of principle—and the hon. Leader of the Opposition, in order to satisfy herself that there is nothing wrong in the Opposition, not wanting a taint to be attached to any one of us, independently of you refers the matter to the Bribery Commissioner. I suppose there is nothing to stop the Bribery Commissioner having gone into the matter, writing to her in reply and saying that he has gone into the complaint and he is satisfied that there is nothing in it.

Now, maybe he is right. He may be perfectly right in what he says. But the point I wish to make is that without your authority a proper legal investigation worthy of the name cannot be made. Even the individual concerned cannot be sent for and questioned.

If one is to have a proper investigation, the least one can do to satisfy everybody—and really bribery is such an important matter that we cannot leave it out of the reckoning—is to ask you to recommend to the Bribery Commissioner that he conduct an inquiry, because the jurisdiction of the Bribery Commissioner invoked independent of your authority lacks any sanctity whatsoever. It merely becomes a private opinion.

Now, anybody can have a private opinion on any matter. One can always look at any petition of illegal bribery and say "I think there is nothing in it," or on the other hand, "I have gone into the matter carefully. I have questioned the relevant people, recorded their answers, examined the facts, looked for circumstantial evidence developing from material in the petition and ultimately I have come to certain conclusions." All that becomes a very relevant consideration provided jurisdiction is properly invoked.

I am not really concerned with this particular instance. I know nothing of this particular case. I do not know what the petition is to which the Hon. Prime Minister referred. I am not aware of any such petition and I really do not want to know. But I will say this: if the Hon. Prime Minister felt that there was in that situation, something requiring at least a reassurance, or if he had any doubts in the interests of public morality and public good faith, I have no doubt he would not have retained such a person who was under a cloud, who had created a doubt in his mind, in his Cabinet.

But, even assuming that the Prime Minister in his own mind had no doubt but wanted to satisfy himself and to be able to say, "My people are clear," still, the proper procedure must be observed. We must conform to the standards and rules and practices of this House.

Mr. Speaker, what follows from this is even more important. You see, if we adopt the precedent that bribery allegations against Members of Parliament are capable of reference to the Bribery Commissioner without reference to you, indepen-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මහ.]

dent of you, it means really that we are allowing a third person, the creation of a statute, to directly or indirectly interfere with the exercise of the privileges of a Member of the House.

One of the privileges of a Member of the House is that he is not generally answerable for his conduct as a Member of Parliament even in a court of law. He can be asked to testify to facts which took place in his presence or acts that he has performed, but he cannot be asked for the reasons for his action, the motivation behind anything he has done or any statement he has made on the Floor of the House. He is not accountable to anybody at all. Indeed, most Ministers are Members of this House with the exception of a few who sit elsewhere. But taken by and large a Minister does not have, if I may say so, a dual personality of administrator and parliamentarian. He is first and foremost a parliamentarian elected by the people, responsible to his voters; and there is not one of us in this House who represents just a political party.

You wish to refer me to something, Mr. Chairman ?

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

No. I am following your argument.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

What I am trying to say is that there is not a single one among us in this House who merely represents one party alone. For example, while it is true that I was returned by a large majority, second only to the hon. Member for Attangalla (Mrs. Sirimavo R. D. Bandaranaike) in the present Parliament, it is not true that I represent only the S. L. F. P. voters. I do not. I represent also the whole lot of U. N. P. voters who voted against me. I am still their representative. They are stuck with me whether they like it or not at least for five years.

Now this is the point. I do not regard my responsibility as being merely a responsibility for and on behalf of the S. L. F. P. voters who voted for me. I owe just as much a responsibility to the U. N. P. voters who voted against me but whom I represent. I cannot say that they are not my business. I cannot say that their employment problems do not concern me. I cannot say that their economic welfare and prospects do not concern me. Of course, they do. Even if their economic power were to be utilized against me, it makes no difference. Still they are my responsibility. And, what is more, once I come here as a Member of this House I am not only responsible to the people of Dompe. I owe even a greater responsibility in a larger area, in a sense—the Prime Minister always says that as a democrat he wants an Opposition—because we have to represent sometimes those little interests which tend to be ignored by the Government, even by Government Members.

Therefore, Mr. Chairman, when we act as Members of Parliament we have duties which are protected by parliamentary privilege of a very wide order. Nobody can call that into question, and in fact the—Parliament (Powers and Privileges) Act entitles you to invoke that jurisdiction to enable the courts to have jurisdiction over us upon your being satisfied that the need arises for any one of us to be disciplined in one way or another for a violation of privilege.

In other words there is no question of Parliament surrendering its rights to anybody, certainly not even to the Bribery Commissioner. As far as Members of Parliament are concerned that protection is there, and my respectful submission is that so

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

long as that protection exists, I do not think it is legally possible for any official placed in the position of a Bribery Commissioner or otherwise to perform the functions of an investigator. In other words, it is not possible for him to investigate the facts and to come to any conclusion one way or the other, except perhaps to express an opinion as a layman and say, "I do not know what material there is in this. There is no way I can investigate." Probably that is so. It depends entirely on what material there is in the particular petition before him.

But I must make the point that unless an investigation is channelled through you, really that investigation is not an investigation at all and cannot satisfy anybody. Of course, it does not require your being satisfied because, in this instance, you did not refer the petition to the Bribery Commissioner as no one brought any petition to your notice.

We are all desirous of doing away with corruption on both sides of the House. We are not seeking to charge and counter-charge in this matter. But it is salutary and important that we should always bear in mind the practices and procedures which have been established and provided for in the law and to ensure that they are strictly followed.

I have no quarrel about your selecting on academic grounds deserving students to accept scholarships offered by foreign governments. But if educational institutions in the United Kingdom, for instance, have the privilege to invite students to pursue their studies there without reference to the Ceylon Government, why should the educational institutions in the Soviet Union—

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

There is no private sector in the Soviet Union.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

But they have a public sector. All the more reason to allow them to invite students on their own apart from scholarships that are offered in the normal way. Why should you restrict this right merely because, being generous, they offer scholarships to the Government of Ceylon? Why should they be restricted to these scholarships only, and why should they not have the right which the Fulbright Foundation in America has to invite students?

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

Those are private institutes. There are Soviet Institutes. If they are private institutes they too can invite.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

If these private institutes in America, whose standards are not known to us, have the right to invite students from Ceylon, why not the Soviet institutes—

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

Why not?

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

— have the right to invite deserving students for higher studies in the Soviet Union? That is apart from the scholarships they offer willingly to the Government of Ceylon. Merely

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

because they have no private institutes in the Soviet Union it is no argument to say that they should not have the same diplomatic privileges that other governments have. Why do you restrict such scholarships ?

This year the selection was only for engineering. For economics, planning or other general sciences you refused to allow deserving students to accept scholarships. The scholarships were confined only to one particular branch of science. In regard to such subjects as planning, economics, geography and so on, why should they not have the same right as institutes in the U. S. A. or the U. K. to invite students, allowing the Education Department to select them ?

I think that is discriminatory and the Prime Minister should go into the question seriously and consider whether the fact that there are no private institutes in the Soviet Union the fact that the entire higher and secondary education in the Soviet Union is State organized and is a State responsibility, should be a reason for this discrimination.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்சி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

ගරු සභාපතිතුමනි, මෙම වැය ශීර්ෂය යටතේ පොලිස් දෙපාර්තමේන්තුව ගැන වචන ස්වල්පයක් කතා කරන්නට මා බලා පොරොත්තු වෙනවා. පොලීසිය පිළිබඳ ව කරුණු සොයා බැලීමට බස්නායක මහතා ගේ නායකත්වයෙන් කොමිසමක් පත් කර තිබුණ බව අප දන්නවා. එහෙත් පොලිස් නිලධාරීන් බලාපොරොත්තු වුණු එක්තරා ප්‍රශ්නයක් එම කොමිසමෙන් විසඳී නැති බව කියන්නට ඕනෑ. එනම් ඔවුන්ගේ පඩි පිළිබඳ ප්‍රශ්නයයි. ඔවුන්ගේ වැටුප් පිළිබඳව එම කොමිසමෙන් තීරණ යක් නොවෙන බවයි පෙනෙන්නේ. පොලිස් කොස්තාපල්වරුන් සහ සාජන්ට් වරුන් වැනි උදවිය දවසේ පැය 24 ම වාගේ ඉතා අමාරුවෙන් රාජකාරියෙහි යෙදෙන බව අප දන්නවා. තමන්ගේ ජීවිත පවා අවදානම් තත්ත්වයක තබා ගෙනයි ඔවුන් සේවය කරන්නේ. මැරවරයන් ආදීන්ට මුහුණ දීමෙන් ජීවිත පවා නැති වූ අවස්ථා තිබෙනවා. ඒ නිසා ඒ අයගේ වැටුප් සම්බන්ධව මේ අවස්ථාවේදී අගමැති තුමාගේ අවධානය යොමු කළ යුතුව තිබෙනවා. ඔවුන් ලබන වැටුප අඩු වීම නිසා පොලිස් නිලධාරීන් නොයෙකුත් දූෂණ වැඩ වලට පෙළඹෙනවා. සමහර පොලිස් නිලධාරීන්ගේ පවුල්වල ළමයින් හත් අට දෙනා ඉන්නවා. එම පවුල් නඩත්තු කර ගැනීමට පුළුවන්කමක් නැති නිසා ඒ අය නොයෙකුත් දූෂණවලට පෙළඹෙනවා. පොලිස් සේවයටය කියා උත්පත්ති පාලනයක් නැහැ නෙ. දවසින් දවස පවුලේ සංඛ්‍යාව වැඩි වෙනවා. එනිසා අද තිබෙන තත්ත්වය කුමක්ද ?

ඒ වාගේම පිටිසර ප්‍රදේශවල පොලිස් නිලධාරීන්ට ඉන්න ස්ථානයක් නැහැ. අද හක්මන පොලීසියෙ පොලිස් නිලධාරීන් ගේ ගෙවල් හරක් ගාල් වාගෙයි. ඔවුන්ට සිදු වී තිබෙන්නේ ගෙවල් බදු ගෙන සිටීමටයි. ඉතින් බදු කුලිත් ගෙවමින් තම පවුල් නඩත්තු කර ගෙන යෑමට මේ සුළු වැටුපෙන් පුළුවන්කමක් නැති නිසා ඔවුන් නොයෙක් දූෂණවලට පෙළඹෙනවා. හදිස්සියේ ලොරියක් අල්ලාගන්නවා ; එහෙම නැත්නම් වෑන් එකක් අල්ලාගන්නවා ; මොකක් හෝ අල්ලාගෙන කීයක් හරි ගනු දෙනුවක් බලාපොරොත්තු වෙනවා. එසේ නොකළොත් ඔවුන්ට ජීවත් වෙන්නට විධියක් නැහැ. ඒ නිසා ඔවුන් ඒ තත්ත්වයෙන් මුදා ගැනීමට යම්කිසි වැඩපිළිවෙළක් සකස් කරන්න ඕනෑ. දැන් රජයේ සේවකයන්ට අලුතෙන් පඩි වැඩි වෙනවා හා සමග ම පොලිස් නිලධාරීන්ගේ වැටුප් ගැනත් විශේෂ සැලකිල්ලක් දක්වනවා ඇතැයි මා විශ්වාස කරනවා.

තවද, තමන් සේවය කරන පොලිස් මධ්‍යස්ථානයේ පදිංචිය සඳහා ඔවුන්ට ගෙවල් දෙන්න ඕනෑ. දැන් පළාත් පාලන ඇමතිතුමාගේ අලුත් ගෙවල් ක්‍රමයක් තිබෙනවා. රුපියල් 5,000 කට 6,000 කට ගෙයක් ගොඩ නඟාගන්නට පුළුවන්කම තිබෙනවා. අන්න ඒ විධියේ ගෙවල්වත් ඒ පොලිස් නිලධාරීන්ට ලබා දෙනවා නම් ගෙවල් සඳහා දැනට ඔවුන්ට ගෙවන්නට සිදු වී ඇති බදු මුදල් ඉතුරු වෙනවා ඇති. හක්මන පොලිස් මධ්‍යස්ථානය අද සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

සිදු වී ඇති තත්ත්වයකයි තිබෙන්නෙ. හක්මන ගරු මන්ත්‍රීතුමාත් (හෙට්ටිගේ මයා.) ඒ කාරණය ගැන මා සමඟ එකඟ වෙනවා ඇති. අද ඒ පොලිස් මධ්‍යස්ථානය භාර පරීක්ෂක මහත්මයාට ඉන්න සිදු වී තිබෙන්නේ ගෙයක් බද්දට අරගෙනයි. බොහොම පරණ ගොඩනැගිල්ලක් නිසා පොලිස් නිලධාරීන්ට එම මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ ජීවත් වන්නට බැහැ.

අනික් කාරණය සභාපතිතුමනි, පිටරට තානාපති කාර්යාලවල සේවය කරන ලාංකිකයන් ගැනයි. එය ඉතාම වැදගත් ප්‍රශ්නයක්. ඒ මක්නිසාද? පිටරට තානාපති කාර්යාල ගැන බලන විට, නොයෙක් නොයෙක් රටවල ජීවන තත්ත්වය වෙනස්. අපේ පඩි ක්‍රමය අනුව ඒ සමහර තානාපති කාර්යාලවල සේවය කරන අයට ජීවත් වන්නට බැරි තත්ත්වයක් තිබෙනවා. රාජ්‍ය ඇමතිතුමා මා සමඟ එකඟ වෙනවා ඇති. දැන් ඇමෙරිකා එක්සත් ජනපදයේ සේවය කරන අය සම්බන්ධව කල්පනා කර බැලුවොත්, වෛද්‍යවරයෙක් ගෙදරට කැඳවීමේ දී එක වරකට රුපියල් දහක් පමණ—ලංකාවේ මුදල්වලින් රුපියල් දහක් පමණ—ගෙවන්න ඕනෑ. They have to pay about Rs. 1,000 for a single visit by a doctor. ඒ විධියේ තත්ත්වයක් යටතේ සි පිටරට වල සේවය කරන ලාංකික නිලධාරීන්ට සේවය කරන්න සිද්ධ වී තිබෙන්නේ.

ඒ වාගේම ඒ රටවල සේවය කරන අයට තමන්ගේ මෝටර් රථයෙන් ගමන් කිරීමේ තත්ත්වයක් නැහැ. ඇමෙරිකා එක්සත් ජනපදයේ සේවය කරන අයට සිදු වී තිබෙන්නේ බස්වලින් ගමන් කරන්නයි. ඊටත් වඩා පුදුම චක්‍රලේඛයක් ගැන, මට දැන ගන්න ලැබුණා. පිටරට තානාපති කාර්යාලයක සේවය කරන යම් කිසි කෙනෙක් මරණයට පත් වුණොත් ඒ තැනැත්තාගේ ශරීරය එම්බාම් කිරීම ආදී සියලුම කටයුතු නිම කොට තමන්ගේ රටට එවන්නේ රජයේ වියදමෙනුයි. එහෙත් එහිදී ආදාහන කටයුතු කර අලු ටික ගෙන්වා ගන්නේ නම් එය කළ යුත්තේ තමන්ගේ වියදමෙනුයි. මේක පුදුම චක්‍ර ලේඛයක්. එම්බාම් කිරීම ආදී සියලු කටයුතු කර මෘත ශරීරය එවන්නේ නම් එය රජයේ වියදමින් කරනවා: නමුත් අලු ගෙනෙන විට තමන්ගේ වියදමින් ගේන්න ඕනෑ. එම නිසා මේ ආදී සියලුම කටයුතු සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර, පිටරට තානාපති කාර්යාලවල සේවය කරන අයට තමන්ගේ තත්ත්වය රැකගෙන එම සේවය කිරීමට හැකි වනු පිණිස ඔවුන්ගේ වැටුප් පිළිබඳවත් සංශෝධනයක් ඇති කළ යුතුව තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කියන්න තිබෙන්නේ එපමණයි. ඒ වගේම තානාපති සේවයේ මාරුවීම් සම්බන්ධයෙනුත් නොයෙකුත් අවස්ථාවලදී අපට නොයෙකුත් කරුණු දැනගන්න ලැබී තිබෙනවා. ඒ නිසා තානාපති සේවයේ මාරුවීම් සම්බන්ධයෙනුත් අලුත් වැඩපිළිවෙලක් යෙදීමට කාලය පැමිණ තිබෙන බව මා මතක් කරන්න ඕනෑ.

අ. භා. 7.30

ඩී. එම්. ටී. බණ්ඩාර මයා. (වාරියපොල)
(திரு. டீ. எம். ரீ. பண்டா—வாரியபொல)
(Mr. D. M. T. Bandara—Wariyapola)

ගරු සභාපතිතුමනි, මගේ ආසනයේ තිබෙන පොලිස් ස්ථානවල ඇති අඩුපාඩු කම් කිහිපයක් ගැන වචන ස්වල්පයක් කතා කිරීමට මාත් මේ අවස්ථාවේදී බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම මගේ ආසනයේ තිබෙන හෙට්ටිපොල සහ වාරියපොල පොලිස් ස්ථානවල සිටින පොලිස් කොස්තාපල්වරුන්ට සහ පොලිස් පරීක්ෂකවරුන්ට නිවාස පහසුකම් ඇත්තේම නැහැ. ඒ අයට නිවාස සොයා ගැනීමේ දී මහත් අමාරුකම්වලට මුහුණ පාන්න සිදු වෙනවා. ගම්බදව සිටින අයට හොඳ නිවාස සාදා කුලියට දීමට පුළුවන් කමක් නැහැ. ඒ නිසා සමහර පොලිස් නිලධාරීන් වාසය කරන්නේ කුකුළු කූඩු වැනි නිවාසවලයි. එම නිවාස සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කර ගැනීමට හොඳ ඒවා නොවෙයි. ඔය හේතුව නිසා එම නිලධාරීන්ට විශාල කරදරයක් ඇති වී තිබෙනවා. මේ කාරණය ගැන ගරු අගමැතිතුමාගේ අවධානය යොමු කරවීමට මා බලාපොරොත්තු වෙනවා.

ඊළඟට ගරු සභාපතිතුමනි, වාරියපොල පොලිස් ස්ථානය උසස් ශ්‍රේණියේ පොලිස් ස්ථානයක් බවට පත් කළ යුතුය කියා නිර්දේශ කර දැනට අවුරුදු 15 ක් පමණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙනවා. එහි නිලධාරීන් 12 කට නැත්නම් 14කට වඩා සේවය කරන්නේ නැහැ. කොට්ඨාශ 4 ක ජනතාවක් —75,000 ක පමණ ජනගහනයක්—මේ පොලිස් ස්ථානයේ පාලනයට අසු වෙනවා. මේ තරම් විශාල ජනකායක් පාලනය කිරීම මේ පොලිස් ස්ථානයට අමාරුයි. ඒ නිසා අපරාධ බොහොම ශීඝ්‍රයෙන් වැඩි වී තිබෙන බවක්ද පෙනෙනවා. මහජන පැමිණිලි ලැබෙන අන්දමට එම පැමිණිලි අනුව කටයුතු කිරීමට අපහසු තත්ත්වයක් ඇති වෙනවා. සමහර පැමිණිලි විභාග කිරීමට සති ගණන් ගත වෙන බවක් පෙනෙනවා. එයට හේතුව නිලධාරීන් සුළු පිරිසක් සිටීමයි. නියම වේලාවට පැමිණිලි විභාග කිරීමට නොහැකි වන්නේ ඒ නිසයි. ඒ නිසා මහජනයා තුළ සැකයක් ඇති වෙනවා. පැමිණිල්ලක් ඉදිරිපත් කර දවසක් නැත්නම් දෙකක් ඇතුළතදී ඒ පැමිණිල්ල විභාග නොකළොත් මහජනයාට පොලිසිය ගැන සැකයක් ඇති වෙනවා. පැමිණිලි පැත්තෙන් හෝ විත්ති පැත්තෙන් යම්කිසි සන්තෝසමක් ගත්තාය කියා සැකයක් ඇති වෙනවා. එවැනි සන්තෝසමක් ගැනීම නිසා විභාග කිරීම ප්‍රමාද වෙනවාය කියා මහජනයා සිතනවා. ඒ නිසා මා ඉල්ලා සිටිනවා මේ 75,000 ක පමණ පිරිසක් පාලනය කරන වාරියපොල පොලිස් ස්ථානය උසස් තත්ත්වයකට පත් කරන්නය කියා. ඒ සඳහා ඉක්මනින්ම කටයුතු කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

අනික් ප්‍රශ්නය නම් මේ පොලිස් ස්ථාන වලට දී තිබෙන වාහන සම්බන්ධයෙනුයි. මේ වාහනවලට සීමා සහිත පෙට්‍රල් ප්‍රමාණයකුයි දෙන්නෙ. එම නිසා මේ වාහන පාවිච්චි කිරීම සමහර විට දවස් 5 කට පමණ සීමා වෙනවා. ඔය හේතුව නිසාත් පැමිණිලි විභාග කිරීමට යාම ප්‍රමාද වෙනවා. සමහර විට ගම්බදව තිබෙන යම් යම් ප්‍රදේශ පොලිස් ස්ථානයේ සිට සැතපුම් 30 ක් 35 ක් පමණ ඈත වෙන්න පුළුවනි. මෙවැනි අවස්ථාවලදී පැමිණිලි පක්ෂය විසින් හෝ විත්ති පක්ෂය විසින් ගෙන එන වාහනයක පොලිස් නිලධාරීන් ඒ ස්ථාන කරා යනවා. මෙය රාජකාරියේ යෙදී සිටින නිලධාරීන්ගේ වරදක් නිසා සිදු වන දෙයක් නොවෙයි. මෙයිනුත් සිදු වන්නේ යම්කිසි සැකයක් මහජනයා තුළ ඇති වීමයි. පැමිණිලි පක්ෂය විසින් ගෙන එන කාර් එකක පොලිස් නිලධාරීන් ගියහොත් විත්ති පක්ෂය තුළ සැකයක් ඇති වෙනවා. විත්ති පක්ෂය විසින් ගෙන එන ලද කාර් එකක ගියහොත් පැමිණිලි පක්ෂයට යම්කිසි සැකයක් ඇති වෙනවා. පොලිස් නිලධාරීන් ඒ විධියට ඒ අය ගෙන එන වාහනවල යන්නේ රාජකාරිය ඉක්මනින් කරන්න ඕනෑ නිසයි. නමුත් මහජනයා තුළ ඒ නිසා පොලිසිය කෙරෙහි අප්‍රසාදයක් ඇති වෙනවා. පැමිණිල්ල ගෙන ආ අයගේ කාර් එකක පොලිස් කොස්තාපල්වරුන් ගිය හොත් විත්ති පක්ෂය සිතන්නේ පැමිණිලි පක්ෂය විසින් යම්කිසි සන්තෝසමක් දීම නිසා ඒ අයට වාසි වන විධියට පැමිණිල්ල විභාග කරන බවයි. ඔන්න ඔය සැකය දුරු කරන්න නම් පොලිස් නිලධාරීන්ට අවශ්‍ය තරමට එම ජීප් රථවලට පෙට්‍රල් ප්‍රමාණයක් සපයා දෙන්න ඕනෑ. නගරබදව නම් එවැනි සීමාවක් නැහැ. එමෙන්ම නගරබද පොලීසිවලට වාහන හුඟක් තිබෙනවා; මෝටර් සයිකල් ආදියත් තිබෙනවා. එහෙත් ගම්බද පොලිස් ස්ථානවල ඇති එකම ජීප් රථයට පෙට්‍රල් සීමා කිරීම හොඳ නැහැ. ඒ නිසා එසේ සීමාවක් ඇති නොකරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, වාරියපොල කොට්ඨාශයේ කටුපොතට පොලිස් ස්ථානයක් දීමට 1966 දී තීරණය කළා. එහෙත් තවමත් එම පොලිස් ස්ථානය පිහිටුවා නැහැ. ඒ නිසා දිනෙන් දින අපරාධ සංඛ්‍යාව වැඩි වෙනවා. මිනීමැරුම්, සියදිවි නසාගැනීම් ආදිය වැඩි වෙනවා. ඒ නිසා කටුපොත පොලිස් ස්ථානය ඉක්මනින් පිහිටුවන ලෙස මා ඉල්ලා සිටිනවා. එය ප්‍රමාද වීම මහජනයාගේ අප්‍රසාදයට හේතු වී තිබෙනවා.

ඊළඟට සඳහන් කරන්නට තිබෙන්නේ පොලිස් නිලධාරීන්ගේ වැටුප සම්බන්ධයි. ඒ ගැන කලින් කථා කළ මන්ත්‍රීතුමාගේ අදහස්වලට මා එකඟ වෙනවා. පොලිස් නිලධාරීන්ට ලැබෙන්නේ ඉතා සුළු වැටුපක්. ඒ නිසා ඔවුන් මහජනයාගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. එම්. පී. බණ්ඩාර මයා.]

සෑකයට භාජන වෙනවා. ඒ නිසා පොලිස් කොස්තාපල්වරුන්ට හා සාජන්ට්වරුන්ට සෑහෙන වැටුපක් දිය යුතුව තිබෙනවා. එක අතකින් ජීවන වියදම වැඩියි; අනික් අතින් ඔවුන් ඉන්නේ මහජනයාගේ ආරක්ෂකයින් හැටියටයි. ඒ නිසා ඒ අයට දැනට වඩා වැඩි වැටුපක් දෙන්නට ඕනෑ. එංගලන්තයේ පොලිස් කොස්තාපල් කෙනෙකුගේ පඩිය සමඟ ලංකාවේ පොලිස් කොස්තාපල් කෙනෙකුගේ පඩිය සසඳන විට ලංකාවේ පොලිස් කොස්තාපල්ගේ පඩිය අඩුයි කියා පොලිස් නිලධාරියෙක් කියා තිබෙනවා මා පුවත්පතකින් දැක්කා. පොලිස් නිලධාරීන්ට මීට වඩා හොඳ වැටුපක් දෙනවා නම් ඔහුට ඔහුගේ පවුල සැපවත් කර ගන්නට පුළුවන් වෙනවා. පොලිසියේ සුළු නිලධාරීන් හුඟක් දුකසේ ජීවත් වන කොටසක්. එස්. පී., ඒ. එස්. පී. වැනි තනතුරුවල සිටින අයට නම් නිවාස පහසුකම් ආදියත් සපයනවා. එහෙත් මහජනයා සමඟ සම්බන්ධකම් පවත්වන කොස්තාපල්වරුන්ට සැලකිය යුතු වැටුපක්වත් ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඒ අයටත් දැනට වඩා වැඩි වැටුපක් ලබා දෙන්නය කියා මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, එපමණයි කියන්නට තිබෙන්නේ. මේ වචන ස්වල්පය කථා කිරීමට මට අවස්ථාව ලබා දීම ගැන තමුන්නාන්සේට ස්තුතියි.

වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාතන් (නල්ලූර්)

(டொக்டர் ஈ. எம். வீ. நாகநாதன்—நல்லூர்)

(Dr. E. M. V. Naganathan—Nallur)

I wish to take this opportunity to point out one or two matters. The first is that there is a great defect as far as our Parliament is concerned in that we do not have more Debates on foreign affairs. It is only on an occasion like this when we have a Committee stage of the Budget that we get a little time perhaps to speak on foreign affairs. In other Parliaments the Minister in charge—in this case the Prime Minister—makes a statement on foreign affairs at least quarterly and thereafter the House adjourns, and on resumption a general debate takes place on foreign affairs. In Ceylon today the only people who seem to be interested in foreign affairs are those who are not interested in Ceylon, but are interested in Russia or China. They are the people who take an interest in foreign affairs, or talk about foreign affairs in this country.

I feel that the Hon. Prime Minister should make a statement on foreign affairs once in three months or so; the House should then adjourn and, on resumption, there should be a general Debate on the matter. This will give an opportunity to all hon. Members who are interested in Ceylon to discuss and study the question of foreign affairs. It is a very important matter for a small country like Ceylon and its Members of Parliament to know what is happening in the world and take some interest in the matter because our country is not isolated—we are in the world.

Secondly, there is an amendment to the effect that the Vote be reduced by Rs. 10 in respect of sub-head 1, item "Parliamentary Secretary". That is no reflection on the hon. Parliamentary Secretary. We want only to mention the fact that the Prime Minister is over-burdened with work. He is not only the Prime Minister and Minister of Defence and External Affairs, but also the Minister for all internal affairs in this country. He is overworked. The capable Parliamentary Secretary has not got enough work to do in that department. I think some portion of the work should be assigned to him because he has a very subtle, clever and quick mind, and is willing to handle any work. A certain portion of the work should be given to him.

There is also an amendment that the Vote be reduced by Rs. 10 in respect of sub-head 1, item "Permanent Secretary". I think he is a man we must all sympathize with, for just as the Prime Minister has a great deal of work to do his poor Permanent Secretary too has a terrible amount of work to do. In

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

fact, he looks haggard. Just now he is looking well because he has had a short holiday in Belgrade. I think some arrangements must be made to see that the Prime Minister is relieved of some of the work he is presently doing and at the same time it should also be seen to that his Permanent Secretary is not overburdened with work. He cannot cope with all the work he is called upon to do.

Now, on the question of criticism made in regard to scholarships I am partly inclined to suuport the statement of the hon. Member for Akuressa, the chief of the Communist Party in Ceylon, Moscow directed. He asked why we should not be more lavish or liberal in allowing young people to go out in scholarships? How does the Government of Russia know who are the deserving students here in Ceylon? They cannot know it. If the U. K. has selected on their own accord any students for scholarships that is not correct. But no foreign country can select deserving students in Ceylon. They will not know who are the deserving students in Ceylon; they are not competent to decide who are the deserving students. The only thing is that our Education Department should be more impartial and more factual in selecting the students. I am afriad that there is a lot of wire-pulling in the Education Department. That is a fact, but the decision must be made in Ceylon as to who is a deserving student.

නුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

ගරු සභාපතිතුමනි, පොලිස් හමුදාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් කීප දෙනකුම කථා කළා. පොලිස් හමුදාවේ විශේෂ වෙනස්කමක් ඇති වී තිබෙන බව මාත් මතක් කරන්නට කැමතියි. පොලිස් හමුදාවේ පහළ පෙළේ නිලධාරීන්—පොලිස් කොස්තාපල්වරුන්—දවසේ පැය 24 ම වැඩ කරමින් උසස් සේවයක් ඉෂ්ට කරනවා. ඒ සාමාන්‍ය පොලිස් නිලධාරීන්ට ලැබෙන වැටුප ප්‍රමාණවත් නැතැයි ගරු මන්ත්‍රීවරුන් කීප දෙනකු විසින්ම සඳහන් කරන්නට යෙදුණු අදහස මාත් අනුමත කරනවා. නිවාස අතිනුත් ඒ උදවියට අමාරු තත්ත්වයක් පවතිනවා. ඒ නිසා ඔවුන්ගේ සේවා තත්ත්වය සම්බන්ධයෙන්, වැටුප් සම්බන්ධයෙන්, නිවාස සම්බන්ධයෙන් සැහෙන වෙනසක් කිරීමට දැන් කාලය පැමිණ තිබෙන බව මා සඳහන් කරන්නට කැමතියි.

මේ පොලිස් නිලධාරීන්ට වෘත්තීය අයිතිවාසිකම් දීම ගැන මේ රජය සලකා නොබලන්නේ මන්දැයි මා අහන්නට කැමතියි. මේ රජය එදා වෘත්තීය අයිතිවාසිකම් දෙන්නට පොරොන්දු වුණා පමණක් නොව රජයේ සේවකයන්ට දේශපාලන අයිතිවාසිකම් දෙන්නටත් පොරොන්දු වුණා. ඒ නිසා අඩු ගණනේ පහළ ශ්‍රේණියේ පොලිස් නිලධාරීන්ටවත් වෘත්තීය සමිති අයිතිවාසිකම් දීමට මේ රජයට යුතුකමක් තිබෙනවා. එය අවශ්‍ය කටයුත්තක්.

පොලිසියේ දරුණු ක්‍රියා සැහෙන තරම් අඩු වී තිබුණත් තවමත් සුළු සුළු කාරණා සිදු වෙනවා. සාමාන්‍ය මහජනයාගේ ගෞරවයට හේතු නොවන යම් යම් දේවල් සිදු වෙනවා. සාමාන්‍ය මහජනයාගේ ගෞරවයට හේතු නොවන යම් යම් ප්‍රකාශ කරන නිලධාරීන් තවමත් පොලිස් දෙපාර්තමේන්තුවේ සිටිනවා. ගන්දර පොලිසිය ගැන මා විශේෂයෙන් සඳහන් කරන්නට කැමතියි. ඒ පොලිසියේ පරීක්ෂක මහතා සම්බන්ධ සිද්ධීන් දෙකක් මා දන්නවා. මා නියෝජනය කරන කොට්ඨාශයේ කොකාවල එක්තරා තරුණයකුට විරුද්ධව පැමිණිල්ලක් ඉදිරිපත් වී තිබෙනවා යයි කියමින් ඒ තරුණයා පොලිසියට යා යුතු බව පොලිස් පරීක්ෂක තැන ඒ තරුණයාගේ ගෙදරට පැමිණ කියා තිබෙනවා. ඒ පොලිස් පරීක්ෂක තැන ඒ තරුණයාට ඇඳගන්නටවත් ඉඩ නොදී ගෙදරට ඇඳගෙන සිටි සරම පිටින්ම පොලිස් ජීප් රථයේ දමා ගෙන ගියා. හැබැයි, කෙළින්ම ඒ තරුණයා ගෙන ගොස් තිබෙන්නේ මඟුල් ගෙදරකටයි. එහි තිබුණු හැම වැඩක්ම වාගේ කරවාගෙන ඒ මනුෂ්‍යයාටත් මඟුල් ගෙදරින්ම කන්නට දී තිබෙනවා. ඒ

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

තරුණයා බොහොම නොකැමැත්තෙනුයි, මහුල් ගෙදරින් කා නිබෙන්නේ. ආරාධනයක් නොලැබුණු තැනකට මෙවැනි තරුණයකු කැඳවාගෙන ගොස් කන්නට දීම කොයි තරම් අසාධාරණයක්ද? ආත්ම ගෞරවයක් ඇති ගම්බද තරුණයන් ආරාධනයක් නැතිව මහුල් ගෙවල්වලට ගොස් කන්නේ නැහැ. අන්තිමේදී හරි හැටි ඇඳුමක් නැතිව මේ තරුණයාට මහ පාරේ එන්නට සිදු වුණා. ඔහු ගෙන ගියේ ජීප් රථයෙන්. එහෙත් ඔහුට ආපසු එන්න වුණේ පයින්. ඔහුට පයින් එන්නට සිදු වූ නිසා කිට්ටුව තැනකින් ණයට මුදලක් ලබාගෙන කඩයකට ගොස් මේස් බැනියමක් අරගෙන ඇඳගෙන එන්නට ඔහුට සිදු වුණා. එමෙන්ම තවත් කාන්තාවක් පොලිස් ජීප් රථයකට නංවාගෙන කෙලින්ම පොලීසියට අරගෙන යන්නේ නැතිව වෙන ස්ථානයකට අරගෙන ගොස් පැය බාගයක් පමණ ප්‍රමාද වෙලයි පොලිසියට අරගෙන ගොස් තිබෙන්නේ. ඒ නිසා ගන්දර පොලිසියේ සිටින මේ නිලධාරියාගේ ක්‍රියා කලාපය ගැන විශේෂ පරීක්ෂණයක් කරන්නය කියා මා ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, සඳහන් කළ යුතු තවත් කරුණක් තිබෙනවා. යම් පැමිණිල්ලක් සඳහා හෝ සාක්ෂියක් දීමට හෝ පොලිස් ස්ථානයකට යන කෙනෙකුට වාඩි වෙන්නට තිබෙන්නේ බංකු. එය අධිරාජ්‍යවාදී කාලයේ සිට පැවැත එන දෙයක්. හැම දෙපාර්තමේන්තුවක්ම මහජනයාට වාඩි වෙන්න පුටු සපයනවා නම් පොලිසියට පමණක් බැරි ඇයි කියා අහන්නට කැමතියි. පොලිසියට මන්ත්‍රීවරයෙක් ගියොත් නම් සමහර විට පුටුවක් ලැබෙන්නට පුළුවන්. එහෙත් සාමාන්‍ය පුරවැසියෙක් ගියොත් ලැබෙන්නේ බංකුවක්. පොලිස් නිලධාරියා පුටුවක වාඩි වී සිටිනවා; පැමිණිලිකාරයාට ලැබෙන්නේ බංකුවක්. ඒ තත්ත්වය වෙනස් කිරීම අවශ්‍ය වී තිබෙනවා. මහජනයාගේ පහසුව සැලසීමත් මහජනයාගේ ආත්ම ගෞරවය ආරක්ෂා කිරීමත් යන කරුණු ගැන සලකා ලංකාවේ පොලීසිවලින් සම්පූර්ණයෙන්ම බංකු ඉවත් කර මහජනයාට වාඩි වෙන්නට පුටු සපයන ලෙස මා ඉල්ලා සිටිනවා.

අ. භා. 7.45

එමෙන්ම ගරු සභාපතිතුමනි, 1966 රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණය ගැන තමුන්නාන්සේ දන්නවා. මේ කුමන්ත්‍රණය සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමට එල්. ඩී. පොඩි අප්පුහාමි හෙවත් දොඩම්පෙ මුදලාලි, කෝපරල් තිලකවර්ධන වැනි අය පොලීසියට අරගෙන ගියාට පසුව එහි දී මියගිය අන්දම ගැනත් තමුන්නාන්සේ දන්නවා. ඒ කාරණය සම්බන්ධයෙන් වින්සන්ට් ස්වර්ණාධිපති මහේස්ත්‍රාත්වරයා වරක් තීන්දුවක් දුන්නා එය සියදිවි නසා ගැනීමක්ය කියා. එහෙත් තවත් විභාගයකින් පසුව කිව්වා එය මිනී මැරුමක්ය කියා. ඒ තීන්දුවෙන් පසුව පුවත්පත්වල පළ වී නිබුණා පොලිස් දෙපාර්තමේන්තුවේ——

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

යටියන්තොට ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය එන්. එම්. පෙරේරා) ඔය කාරණය ඉදිරිපත් කළා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

රු. 18,962.50 ක් වියදම් කිරීම පිළිබඳ ප්‍රශ්නය ඉදිරිපත් කළාද?

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

ඔව්. මම ඊට පිළිතුරු දෙන්නම්.

තුඩවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

එහෙම නම් මා එය නැවතත් සඳහන් කරන්නේ නැහැ.

තවත් කරුණක් තිබෙනවා. මේ ආණ්ඩුව තවම ප්‍රජාතන්ත්‍රවාදී ජර්මන් ජනරජය සමග සම්පූර්ණ තානාපති සම්බන්ධකම් පවත්වාගෙන නැහැ. එහෙත් බටහිර ජර්මනිය සමග මේ රජය තානාපති සම්බන්ධකම් ඇතිව කටයුතු කරනවා.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ප්‍රජාතන්ත්‍රවාදී ජර්මන් ජන රජය මේ රටේ කාර්මික සංවර්ධනය සඳහා සැහෙන අන්දමේ ආධාර උපකාර කළ රටක්. ගරු අගමැතිතුමාගේ ජන්දදායක කොට්ඨාශයේ තුල්හිරියෙහි පිහිටුවන ලද, අග්නි දිග ආසියාවේ විශාලම පේසකර්මාන්ත ශාලාවත් ප්‍රජාතන්ත්‍රවාදී ජර්මන් ජන රජයේ ආධාරයක්. අපේ රටේ කාර්මික සංවර්ධනය සඳහා මේ විධියේ ආධාර කරන රටක් සමග මේ රජය සම්පූර්ණ තානාපති සම්බන්ධකම් ඇති කර නොගන්නේ මන්දැයි ගරු අගමැතිතුමාගෙන් මා අහනවා.

අන්නාමලෙයි මයා.
(திரு. அண்ணாமலை)
(Mr. Annamalay)

I should like to bring to the notice of the Hon. Prime Minister a matter regarding the Indo-Ceylon Pact of of 1964. The Indian Government has given citizenship to about 44,000 people on the ratio of 7 : 4, and the Ceylon Government should have given citizenship to nearly 22,000 people. I think so far only about 800 odd people have been given Ceylon citizenship. So the speed at which the Ceylon Government is setting about this matter will not help to expedite the implementation of the pact. Therefore, I hope the Hon. Prime Minister will take steps to see that this work is done more expeditiously.

There is another matter. As far as inquiries are concerned, all the applicants are asked to come to Colombo from distant outstations such as Badulla. These applicants are put to a great deal of inconvenience. Therefore, it would be better if arrangements are made for these inquiries to be held either in the district or in the province concerned. These workers have sometimes got to start a day or two earlier in order that they may come to Colombo, locate the offices and attend the inquiries. After the inquiry is over they get back at much expense to themselves. This is a matter which I should like to bring to the notice of the Hon. Prime Minister. I should be glad if he would see that these inquiries are also held as inquiries were held in the past in respect of the Indian and Pakistani Residents (Citizenship) Act. Under that Act the inquiries were held on the estates when it was found that there was a large number of applicants from individual estates. It will help these poor labourers a great deal if such an arrangement can be made.

With regard to suspected illicit immigrants, I want to bring to the notice of the Hon. Prime Minister that we have found on several occasions that the same persons who have been remanded either in the Slave Island detention camp or in other camps and released after inquiries, are repeatedly being arrested by the police on other occasions. I do not know whether the Hon. Prime Minister is aware of it. There were a number of instances in which we had to take the matter up either with the police authorities or with the Controller of Immigration and Emigration himself. They have the right to inquire, and they have the right to detain these people as long as they wish, but once inquiries are over and these people are released, I do not see why these poor people should once again be harassed in this way. I do not know what the motive behind this is. It is said that some people even demand money and these people have to keep on paying money in order to avoid this harassment. I wish to bring this matter too to the notice of the Hon. Prime Minister.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ගරු සභාපතිතුමනි, යුද්ධ හමුදාවේ පවත්නා අසහනයන් කිපයක් ගැන මෙම වැය ශීර්ෂය යටතේ කරුණු ඉදිරිපත් කරන්නට මා අදහස් කරනවා. යුද කඳවුරුවල සිටින සෙබළුන්ගේ ජන්ද ලැයිස්තු සකස් කිරීමට එහි නිළධාරීන් බැඳී සිටිනවා. එහෙත්, අපට ලැබී තිබෙන ආරංචියේ හැටියට ඒ සඳහා එම නිළධාරීන්ගේ සම්පූර්ණ සහයෝගය මැතිවරණ නිළධාරීන්ට ලැබෙන්නේ නැහැ. එකී සෙබළුන් තම තමන්ගේ නිවෙස්වල නොසිටීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

සිටින නිසා—කඳවුරුවල සිටින නිසා—ඔවුන්ගේ ඡන්ද බලය නැති වී යාම පිළිබඳව පැමිණිලි කිපයක් ලැබී තිබෙනවා. මැතිවරණ නිළධාරීන් කරන්නේ කඳවුරු භාර නිළධාරීන් ලවා ඡන්ද ලැයිස්තු සකස් කිරීමයි. එහෙත්, කඳවුරු භාර නිළධාරීන් ඒ කටයුත්ත යථා පරිදි නොකරන නිසා සෙබළුන්ගේ නම් ඡන්ද ලැයිස්තුවලට ඇතුළත් නොවීම ගැන පැමිණිලි රාශියක් ලැබී තිබෙනවා. ගරු අගමැතිතුමාටත් ඒවා යවා තිබෙන බව අපට ආරංචියි. එම නිසා, ඡන්ද ලැයිස්තු සංශෝධනය කිරීමේදී, සෙබළුන්ටත් ඔවුන්ගේ ඡන්ද බලය පාවිච්චි කිරීමට ඉඩ ලැබෙන අන්දමට කටයුතු කරන ලෙස මා මතක් කරනවා.

සෙබළ ජනතාව බොහෝ කාලයක සිටම —අපේ ආණ්ඩුව තිබෙන කාලයේ පටන්ම —ඔවුන්ගේ නොයෙකුත් අයිතිවාසිකම් ඉල්ලා රජයට කරුණු ඉදිරිපත් කළ බව අප කවුරුනුත් දන්නවා. එම නිසා, ඡන්ද බලයෙන් ආණ්ඩුවක් බලයට පත් කිරීමේ අයිතිවාසිකමද ඔවුන්ට ලබාදීම රජයේ යුතුකමක්.

බලය ලත් නිළධාරීන්ට හා සැරයන්වරුන්ට කොළඹ නේවාසිකාගාරයක් නැහැ. ඒ නිසා සමහර අයට පිට පළාත්වල සිට ඇවිත් සේවය කරන්නට සිදු වී තිබෙනවා. පදිංචිවීමේ පහසුකම් නැති නිසා බොහෝ දෙනකුට අඟුපිල්වල රාත්‍රී කාලය ගත කරන්නත් සිදු වෙනවා. නේවාසිකාගාරයක් පමණක් නොව ඒ අයට ආහාරාගාරයකුත් නැහැ. ජල පහසුකම් නැහැ. මේ ආදී වූ අපහසුකම් රාශියක් ගැන එම නිළධාරීන් පැමිණිලි කර තිබෙන බව අරංචියි. එම නිසා මේ තත්ත්වය ගැන සොයා බලා ක්‍රියා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ජ්‍යෙෂ්ඨත්වය ගැනත් දුක්ගැනවිල්ලක් තිබෙනවා. ගැමුණු සේවා බල ඇණිය, පාබල හමුදාව, ලංකා සිංහ රෙජිමේන්තුව යන හමුදා තුනේ සිටින සමහර උදවියට නීත්‍යානුකූලව තමන්ගේ ජ්‍යෙෂ්ඨත්වය ලැබෙන්නෙ නැහැ. 1950 මාර්තු මාසයේ 17 වැනිදා පළ කරන ලද ගැසට් නිවේදනයේ ඒ අය ගේ උසස් කිරීම් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගය පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා. එහි 34 වෙනි වගන්තිය බැලුවොත් උසස්වීම් කළ යුත්තේ කොහොමද යන්න ඔබතුමාට පෙනෙනවා ඇති. මෙන්න ඒ කොටස:

"Where a soldier is promoted to a rank, his seniority in that rank shall be determined by the date of his promotion to that rank, and, where two soldiers are promoted to the same rank on the same day, their seniority shall be determined by the date of their previous promotion."

විශේෂයෙන්ම මේ අනුව ක්‍රියා නොකරන බවට දුක්ගැනවිල්ලක් ඒ හමුදාවල සේවය කරන සෙබළුන් අතර පවතිනවා. ඒ වගේම පහළ ශ්‍රේණිවල උදවියට උසස්වීමේ පරීක්ෂණවලට පෙනී සිටින්නට සිදු වෙනවා. ඒවායේදී එක විෂයයට පෙනී සිට විභාගය සම්පූර්ණ කර ගැනීමේ අයිතිවාසිකම ඒ උදවියට නැහැ. එහෙත් උසස් ශ්‍රේණිවල අයට ඒ අයිතිවාසිකම තිබෙනවා. උසස් ශ්‍රේණිවල අයට උසස්වීමේ විභාගය කිහිප වරකින් සමර්ථ වන්නට පුළුවනි. අද එක විෂයයක් තවත් විෂයයක් ලබන අවුරුද්දේ ආදී වශයෙන් කිහිප වරක් එක් එක් විෂයයට පෙනී සිට ඔවුන්ට සමත් වන්නට පුළුවනි. එහෙත් පහළ ශ්‍රේණිවල උදවියට ඒ පහසුකම නැහැ. ඒ උදවියට එක විභාගයෙන් සමර්ථ වන්නට ඕනෑ. අසමත් වුණොත් නැවතත් සම්පූර්ණයෙන්ම විභාගය ගන්නට ඕනෑ. ඒ එක්කම උසස් ශ්‍රේණිවල අය විභාගයෙන් සමත් වුණාම උසස් ශ්‍රේණිවල පුරප්පාඩු නැතත් ඒ සමර්ථ වීම සැහෙනවා. අද විභාගයෙන් සමත් වුණා කියා අපි සිතමු. ඔවුන් පත් කරන්නට පුරප්පාඩු නැහැ. එහෙත් පුරප්පාඩු තිබෙන විට ඒ උදවිය පුරප්පාඩුවලට පත් කරනවා. එහෙත් පහළ ශ්‍රේණිවල අයට සිදු වී තිබෙන්නේ මේකයි. ඒ අය විභාගය සම්පූර්ණයෙන්ම එකවර සමර්ථ වන්නටත් ඕනෑ; සමර්ථ වුණත් ඒ අවස්ථාවේදී පුරප්පාඩු නැත්නම් නැවත පුරප්පාඩු ඇතිවන විට නැවතත් විභාගයට පෙනී සිට සමර්ථ වන්නටත් ඕනෑ. ඒ නිසා මේ අන්දමට පරස්පර විරෝධී විධියට මේ කොටස් දෙකට සංග්‍රහ කර තිබෙන නිසා ඒ ගැන සොයා බලන ලෙස මා ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම

ගරු සභාපතිතුමනි, හමුදාපතිට ඉහළින් කිසිම අභියාචනයක් ඉදිරිපත් කිරීමට මේ පහළ ශ්‍රේණිවල සෙබළුන්ට බලයක් නැති බව අපට දැන ගන්නට ලැබී තිබෙනවා. ඉහළ ශ්‍රේණිවල උදවියට නම් ලංකාණ්ඩු කාර උතුමාණන් වහන්සේ දක්වා අභියාචනා ඉදිරිපත් කිරීමට ඉඩ තිබෙනවා. මේ අයට ඉඩ තිබෙන්නේ හමුදාපති දක්වා පමණයි. ඒ නිසා හමුදාපතිගෙන් යම්කිසි සහනයක් නොලැබුණොත් ඒ අයට නිහඬව ඒ දුක විඳීමට සිදු වෙනවා. ඒ නිසා මේ උදවියටත් උසස් නිලධාරීන්ට තිබෙන අයිතිවාසිකම හෝ අඩු ගණනේ ස්පිර ලේකම්තුමාට නැත්නම් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේට අභියාචනා කිරීමට අවසරයක් තිබුණොත් හුඟක් දුරට මේ දුක්ගැනවිලි නිවාලන්නට පුළුවන් වෙයි කියා මා හිතනවා.

එකල්හි වේලාව අ. භා. 8 වූයෙන් මන්ත්‍රී මණ්ඩලයට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි: නැවත රැස්වීම 1969 අගෝස්තු 30 වන සෙනසුරාදා.

நேரம் பிற்பகல் 8 மணியாகிவிடவே, குழுவின் பரிசீலனைபற்றி சபைக்கு அறிவிக்கும் பொருட்டு அக்கிராசனர், அக்கிராசனத்திலிருந்து நீங்கினார்.

குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது ; மீண்டும் கூடுவது சனிக்கிழமை, 30 ஒகஸ்ட் 1969.

It being 8 P.M., the Chairman left the Chair to report Progress.

Committee report Progress ; to sit again on Saturday, 30th August 1969.

කල්තැබීම

ஒத்திவைப்பு

ADJOURNMENT

යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී:

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය".—
[ගරු ජේ. ආර්. ජයවර්ධන]

"சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக" [கௌரவ ஜே. ஆர். ஜயவர்தன] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு விஞ்ஞை எடுத்தியம்பப்பெற்றது.

Motion made, and Question proposed.

"That the House do now adjourn".—
[The Hon. J. R. Jayewardene.]

කල් තැබීම

එස්. ද එස්. ජයසිංහ මයා.
(திரு. எஸ். டி. எஸ். ஜயசிங்ஹ)
(Mr. S. de S. Jayasingha)

ගරු කථානායකතුමනි, මට ඉතා වැදගත් ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නට තිබෙනවා. මගේ ඡන්ද කොට්ඨාශයේ, මගේ ගමේ කළුබෝවිල නැගෙනහිරට අයත් පාමන්කඩ ශ්‍රී මහා විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේ නමක් වූ විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය කොටගම වාචිස්සර ස්වාමීන් වහන්සේ පසුගිය සතියේ අපවත් වුණා. ප්‍රවෘත්ති පත්‍රවල පළ වී ඇති වාර්තාවල හැටියටත්, ලැබෙන යම් යම් ආරංචිවල හැටියටත් අපට දැනගන්න ලැබී තිබෙන්නේ, එම ස්වාමීන් වහන්සේ යම්කිසි ශල්‍ය කර්මයකට භාජන වෙමින් සිටියදී අපවත් වී වදාළ බවයි. මේ සම්බන්ධයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන්, සැහෙන ප්‍රකාශයක් මාත්, රටවැසියනුත් බලාපොරොත්තු වෙනවා. මෙම ස්වාමීන් වහන්සේගේ මරණය පිළිබඳව විවිධ මත සෑම අංශයකින් පළ වී ඇති අතර "කොටගම වාචිස්සර හිමියන් මැරුණාද, මැරුවා ද" කියා ප්‍රශ්න කරමින් පත්‍රිකා වගයක්ද බෙදා හැර තිබෙනවා. මහජන කැළඹීමක් ඇති කිරීමේ අදහසින් මෙබඳු පත්‍රිකා බෙදා හැරියාදැයි කියන්න මා දන්නෙ නැහැ. රටේ සැහෙන ප්‍රසිද්ධියක් උසුලන, පණ්ඩිත ස්වාමීන්වහන්සේ නමක් වූ උන්වහන්සේ අවුරුදු ගණනාවක් තිස්සේ වැඩ සිටියේ අපේ ගමේ පන්සලේයි. කෙසේ හෝ වේවා, උන්වහන්සේගේ අපවත්වීම සම්බන්ධයෙන් සැහෙන ප්‍රකාශයක් කරන ලෙස ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටින අතරම යම්කිසි වරදක්, යම් දෝෂයක් කවුරුන් අතින් හෝ සිදු වී තිබෙනවාද නැද්ද යන කාරණය සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් ඇති කර ගැනීම පිණිස සැහෙන පරීක්ෂණයක් පවත්වන ලෙසටත්, ඒ පිළිබඳව කරුණු රටවැසියාට දැන ගැනීම පිණිස ප්‍රකාශයට පත් කරන ලෙසටත් ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation. noolaham.org | aavanaham.org

අ. භා. 8.01

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

ගරු කථානායකතුමනි, කොටගම වාච්ස්සර හිමියන්ගේ හදිසි අභාවය පිළිබඳ ව ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් පිළිතුරු බලාපොරොත්තුවෙන් කල් දී තිබෙන ප්‍රශ්නයක් දැන් ඉදිරිපත් කරන්න සතුටුයි. බෞද්ධ දර්ශනය වර්තමාන විද්‍යාත්මක යුගයට ගැළපෙන පරිදි විප්ලවීය ආකල්පයක් අනුව පරිවර්තනය කර දේශනා කළා වූද, මැටි පිළිමවලට වැඳීමෙන්, පන්සල්වලට ගොස් ඉටිපන්දම්, හඳුන්කූරු, පහන් පත්තු කිරීමෙන් නිවන් සම්පත් ලබාගැනීමට බැරි බව පමණක් නොව, බෞද්ධ දර්ශනය වටා ගෙතී ඇති දෙවියන් ඇදහීම වැනි මිථ්‍යා මතවලට එරෙහිව එඩිතර ප්‍රකාශයන් කළාවූද, අනේපිඬු සිටාණන් හෝ විසාකා සිටුදේවිය මෙන් ධනපතියන් වී ඉපදීමට, පුලුවන් තරම් දන් දීම යුතුකමකැයි බඹ ගින්නේ සිටින බෞද්ධ ජනතාවට දේශනා කිරීම විකාරයක් හැටියට පෙන්නුම් කළා වූද, මෑත කාලයේ පහළ වූ ශ්‍රේෂ්ඨ පඬිරුවනක් වන කොටගම වාච්ස්සර හිමිගේ හදිසි අභාවය—මිය ගිය ගරු අගමැති ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ ඝාතනය මෙන්ම—ඇමෙරිකන් මධ්‍යම ප්‍රවෘත්ති සංවිධානයේ—සී. අයි. ඒ—මෙහෙයවීම පිට ගත් තවත් බිල්ලක් ද යන සාධාරණ සැකය මෙරට බෞද්ධ ජනතාව තුළ ඇති වී තිබෙන බැවින් ඒ පිළිබඳ සොයා බැලීම සඳහා රජය විසින් අපක්ෂපාත කොමිසම් සභාවක් පත් කරනවාද?

ඊළඟට, ගරු තැපැල් හා විදුලි සංදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙන් පිළිතුරු බලාපොරොත්තුවෙන් කල් දී තිබෙන ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න සතුටුයි. එනම්, ලංකා කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් ඇන්. ෂන්මුගදාසන් සහෝදරයාගේ අංක 84346 දරන ටැලිපෝනය රහස් පොලීසියේ ඒ. එස්. පී., ඇල්. ඇම්. පී. ද සිල්වා මහතාගේ, කොල්ලුපිටියේ ගාලු පාරේ අංක 287 දරන, අම්. අයි. 5 කායර්‍යාලයට විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් නීති විරෝධි ලෙස පොලොව යට කේබලයක් මගින් සබන්ධකර, 84346 ටැලිපෝනයෙන් කෙරෙන සියලුම කථාබස්වලට සවන් දීමට කටයුතු පිළියෙළ කළ බව ඇමතිතුමා දන්නවාද?

එම නීති විරෝධී පියවර ගැනීමට කටයුතු කළේ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ ජී. එච්. ගුණතිලක, ඇස්. අමිර්තලිංගම් සහ ඇන්. ෂන්මුගරාජා යන නිළධාරීන්ය. මෙවැනි පියවරක් ගනු ලැබුවේ ඇමතිතුමාගේ නියෝගයක් පිටද? එසේ නැත්නම් මේ ගැන අපක්ෂපාත පරීක්ෂණයක් පැවැත්වීමට ඇමතිතුමා නියම කරනවාද?

ගුවන් විදුලි සහ ප්‍රවෘත්ති කටයුතු භාර ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන්, පිළිතුරු බලාපොරොත්තුවෙන් කල් දී ඇති ප්‍රශ්නයකුයි මා ඊළඟට ඉදිරිපත් කරන්නේ. 1968 රජයේ සේවකයන්ගේ වැඩවර්ජනය සමයේදී එම වැඩ වර්ජනය මොහොතක් මොහොතක් පාසාම කඩා කප්පල් කිරීම සඳහා පාවිච්චි කරන ලද එසේම එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන ප්‍රචාරක අංශය වන, එම පක්ෂයේ නාය කත්වයෙන් තිබෙන ආණ්ඩුවේ ලංකා ගුවන් විදුලි සංස්ථාව, ට්‍රොස්කි දිනය අනුස්මරණය කිරීම සඳහා මෙරට ට්‍රොස්කිවාදීන්ගේ කථා සහ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමට යෙදෙව්වේ කෙසේද?

අව්‍යාජ විප්ලවවාදියකුගේ ඕනෑම සාංවත්සරයක් සැමරීම පිණිස ගුවන් විදුලි සංස්ථාව පාවිච්චි කිරීමට ඉඩ දෙනවාද?

ගරු ඊ. එල්. සේනානායක (සෞඛ්‍ය ඇමති)
(கௌரவ ஈ. எல். சேனநாயக்க—சுகாதார அமைச்சர்)
(The Hon. E. L. Senanayake—Minister of Health)

ගරු කථානායකතුමනි, කම්කරු ඇමතිතුමාගේ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාත්, ගම්පහ ගරු මන්ත්‍රීතුමාත් (එස්. ඩී. බණ්ඩාරනායක මයා.) කල් දී තිබුණු ප්‍රශ්නය ගැන මා ප්‍රකාශයක් කරන්නට අදහස් කරනවා. සී. අයි. ඒ. එක ගැන කල් දී තිබුනෙ නැති නිසා ඒ ගැන උත්තරයක් දෙන්නට බැහැ. ප්‍රශ්නයේ අනික් කොටසට පිළිතුරු වශයෙන් මගේ ප්‍රකාශය මා ඉංග්‍රීසියෙන් ඉදිරිපත් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Ven. Kotagama Wachissara Thero, aged 50 years, was admitted to the General Hospital, Colombo, on the 14th August 1969. He had an inguinal hernia on the right side which had recurred after repairing in 1956. He was admitted under the care of Dr. D. L. Jayasuriya, F.R.C.S. Full investigations including Electro Cardiographs, X'Rays, urine for the presence of sugar, etc. had been carried out. On the 16th of August, Dr. Jayasuriya requested Prof. K. Rajasooriya, M.D., F.R.C.S., Professor of Medicine, to see this patient. His endorsement on the bedhead ticket is as follows :

"Please see this patient and advise regarding fitness for operation."

Sgd. D. L. Jayasuriya.

Professor Rajasooriya saw the patient the same day and his endorsement is as follows :—

"Blood-pressure 130/70—Heart N. A. D., Tele-radiogram Normal ; E. C. G. Normal. This patient is fit for operative treatment."

Sgd. K. Rajasooriya.

Dr. D. L. Jayasuriya applied for and availed of leave to go to Bandarawela for a holiday. Prior to leaving, he mentioned to the monk that if he wanted the operation done on the 19th, he (Dr. Jayasuriya) will not be present and requested him (Ven. Wachissara) to leave hospital and return when he resumed duties. Dr. Jayasuriya was also aware that priests were observing 'Vas' and he had told the priest that he could also complete his 'Vas' if he so desired and return to hospital for surgery.

The Medical Superintendent, Dr. S. Y. D. C. Wickramasinghe, M.S. F.R.C.S., visited this priest on the 18th at 7.00 p.m. and explained to him the circumstances under which he was to undergo the operation. The venerable monk had told Dr. Jayasuriya and Dr. Wickramasinghe that he had no objection to the operation being performed by the officer acting for Dr. D. L. Jayasuriya. The same day the venerable monk had signed his consent for operative treatment on the bedhead ticket.

The patient was taken up for surgery by Dr. B. P. P. Jayasuriya, F.R.C.S., Resident Surgeon, General Hospital, Colombo at 9.00 a.m. The Anaesthetist was Dr. (Mrs.) Yogesvari Kannangara. She had examined the patient in the morning of the operation and decided to give a spinal anaesthetic. However, as the patient was fat and flabby this procedure could not be accomplished and Dr. (Mrs.) Kannangara decided on general anaesthesia. Towards the very end of the operation, Ven. Wachissara's heart stopped beating. This was detected at 9.45 a.m. External cardiac massage was done, and when this was not successful, internal cardiac massage was done. The rhythm of the heart beat was restored by applying the defibrillator and the heart was restored to normal activity.

The priest was thereafter transferred to the Surgical Intensive Care Unit and he was given the best available attention under the personal supervision of the Medical Superintendent. The consultants called in were :

Dr. Rajasooriya, M. D. K., F. R. C. P.
Dr. M. D. Walloppillai, M. D., M. R. C. P.
Dr. K. A. T. W. P. Jayawardena, D. A., F. F. A. R. C. S.
Dr. J. R. Richards, D. A., F. F. A. R. C.S.
Dr. D. F. Weinman, F. R. C. S.
Dr. I. K. Ferdinands, B. S. C., M. R. C. P.
Dr. O. E. Peiris, M. D., F. R. C. S.

The patient succumbed to complications in the brain and in the kidneys as a result of deprivation of blood during the period of the arrest of the heart's activity at 10.45 a.m. on 21st August, 49 hours after the operation.

Cardiac arrest during surgery is not uncommon. It occurs once in 2,500 to 3,000 cases in the General Hospital, Colombo. There is no way of foreseeing or preventing such a mishap.

An exhaustive inquiry was held by the Coroner and a departmental inquiry revealed that (1) the anaesthetist, Dr. (Mrs.) Kannangara, is a competent anaesthetist with over

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම

[ගරු ඊ. එල්. සේනානායක]

two years' experience of working on her own. She has passed the Primary Fellowship Examination in Anaesthesia and is undergoing a training for Fellowship ; (2) she had administered this anaesthetic in a competent and skilful manner ; (3) the doses of drug administered are normal and rational according to established practice ; (4) when the heart stopped beating, Dr. J. R. Richards, Senior Anaesthetist, was close at hand ; (5) death was due to anaesthetic misadventure.

It must be repeated that Ven. Wachissara had this operation done of his own free will while the Consultant Surgeon was away.

ගරු මොන්ටේගු ජයවික්‍රම

(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)

(The Hon. Montague Jayewickreme)

ගරු කථානායකතුමනි, ගම්පහ ගරු මන්ත්‍රීතුමා (එස්. ඩී. බණ්ඩාරනායක මයා) විසින් අසන ලද ප්‍රශ්නයට ගරු අගමැතිතුමා සැහෙන පිළිතුරක් දුන්නා. ආණ්ඩුවේ බලතල අනුව, යම් යම් නීති රීති අනුව ක්‍රියා කරන්නට තිබෙනවා නම් එසේ කරන්නට සිදු වන බව ගරු අගමැතිතුමා ප්‍රකාශ කළා.

කල් තැබීම

එස්. ඩී. බණ්ඩාරනායක මයා.

(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)

(Mr. S. D. Bandaranayake)

එය කළේ තමුන්නාන්සේගේ අවසරය ඇතිවද ?

ගරු මොන්ටේගු ජයවික්‍රම

(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)

(The Hon. Montague Jayewickreme)

සම්පූර්ණ අවසරය ඇතිවයි ; නීති රීති අනුවයි. එසේම මතුවටත් යම් කටයුත්තක් කරන්නට තිබෙනවා නම් ඒ ආකාරයටම කරන්නට අප බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

விடை விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 8.14 ට, 1969 අගෝස්තු 23 වන දින සභාසම්මතිය අනුව, 1969 අගෝස්තු 30 වන සෙනසුරාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේය.

அதன்படி பி. ப. 8.14 க்கு சபை அதனது 1969 ஒகஸ்ட் 23 ஆம் தேதிய தீர்மானத்துக்கிணங்க, 1969 ஒகஸ்ட் 30, சனிக்கிழமை மு. ப. 10 மணிவரை ஒத்தி வைக்கப்பெற்றது.

Adjourned accordingly at 8.14 P.M. until 10 A.M. on Saturday, 30th August 1969, pursuant to the Resolution of the House of 23rd August 1969.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දයක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 35 .00යි.) මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදෙර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியையடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம்: தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, காலிமுகக் கருமாலயம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org